

# යදමින් බැඳි විප්ලවය

කේ.එම්.එම්.ආර්. විජයසිරි

# යදමින් බැදි විප්ලවය

කේ.එම්.එම්.ආර්. විජයසිරි

# පිදුම

# පිරිසිදු

# පරිසරයක් සඳහා

# කැපවෙන

# ඔබට

කේ. එම්. එම්.ආර් විජයසිරි

50 සමාලී

මාපුටුගල පෝරුවදණ්ඩ

0723411388

0761380599

# හැඳින්වීම

මිනිසා විසින් පරිසරයට සිදුකරන විනාශය, සීමාවකින් තොරව ණය ගැනීම (සීමාවකින් තොරව මුදල් ගලා ඒම) නිසා රටේ නිශ්පාදන කෂේත්‍රයේ සිදුවන කඩාවැටීම සහ ධනවාදී ප්‍රවාහය සමග එකතුවෙන විප්ලව වාදියකුගේ ඉරණම මේ පොතින් නිරූපනය වෙනවා.

අද වෙනකොට දිරණ නොදිරණ කසල, ලෝකයේ හැමදෙනාටම ප්‍රශ්නයක් වෙලා. සංවර්ධනය වෙච්ච රටවල් මුදල් දීල හරි තමන්ගෙ කුණු වෙනත් රටකට යවන්න හදන්නේ ඒ නිසයි.

රට තුළට සීමාවකින් තොරව මුදල් ගලා ඒම නිසා නිෂ්පාදන අංශය කඩාවැටෙන ආකාරයටම සීමාවකින් තොරව ණය ගැනීම නිසා කිසිම දෙයක් නිෂ්පාදනය කරලා ලාභයක් ගන්න බැරි තැකට අපේ රට දැනටමත් පත්වෙලා ඉවරයි. රට කරවන අයත් නිශ්පාදන වියදම වැඩිවෙලා අපේ රටේ නිෂ්පාදන වලට පිටරටින් එන දේවල් එක්ක තරඟ කරන්න බැරිවෙනකොට පැලැස්තර විසඳුමක් හැටියට ආනයන බදු පනවනවා මිසක නිෂ්පාදන වියදම වැඩිවෙන එකට විසඳුම් ලබාදෙන්නෙ නෑ.

කතානායකයාට අත්වෙන්නේ අපේ රටේ ධනවාදී ප්‍රවාහයත් එක්ක එකතුවෙච්ච විප්ලවවාදීන්ට වෙනස් ඉරණමක්. ධනවාදී ප්‍රවාහයට එකතුවුණු විප්ලවවාදීන් තමන්ගෙ ප්‍රතිපත්ති වෙනස්කරගෙන සුරසැප විඳින්න පුළුවන්

වුණත් හඳවතට එකඟව වැඩකරන සොබාසිරිට ඒ විදියට වෙනස්වෙන්න බැරිවුණ නිසා හැම දෙයම අතහැරල වනගතවෙන්න සිදුවුණා.

වනාන්තරය මැදින් වැටුණු අඩිපාර මකල දාන්න වනාන්තරය ගන්න උත්සාහය සම්පූර්ණයෙන් සාර්ථක වෙලා නෑ. ඉර තම මෙහෙය නිමා කරල කඳු අතරේ හැංගෙන්න හදන්නෙ රාත්‍රියට ඉඩදෙන්න. තරුණයා පහුකරපු දෙන්නෙක් වනාන්තරයට මකල දාන්න බැරිවුණු අඩිපාර දිගේ ගමන් කරනවා. අව්වට පිච්චිලා කළු ගැහුණු ඒ අයගෙන් දකින්න ලැබෙන්නේ වයසට වැඩිය වයස්ගත පෙනුමක්.

"ස(ර්) අපි මොකද කරන්නේ. මේ ඇතිවෙලා තියෙන්නේ බලා ඉන්න පුළුවන් තත්වයක් නොවෙයි. අපි මේ වනාන්තරයට වෙලා හැංගිලා ඉදලා හරියන්නෙ නෑ."

"මේ වෙලාවෙ හැංගිලා ඉඳල හරියන්නෙ නැති බව ඇත්ත. ඒත් දැන් අපිට එක පාරටම තීරණයක් ගන්න බෑ."

වයසින් වැඩිකෙනා කිව්වෙ ටිකක් කල්පනා කරලයි.

වනාන්තරය පහුකරපු ඒ දෙන්නගෙ ගමනාන්තය වුණේ අතැරල දාපු ගම්මානයක්. වහල කඩාවැටිල කටුමැටි බිත්ති හේදිලා ගිය ගෙවල්වල ඉතුරුවෙලා තියෙන්නෙ තව අවුරුදු සීයකටවත් දිරල යන්නෙ නැති මිල්ල කණු විතරයි. තමන්ගෙන් උදුර ගත්ත බිම ආයෙමත් අයිතිකර ගන්නා සටන වනාන්තරය පටන් අරගෙන. වනාන්තරයේ ආක්‍රමණයට අහුවෙච්ච ගමේ තවමත් ජීවය තියෙන බව කියන්නෙ ගරාවැටිච්ච ගෙවල් අතරින් එන යකඩ තලන හඬක්.

"කම්මලේ අයියා යකඩ තලනවා. ආයුධ වලින් කරන්න දෙයක් නැති වුණාට එයාට ආයුධ හදන්නෙ නැතිව ඉන්න බෑ. දැන් එතෙන්ට යන්න වෙලාවක් නෑ, ගෙදර යමු."

දෙන්නා අතරින් වැඩිමහලු එක්කෙනා කිවුවා. ගරාවැටුණු ගෙවල් කිහිපයක් පසුකරපු දෙන්නා පළාතම වහගෙන පැතිරිච්ච අඹ ගහක් ළඟ තියෙන ගෙයක් ළඟට ආවා.

අද වනාන්තරය මැද සැඟවුණු ජීවිත ගත කරන්නෙ මීට අවුරුදු පහකට හයකට ඉස්සර මුළු රටම දන්න දෙන්නෙක්. ඒ දවස්වල සොබාසිරි, සාගර කියන නම් දෙක මුළු රටම දන්නවා.

"ස(ර්) මම නම් නාගන්න යනවා. මාව තෙමිච්ච බල්ලෙක් වගේ ගඳගහනවා."

සාගර එහෙම කියන ගමන් මිදුලෙ කෙළවර තියෙන අඩිපාර දිහාවට ගමන්කලා.

"මගෙත් ඊට වැඩි වෙනසක් නෑ. ස්ථිර තීරණයක් නැතිව කිසිම දෙයක් කරන්න හිතෙන්නෙ නෑ. සාගර නාල ඉවරවෙලා මේ පැත්තෙ එන්න. තීරණයකට එන්න ඉස්සර ගොඩක් කල්පනා කරන්න ඕනෑ."

සොබාසිරි අඹ ගහ යට තියෙන ගල් තලාව උඩට නගින ගමන් කිව්වා. එතෙන්ට මුළු පළාතම පේනවා.

පරිසරය වසාගෙන පැතිරීයන අඳුර මකාදමන්න පැල්පත තුළ දැල්වෙන පොල්තෙල් පහනට පුළුවන්කමක් නෑ. තරු මල් ඇතිරුනු අහස් වියනනෙන් සෙවන ලබන මිදුලේ අඹ ගස යට ඉන්න සොබාසිරිගේ සිතුවිලි අතීතය කරා ගමන් කළේ නිරායාසයෙන්මයි. අඳුර පළවා හරින්න අසාර්ථක උත්සහයක යෙදෙන පහන වගේ එයත් මුලු පෘථිවියේම අනාගතය එළිය කරන්න ගත් උත්සාහය නිශ්ඵල එකක් බව දැන් සොබාසිරිට හිතෙනවා. මෙයට වසර ගණනකට පෙර පහළ නිම්නය ඒකාලෝක කළ විදුලි බුබුළු අද නිවිල ගිහින්. කැලේට වෙලා හැංගිලා හිටිය සොබාසිරි රටට වෙලා තියෙන විනාශය හරියටම දැක්කෙ අදයි. එයාට මෙහෙම කැලේට වෙලා හැංගිලා ඉන්න සිද්ධ වුණෙත් රටට අද අත්වෙලා තියෙන විනාශය වලක්වන්න පාරට බැහැපු හින්දයි.

එක සැරයක් රට වෙනුවෙන් ජීවිතය කැපකරල පරාද වුණා. ඒක මට දැනුණේ නැත්තෙ ඒ වෙනකොට මට නැතිවෙන්න දෙයක් තිබුණේ නැති නිසයි. ඒත් අද තත්වය ඊට ගොඩක් වෙනස්. මම තීරණයක් ගන්න ඉස්සර දෙපැත්තක් ගැන හිතන්න වෙනවා. ඒත් මේක අපේ රටේ අනාගතය තීරණය කරන දෙයක්....................

අඳුර තුළින් ඇදී ආ හඬක් කල්පනා සාගරයේ ගිලී සිටි සොබාසිරිගේ කල්පනා ලෝකය බිඳ දැමුවා

"ස(ර්) කළුවරේ මොකද කරන්නේ. අන්න අක්කා ස(ර්)ව හොයනවා."

“සාගරට නෑකම කියවෙන්නෙම නෑ. අක්කයි ස(ර්)රුයි, හරියට කැවුමුයි කේකුයි වගෙයි.”

“ස(ර්) මගේ ගුරුවරයෙක්. මම කවුරු වුණත් ස(ර්) කවුරු වුණත් මම ස(ර්)ව සලකන්නේ මගේ ගුරුවරයෙක් හැටියටයි.”

“අක්කා අඬගහන්නෙ කෑම කන්න. මට තවම බඩගිනි නෑ. එයාට කාල නිදාගන්න කියන්න. මට ටිකක් නිදහසේ කල්පනා කරන්න ඕනැ.”

සොබාසිරිගෙ හිත ආයෙත් අතීතය කරා ගමන් කළා.

***********************************

සොබාසිරි රජරට වැව් ගම්මානයක ඉපදුනේ දුප්පත්කම උපතින්ම උරුමකරගෙන. ගමේ ඉස්කෝලෙන් සාමාන්‍ය පෙළ විභාගය ඉහලින් සමත් වුණත් ටවුමෙ ඉස්කෝලෙට ගිහින් උසස් පෙළ කරන්න තරම් ඒගොල්ලන්ට වත්කමක් තිබුණෙ නෑ.. තාත්ත හිතුවෙ ඉඩමක් විකුණල හරි සොබාසිරිව ටවුමෙ ඉස්කොලෙකට යවන්න. ඒත් සොබාසිරි ඒකට කැමතිවුණේ නෑ.

අභියෝග හමුවේ නොසැලෙන සොබාසිරි අධ්‍යාපනයට ඕන කරන මුදල් හොයන්න හිතාගෙන ටියුෂන් පන්ති පටන් ගත්තා. මුලදි ගෙවල් වලට ගිහින් උගන්වපු සොබාසිරිගෙ හැකියාව වාර විභාග වලදි එළියට ආවා. වැඩිකලක් යන්න ඉස්සර ප්‍රවීන ආචාර්යය වරුන්ට අභියෝගයක් වෙමින් ක්ෂේත්‍රෙය් ඉහළ තැනකට පැමිණෙන්න එයාට හැකිවුණේ උපතින් උරුමවුණු ගැඹුරු කටහඬ නිසයි. දෙමව්පියන්ට බරක් නොවී ඉගෙනීමෙ කටයුතු කරගෙන යන්න ටියුෂන් පංති වලින් ලැබෙන ආදායම ප්‍රමාණවත් වුණා. දුෂ්කරතා මැද්දෙ ඉගෙනීම කරගෙනගිය සොබාසිරි උසස් පෙළ කඩ ඉම ජයගත්තෙ එයාවත් නොසිතපු තරම් ඉහළින්.

රටේ පිරිසක් සැප විදිද්දී බහුතරය දුගීබවින් පෙලෙන්නේ පවතින පාලන ක්‍රමයේ වරදින් බව විශ්වාස කරපු සොබාසිරි විශ්වවිද්‍යාලයට ඇවිත් වැඩි දවසක් යන්න ඉස්සර  රට අලුත් මාවතකට ගෙන ඒමට පෙරුම් පුරන දේශපාලන පක්ෂයක් සමඟ එකතුවුණා. එයා බාහිර ක්‍රියාකාරකම් වලට කාලය ගතකළත් අධ්‍යයන කටයුතු අතපසු කළේ නෑ. සොබාසිරිට අවසන් වසරෙ ලබාගත් ප්‍රතිඵල මත තමා උගත්  විශ්ව විද්‍යාලයේ ම සහය කතිකාචාර්යවරයකු වීමට අවස්ථාව ලැබුණා.

ඉස්කෝලෙ යන කාලෙ ඉඳලා පරිසරයට ආදරය කරපු සොබාසිරි  උසස් අධ්‍යාපනය ලැබුවෙත් ඊට අදාල ක්ෂේත්‍රයකින්. ඒ නිසාම පක්ෂයේ රැස්වීම්වලදි

පරිසරය ආරක්ෂා කරගෙන රට දියුණු කරන ආකාරය පැහැදිලි කරන එක ඔහුට බාරවුණා. දක්ෂ කථිකයෙක් වුණ සොබාසිරි ඒ වෙනකොට ප්‍රසිද්ධ දේශපාලන චරිතයක්.

කැම්පස් එකේ රස්සාව ලැබුණට පස්සෙ තවදුරටත් හොස්ටල් එකේ ගජේ ගහන්න බැරිවුණා. හොස්ටල් ජීවිතයට ආයුබොවන් කියපු සොබාසිරි පොඩි ගෙයක් කුලියට අරගෙන ඒකෙ පදිංචියට ගියා. එයාට වැඩි දවසක් ඒ ගෙදෙට්ට වෙලා තනියම ඉන්න වුණේ නෑ.

සාගර සොබාසිරිව හොයාගෙන ආවෙ විශ්වවිද්‍යාලයට ආපු දවසෙමයි. නවාතැනක් සොයාගන්න උදව් ඉල්ලාගෙන ආපු සාගර සොබාසිරිගේ ළඟම හිතවතා සහ සගයා බවට පත්වුණා. කැන්ටිමෙ දිය හොද්දවත්, හෝටලේ තෙල් දාපු රයිස් එකවත් සාගරට දිරෙවුවෙ නෑ. බෝඩිමට ගෙවන්න ගෙදරින් දුන්න සල්ලි වලින් හට්ටි මුට්ටි, ගෑස් ලිප්, උයන්න ඕන කරන අඩුම කුඩුම අරගෙන ආව සාගර චමරියක් පටන්ගත්තා.

"උයන්න පටන් ගත්ත වගේ නෙමෙයි උඹට වෙන වැඩක් කරන්න වෙලාවක් නැතුව යනවා."

සොබාසිරි එහෙමෙ කිව්වෙ එයාගෙ අම්මට උයන්න පැය ගාණන් යන නිසයි.

"මේක වෙනම ම කෝස් එකක්. උදේ නැගිට්ට ගමන් බත ගැහුවම බත ඉදෙනකොට මොනවහරි දෙකක් රත්කරගන්න පුළුවන්. වැඩිම වුණොත් පැයක් යයි."

උයන්න තියා පොල් ගාන්නවත් දන්නෙ නැතුව හිටිය සොබාසිරි සාගරගෙන් උයනහැටි ඉගෙනගත්තා.

දුර නෑකමක් තිබුණත් සොබාසිරි සාගරව සැලකුවෙ මිතුරෙන් විදියට. ඒත් සාගර සොබාසිරිව තමන්ගෙ ගුරුවරයෙක් විදිය සැලකුවා. එකම නවාතැනේ ඉන්න සාගර සොබාසිරිගේ දේශපාලන දර්ශනය අදහන්නෙකු බවට පත්වෙන්න වැඩිකාලයක් ගියේ නෑ.

සැම දෙනා සමඟම සහයෝගයෙන් කටයුතු කරන සොබාසිරි පරිසර සංගමයේ සභාපති ධූරයට පත්වුණේ නිතරඟයෙන්. රාජකාරි කටයුතු මෙන්ම බාහිර ක්‍රියාකාරකම්ද කැපවීමෙන් ඉටුකරන සොබාසිරි පරිසර සංගමයේ වාර්ෂික චාරිකාව සාර්ථක කරගන්න වෙහෙසුනා. එයා බලාපොරොත්තු වුණේ සාමාජිකයන්ට අලුත් අත්දැකීමක් ලබාදෙන්නයි. වාර්ෂික චාරිකාවට සුදුසු

ස්ථානයක් සොයමින් පරිගණක තිරයෙන් ලංකාව පුරා සැරිසරන සොබාසිරිට මිනිස් වාසයෙන් ඈත, කැලෑවක් මැද පිහිටි ගමක් හමුවුණේ අහම්බෙන් වගේ.

මහා කැලය මැද ගමක්! යන්න පාරක්වත් නැතුව මෙතන ගමක් තියෙන්න පුළුවන්ද? මේකෙ හැටියට ගම තියෙන්නෙ කන්දක් උඩ. ගමට උඩහින් තියෙන්න කැලෑවක්....

"සාගර මේ බලනවා! මහ කැලේ මැද්දෙ ගමක්! අපේ පරිසර චාරිකාව මෙතනට යොදාගත්තොත් නරකද? ."

"සර්ටත් පිස්සු, මම දන්න පරිසර චාරිකා. එතෙන්ට යන්න ඉස්සර ටිකක් හොයල බලන්න වෙනවා. මේ ගමේ ඉන්නෙ ඇමේසන් වනන්තරයෙ වාගේ ඇඳුම්වත් අඳින්නෙ නැති අයද දන්නෙ නෑ. අපේ බැච් එකේ කුප්පියගේ ගෙවල් තියෙන්නෙ මේ හරියෙ. ඒකගෙන් විස්තර දැනගන්න පුළුවන්."

සාගර කිව්වෙ කම්පියුටර් එකේ පේන සිතියම දිහා බලාගෙන. සාගර එදා හවස ම තමන් කිවුව යාළුවව සොබාසිරිට හඳුන්වල දුන්නා. කුප්පිය කියල කිව්වට එයාගෙ නියම නම කනිෂ්ක.

"මුන් ගෙවල් ගෙම්බො වගේ හැදිච්ච එවුන් ස(ර්). මුන්ට පොතින් එහා ලෝකයක් නෑ. තමන්ගෙ ගමට කිලෝ මීටර් පහක් දුරින් තියෙන ගමක් ගැන මුන් දන්නෙ නෑ."

සාගර කතාව පටන් ගත්තෙ යාළුවට බැනගෙනමයි.

"ස(ර්) ඔය කියන හරියෙ තමයි අපේ ගෙවල් තියෙන්නෙ. ඒත් එහෙම ගමක් ගැන අපි දන්නෙ නෑ. මම තාත්තටත් කෝල් එකක් දාල බැලුව. එහෙම ගමක් ගැන කවුරුවත් දන්නෙ නෑ. ගූගල් මැප් එකෙන් බැලුවම එතන තේ වවල තියෙනවා වගේ පේනවා. තේ පැක්ටරියට ගියොත් ඔය ගමට යන විදිය දැනගන්න පුළුවන්."

සාගරගේ මිතුරා අලුත් අදහසක් ඉදිරිපත් කළා.

"ඒක හොඳ අදහසක්. ලබන සෙනසුරාද ඔයාට එන්න පුළුවන්ද? අපි ගිහින් බලමු. අපිට හවස් වෙන්න ඉස්සර ආපහු එන්න පුළුවන් වෙයි."

"අපි සතියක් දෙකක් නවතින්න බලාගෙනම යමු. නවතින්න තැන් කෑම බීම වලට වියදමක් යන්නෙ නැති නිසා සති දෙක තුනක් නතරවෙලා හරි ඔය ගම හොයාගෙනම ආපහු එන්න පුළුවන්."

සාගර එහෙම කිව්වෙ කුප්පියව බය කරන්නත් එක්ක. ළඟම සෙනසුරාද දවස ගමන සඳහා යොදාගත්තෙ පරිසර චාරිකාවට වැඩි දවසක් නැති හින්දයි. පාන්දරින්ම පිටත්වෙන්න හිතාගෙන හිටියත් කනිෂ්ක එනකොට උදේ හය විතර වුණා.

“සර් හයිවේ එකෙන් දැම්මොත් ඉක්මනට යන්න පුළුවන්.”

එයා වාහනයට ගොඩවෙන ගමන් කිවුවා.

“මේක හයිවේ දැම්මොත් අපිට ගමන යන්න වෙන්නෙ නෑ.”

සොබාසිරි එහෙම කියනකොට සාගර හිනාවුණා. උදෙන් ම පිටත් වුණත් පැක්ට්‍රිය ළඟට එනකොට උදේ නවයත් පහුවෙලා. හතරැස්ව කපපු කළුගල් වලින් හදපු කුළුණු අතර ලෑලි වලින් බිත්ති ආවරණය කරල හදල තිබුණු පැක්ට්‍රිය අධිරාජ්‍යවාදී යුගය සිහිපත් කරවන ස්මාරකයක් වගේ තේ වත්ත මැද සුදුපාටට පෙනුනා.

“මූ කියන්නෙ නම් ගෙවල් තියෙන්නෙ බස්නාහිර පළාතෙ කියලයි. බලාගෙන යනකොට මේකා ඉන්නෙ බස්නාහිර පළාතෙ අන්තිම ඩොටේ.”

සාගර යාළුවව කේන්ති ගස්සන්න හැදුවා. සාගර මොනව කිවුවත් කනිෂ්කට කටවහගෙන ඉන්න වුණේ සොබාසිරිත් සාගරගෙ ගෙවල් පැත්තෙම නිසයි.

“උඹලගෙ රණ්ඩුව නවත්තලා ආව කාරණය ගැන බලමු. තාම මේකෙ වැඩ පටන්ගෙනවත් නෑ.”

තාමත් වහල තියෙන ගේට්ටුව ළඟ කාර් එක නතර කරපු සොබාසිරි කිවුවා.

“මේවයේ වැඩ පටන්ගන්නෙ තේ දළු ගේන වෙලාවට. වැඩ පටන්ගත්තෙ නැතිවට මුරකාරය හරි ඇති.”

එහෙම කියපු කනිෂ්ක ගේට්ටුව බාගෙට ඇරගෙන මුරකාරයව හොයාගෙන ගියා.

“මහත්තයල ආවෙ කාව හරි හම්බවෙන්නද. එහෙම් තව පැයක් විතර ඉන්න වෙනවා.”

පාර අයිනට බුලත් කෙළ පාරක් ගහල කට නිදහස් කරගත්ත මුරකාරය කිවුවා

“අපි ආවෙ මේ හරියෙ තියෙන ගමක් ගැන දැනගන්න. ඒක තියෙන්නේ කැලේ මැද්දෙ.”

සොබාසිරි ආපු කාරණාව කිව්වා.

“කැලේ මැද්දෙ තියෙන ගමක ඉඳලා සතියට දවස් තුන හතරක් තේ දළු අරගෙන එනවා. ඒත් ඒ ගමට යන්නෙ කොහෙමද කියල දන්නෙ නෑ. දළු අරගෙන එන්නෙ නම් අර ජේන අඩිපාර දිගේ.”

මුරකාරයා තේ වත්ත මැද්දෙන් කන්ද උඩහට වැටිල තියෙන අඩිපාරත් පෙන්නුවා.

තුන්දෙනා ම මුරකාරයා පෙන්නපු අඩිපාර දිගේ ගමන් කළේ ගම්මානය තියෙන්නෙ වැඩි දුරක නෙමෙයි කියල හිතාගෙන. තේ වත්ත පහුකරපු ඒගොල්ලො කැලෑවට ඇතුළුවුණා. වනාන්තරයට ඇතුළුවුණ සොබාසිරිගේ හිතට අමුතු ප්‍රබෝධයක් ඇතිවුණා. එයා වනාන්තරයේ තියෙන ගස්වල විද්‍යාත්මක නම් කියල දෙන්න පටන් ගත්තා. ගහක් කොළක් ගැන ඉගෙනගෙන නැති සාගරටත් කනිෂ්කටත් ඒ විස්තර කිරීම වදයක් වුණා. සොබාසිරිගෙ විස්තර කිරිල්ල අහගෙන ඉන්න බැරි තැන කැන්ද ගහක් දිහාට අත දික්කරපු සාගර,

“ස(ර්) මේ ගහට කියන්නෙ හැලපේනියාස් ඔතානියාස් කියලයි.”

කිවුවා. තමන් වනාන්තරය ගැන කරන විස්තර කිරීම කොන්ක්‍රීට් වනාන්තර හදනහැටි ඉගෙන ගන්න, ගමන් සගයන්ට දිරවන්නෙ නෑ කියල තේරිච්ච සොබාසිරි එයාගෙ විස්තර කිරිල්ල නවත්තල දැම්මා. වනාන්තරය මැද්දෙන් පැය දෙකක් ගියත් ගමනේ කෙලවරක් දකින්න ඒගොල්ලන්ට බැරිවුණා.

“යනවා යනවා ඉවරයක් නෑ. අපිට පාර වැරදිලාද කොහෙද? මෙච්චර දුරක් දළු ගෝනි උස්සගෙන එන්න පුළුවන්ද? මෙහාට සිග්නල් තිබුණ නම් තව ගොඩක් දුර යන්න තියෙවද කියල දැනගන්න තිබුණා. අපි දවල්ට කන්න දෙයක් ගෙනාවෙත් නෑ. ඔය ගමේ කන්න දෙයක් අරගන්න කඩයක්වත් නැතුව ඇති. අපි ආපහු ගිහින් හෙට උදේම එමු. නවතින්න කන්න බොන්න නොමිලේම ලැබෙන නිසා බයවෙන්න දෙයක් නෑ.”

සාගර කිව්වෙ මහන්සිය වැඩිකමට. ආපහු හැරිල යන එක හොඳයි කියල තුන්දෙනාටම හිතෙන්න තව පැය කාලක් විතර ගියා. තෙරතෝන්චියක් නැතිව ඇහෙන රෑහැයියන්ගෙ ලතෝනිය අතරින් හඬ දුක්බර තාලයකට වැයෙන බටනලා නාදයක් කන්ද උඩහින් ඇහුනෙ ඒ වෙලාවෙයි.

“මෝහිනී කන්ද උඩහ ඉඳන් බටනලා පිඹිනවා. ඔය නලා පිඹින්නෙ අපිව එතනට ගෙන්න ගන්න. අපි ආපහු යමු.”

කනිශ්ක ඇත්තටම බයවෙලා.

“මොහිනී බටනලා පිඹින කතාවක් නෑ. බටනලා පිඹිනකොට මෝහිනී එනව කියල කතාවක් තියෙනවා. මොහිනී ආවොත් මම බලාගන්නම්.”

එහෙම කියපු සොබාසිරි ඉස්සර වුණා. කන්ද දිහාවට ගිය අඩිපාර විශාල ගල් පර්වතයක පැල්මක් අතරින් ගමන් කරන්න වුණා. ගල් බිත්ති අතර අඩි හතරක්වත් තිබුණෙ නෑ.

කවදාවත් මේ ගමට වාහනයක් යන්න පුළුවන් පාරක් හදන්න බෑ. මේක ස්වභාවික බලකොටුවක් වගේ තැනක්.”

සාගර දුර්ග මාර්ගය පහුකරන ගමන් කිවුවා. වැඩි වෙලාවක් යන්න ඉස්සර දවස් ගානක් තිස්සෙ හීන මවපු ගම්මානය දැකගන්න ඒ ගොල්ලන්ට පුළුවන් වුණා. පර්වතය මුදුනෙ අක්කර හතලිහක විතර ප්‍රදේශයක ගම්මානය පැතිරිලා තිබුණා. කන්ද උඩහට වෙන්න ගමෙන් බාගයකට වැඩිය වැහිල තිබුණෙ මහ කැලෑවකින්. ගමේම ගෙවල් දහයකට වැඩිය තිබුණෙනෑ. ඒවා අඩිපාර ඉවරවෙන හරියෙම එක ළඟ හදල තිබුණා. ගෙවල් වලට ඉහලිනු අක්කර දහයක විතර තේ වත්තකුයි, පහලින් අක්කර පහ හයක කුඹුරක් තිබුණත් වගා කරල තිබුණෙ ඒකෙන් බාගයක් විතරයි. පුරන් වෙච්ච කොටසෙ හරක් රංචුවක් තණකොළ කකා හිටියා. ගම්මානෙට ආපු සාගර බඩට මොනවහරි දාගන්න කඩයක් තියෙන තැනක් හෙවුවත් එයාට කඩයක් හොයාගන්න බැරිවුණා.

අවුරුදු ගාණකින් ගමට ආපු ආගන්තුකයන්ව බඩගින්නෙ ආපහු යවන්න ගමේ අය කැමතිවුණේ නෑ. කරපු සංග්‍රහවලට මුදලින් ස්තුති කරන්න ගිය සොබාසිරිට වුණෙත් සුන්දරහාමිට සල්ලි දෙන්න ගිය විමලරත්ත කුමාරගම මහත්තයට වෙච්ච දේමයි.

********************************

“අපේ පරිසර සංගමයේ වාර්ෂික චාරිකාව යොදාගෙන තියෙන්නේ නවීන තාක්‍ෂණයේ ආක්‍රමණයට හසුනොවුණු ගම්මානයකට.”

සොබාසිරි පරිසර සංගමයෙ සාකච්ඡාව ආරම්භ කරමින් කිව්වා.

“අපි යන්නේ නවීන සමාජයේ ආක්‍රමණයට හසුනොවුණු ආදිවාසී ගම්මානයකටද? .”

බොහෝ දෙනා කල්පනා කළේ මේ චාරිකාවත් වෙනදා යන ආකාරයේ සම්ප්‍රදායික ගමනක් වෙයි කියලයි.

"අද වෙනකොට ආදිවාසීන්ගෙ ගම්මාන හැම එකක්ම නවීන සමාජයේ ආක්‍රමණයට ලක්වෙලා. මේ ගම්මානය තියෙන්නේ බස්නාහිර පළාතෙමයි. මේක සිංහරාජ වනාන්තර මායිමෙ තියෙන ගම්මානයක්. ගම්මානයේ අය බාහිර සමාජයත් එක්ක සම්බන්ධතා පැවැත්වුවාට පැරණි ගම වෙනස් නොකර තියාගෙන ඉන්නවා. ඒකට ප්‍රධාන හේතුව වෙලා තියෙන්නේ ගමට වාහනයක් යන්න පුළුවන් පාරක් නැති එක. ඒ අයට බාහිර ලෝකය දැනගන්න ලැබෙන්නේ රේඩියෝවෙන් විතරයි."

සභාවේ හිටිය හැමදෙනාම පුදුමයට පත්වෙලා සොබාසිරිගේ කතාව අසාගෙන හිටියා.

"ඒක බාහිර සමාජයෙන් වෙන්වෙච්ච ස්වයංපෝෂි ගම්මානයක් ද. ? "

"නෑ ඒක සවයංපෝෂි එකක් නෙවෙයි. ඒගොල්ලන්ගේ ප්‍රධාන ආදායම් මාර්ගය තේ දළු."

"එහාට සෙල් ෆෝන් වැඩකරන්නේ නැතිද."

තවත් ප්‍රශ්නයක් මතුවුණේ සොබාසිරි කියන දේ විශ්වාස නොකරනව වගෙයි.

"එහේ කිසිම නෙට් ව(ර්)ක් එකකට සිග්නල් නෑ. කෝල් ගන්න නම් සැටලයිට් ෆෝන් එකක් අරගෙන යන්න වෙනවා."

"කිසිම පහසුකමක් නැතිව ගමේ මිනිස්සු ඒ ගමට වෙලා ඉන්නේ ඇයි? ෆෝන් එකක් නැතිව ටී වී එකක් බලන්නෙ නැතිව ජීවත්වෙනවා කියන එක පිළිගන්නත් අමාරුයි. ස(ර්) ගම්මානය ගැන විස්තර කරන්නේ අතින් දාලා."

සබාවේ කෙලවරකින් මතුවුණේ අභියෝගයක්.

"ඒ ගම්මානය ගැන බොරු තොරතුරු කියන්න අවශ්‍යතාවයක් නෑ. අනික බොරු කිවුවොත් ඒවාට වැඩි ආයුෂක් නෑ. අපි ලබන සතියේ ඒ ගමට යනවා. එතකොට මම කියපු දේවල්වල ඇත්තද කියලා බලාගන්න පුළුවන්. අපි ෆෝන්වලට ටී වී එකට ඇබ්බැහි වෙලා. අපිට ඒවයින් තොර ලෝකයක් නෑ. ඒ මොකවත් නැතිව ඒ ගමේ මිනිස්සු අපිට වැඩිය සතුටින් ජීවත්වෙන හැටි අපිට බලාගන්න පුළුවන්."

සොබාසිරි එහෙම කිව්වෙ කතාව දිග්ගැහෙන එක නවත්වන්න. කතාව එතනින් නතර කරපු සොබාසිරි චාරිකාව සංවිධානය කරන එක පටන් ගත්තා

---

02

"සාගර මට වෙලාවකට හිතෙනවා අපි මේ කරන කැපකිරීමෙන් වැඩක් තියෙනවද කියලා. මම කැම්පස් එකට ආපු දවස්වල ඉඳලා අලුත් සමාජයක් ගොඩනගන්න හැමදේම කැපකරලා වැඩකරනවා. මම ඉගෙනගෙන ඉවරවෙලා දැන් උගන්වනවා. ඒත් අපි බලාපොරොත්තුවෙන සමාජය බිහිකරන එක හීනයක් විතරයි.

මේ රටේ මිනිස්සුන්ට කොච්චර වටහල දුන්නත් ඇත්ත තත්වය අවබෝධ කරල දෙන්න බෑ. හැම ඡන්දෙකට ඉස්සෙල්ල අප හිතන්නේ මේ පාර නම් මිනිස්සු දේශපාලනඥයන්ගේ බොරුවලට රැවටෙන එකක් නෑ කියලයි. අන්තිමේදි බලනකොට ප්‍රතිඵලය එකමයි. ඡන්ද දායකයො ඡන්දය දෙන්නෙ තියෙන ආණ්ඩුව වෙනස් කරන්න මිසක රට යන ක්‍රමය වෙනස් කරන්න නෙවෙයි. අපි ළඟ රට වැටිල තියෙන තැනින් ගොඩගන්න පුළුවන් සැලසුම් තිබුණත් ඒවයින් වැඩක් ගන්න ලැබෙන්නේ නෑ."

සොබාසිරි එහෙම කිව්වෙ පරිසර චාරිකාව ඉවරවෙලා නවාතැනට ඇවිත් රෑ කෑම කන ගමන්.

"ඒත් මේ පාර නම් අපිට චාන්ස් එකක් තියෙනවා. දැන් අපි ණය අරගෙන තියෙන තරමට ආයිත් කොහෙන්වත් ණය ගන්න බෑ. මේ ඡන්දෙන් කවුරු දිනුවත් මාස තුනක් වත් රට කරගෙන යන්න ලැබෙන් නෑ. ඒ අවස්ථාව ආවම අපිට බලය ලබාගන්න පුළුවන්."

සාගර හිතුවෙ ඒගොල්ලො පතන ලෝකය තව මාස තුන හතරකින් බිහිකරන්න පුළුවන් කියලයි.

"ඔය සිහිනය සාගරට අලුත් එකක්, ඒ වුණාට මම අවුරුදු දහයක් තිස්සේ ඔය සිහිනය දකිනවා. ඒ සිහිනය හැබෑ කරගන්න කැපවෙනවා. මේ රට යහපත් තැනක් කරන්න අපි ළඟ තියෙන සැලසුම් වලින් සියයට දහයක් ක්‍රියාත්මක කරන්න පුළුවන් වුණොත් ඇති. ගෙවාගන්න බැරි තරම් ණය කන්දකට යටවෙලා හිටියත් අපි ළඟ තියෙන සැලසුම් ක්‍රියාත්මක කරන්න පුළුවන් වුණොත් රටට ගැලවීමක් තියෙනවා. මට හිතෙන්නේ ඒකට අපිට බලයක් ලැබෙනකම් ඉන්න එක රටට කරන අපරාධයක්. අපි මේ ප්‍රවාහයකට එකතුවෙලා අපේ අදහස් වලින් ටිකක් හරි ක්‍රියාත්මක කරන්න ඕනැ.

අපේ අදහස් හරි බව මිනිස්සු පිළිගත්තට අපිට බලයක් දෙන්න කැමති නෑ. අපේ අදහස් ක්‍රියාත්මක කරන්න නම් අපි යන ප්‍රවාහයෙන් අයින්වෙලා රටයන ප්‍රවාහයත් එක්ක එකතුවෙන්න වෙනවා.''

''ස(ර්)ට එක පාරටම ඒ වගේ අදහසක් ආවෙ මොකද? ''

''මම මොන දේශපාලන දර්ශනය පිළිගත්තත් අපේ රට දියුණු කරන්න පුළුවන් විදිය ගැන චිත්‍රයක් මගේ හිතේ තිබුණා. අපි ගිය ගම්මානයේ ඒ චිත්‍රය හැබෑවටම දැකගන්න පුළුවන් වුණා. ඔයාට මතකද ඒ ගමේ හැම බිම් අඟලක්ම ප්‍රයෝජනයට අරගෙන තිබුණු හැටි. පර්වතය උඩ තියෙන තුනී පස් තට්ටුව ආරක්ෂා කරන්න කටයුතු කරලා තිබුණු හැටි. ඒව දකිනකොට මගේ හිතේ තියෙන සිහිනය සැබෑ කරන්න පුළුවන් කියල තේරුණා. අපි පොළොවෙ තියෙන පස් තට්ටුව ආරක්ෂා කරන්න උනන්දු වෙනවා මදි. පසේ ජීව ගුණය වතුරෙ දියවෙලා මුහුදට යනවා. තව ටික කාලයක් යනකොට අපිට ඉතුරු වෙන්නේ නිසරු පොළොවක්. අධිරාජ්‍යවාදීන් අපේ රටේ සාරය අරගෙන ගියත් අපිට රටට ආදරය කරනවට වැඩිය අපේ රටට ආදරය කරල තියෙනවා.''

''මෙච්චර කලක් අපේ රටේ සාරය අරගෙන ගියා කියල සුද්දන්ට බැනපු සර් එකපාරටම උන්ගෙ හොඳ කියන්න ගත්තෙ මොකද?''

''සුද්දො අපිට වැඩිය අපේ රටට ආදරය කරල තියෙන බව තේරුනේ කැලේ මැද්දෙ තියෙන ගමට ගිය මුල් දවසෙමයි. ඒව තේරුම් ගන්න තරම් උබලට පරිසරය ගැන හැඟීමක් නෑ. සුද්දො වනාන්තර එළිකරල තේ වගාකලත් පස සොදාගෙන යන එක වලක්වන්න උපරිම උත්සහය අරගෙන තියෙනවා. ඒත් අපි පස සෝදාගෙන යන එක නවත්තන්න මොනවද කරන්නෙ. අපි පහුකරගෙන ගිය තේ වත්තෙ ගල්වැටිවත් කානුවත් අවුරුදු පනහකින් හැටකින් නඩත්තු කරල නෑ. මුළු තේ වත්තම හොදාපාලුවට ලක්වෙලා. පස හොදාගෙන ගිහින් නිසරු වුනාම අපි රසායනික පෝර දානවා. අන්තිමට බලනකොට වියදම වැඩිවෙලා, ලාභයක් නෑ. අපි ගිය ගමේ අය වගා කරන්නෙ රසායනික පොහොර කෘෂි රසායන මොකුත්ම යොදාගන්නෙ නැතුවයි. ඒ කියන්නෙ කාබකික ගොවිතැන. රසායනික පොහෙර, රසායනිත ද්‍රව්‍ය යෙදුවෙ නැතුවට ඒ අය හොඳ අස්වැනක් ගන්නවා. කාබනික ගොවිතැනෙන් නිපදවන දේවල් වලට ලෝකයේ හොඳ ඉල්ලුමක් තියෙනවා. හරිත විප්ලවයෙන් ඉවත්වෙලා කාබනික ගොවිතැනට යොමුවුණොත් සැහෙන්න මුදල් උපයන්න පුළුවන්.''

''සර් කොහොම කිවුවත් මට නම් හිතෙන්නෙ ඒ ගමේ ඉන්නෙ මහ කම්මැලියො ටිකක් ගමෙන් බාගයකට වැඩිය කැලෑවට යටවෙලා. කැලේ

වටින ගස් තිබුණත් පාරක් නැතිව ඒවයේ වටිනාකමක් නෑ. ගම උඩහ තියෙන කැලේ කපල තේ ටිකක් හිටෙවුව නම් හොඳ ආදායමක් ගන්න තිබුණා.''

සාගර එයාගෙ අදහස කිවුවා.

''අපිට වැරදුනු තැන එතනයි. ගහක වටිනාකම ක්‍යුබික් අඩිවලින් මනින්න බෑ. අපි හැමදේකටම ඉස්සර පරිසරය ආරක්‍ෂා කරගන්න ඕනැ. එහෙම නැතුව කරන සංවර්ධනයෙන් වෙන්නේ විනාශයක් විතරයි. ඔයා දන්නවද ඉතියෝපියාවට අද තියෙන තත්වයට මුහුණ පාන්න වුණේ ඇයි කියල.''

''ඉතියෝපියාවට දීර්ඝකාලීන නියඟයක් බලපෑව. ඒක ස්වභාවික විපතක්.''

සොබාසිරි එක්ක වාදකරල දිනන්න බැරි බව සාගර දැනගෙන හිටියා. හතර වටින්ම වටවෙලා කියල තේරුණත් එයා එහෙම කිව්වෙ පරාජය බාරගන්න සූදානම් වෙලා.

''නියඟය ඇතිවීම ස්වභාවික විපතක්, ඒත් ඉතියෝපියාවෙ දැන් ඔයා කියපු විදියට වනාන්නර එළි කරලා වගා බිම් ඇතිකළා. නියඟයන් ඇතිවුණේ ඒ නිසයි. අපි ගිය ගමේ මිනිස්සු ගමට ඉහළින් තියෙන වනාන්නරය එළි කරන්නේ නැත්තෙ කම්මැලිකම නිසා නෙවෙයි. ඒ අය දන්නවා ගමේ පැවැත්ම තියෙන්නේ ඒ වනාන්තරයෙන් ගලාගෙන එන දොළ පාරෙන් කියලා. ඒ දොළ පාර නැති වුණොත් එතන මිනිස්සුන්ට ජීවත්වෙන්න බෑ. මහවැලිය හරස් කරලා කොච්චර ජලාශ හැදුවත් මාස දෙක පායනකොට ඒවයේ වතුර නැතිවෙන්නේ අපි ගිය ගමේ මිනිස්සු දන්න දේ අපි දන්නෙ නැති නිසා. නැති නම් දැනගෙනත් ක්‍රියාත්මක කරන්නේ නැති නිසා. හැමදේටම ඉස්සර පරිසරය ආරක්ෂා කරන්න ඕනැ. දෙවිවරුත් එක්ක රට දියුණු කරන්න හිටියොත් අපේ රට විනාශවෙලා යනවා. දෙවිවරු එක්ක අපේ රට දියුණු කරන්න ලැබෙන්නේ නැති නම් යක්කු එක්ක එකතුවෙලා හරි ඒක කරන්න වෙනවා. ලබාගන්න පුළුවන් සුළු ඉඩෙන් හරි ප්‍රයෝජනයක් අරගත්තේ නැති නම් වැඩිකල් නොගිහින් අපේ රට ගොඩගන්න බැරි තත්වයට පත්වෙනවා. රට විනාශවෙන්න ඉඩදීල තවත් බලා ඉන්න බෑ. ලබන ඡන්දෙදි විපක්‍ෂයත් එක්ක එකතු වෙන්න මම තීරණය කළා.''

ධනවාදී ආර්ථික ක්‍රමයෙන් සමාජය, පරිසරය විනාශ වෙනහැටි කියල දීපු දේශපාලන ගුරුවරයා ධනවාදී කඳවුරක් එක්ක එකතු වෙනව කියනකොට සාගරට අදහගන්න බැරිවුණා. එයා සොබාසිරිව ආපහු හරවන්න උත්සහ ගත්තා.

''ස(ර්)ගෙ අරමුණ හොඳ එකක් වෙන්න පුළුවන්. ඒත් ඉතිහාසය අරගෙන බැලුවොත් ඔය විදියට ධනවාදී ප්‍රවාහයට එකතුවුණු අය ඒ ක්‍රමයටම හැඩගැහුනා. මුදල් වලට ඕනැම කෙනෙක් වෙනස් කරන්න පුළුවන්. එක

අත්සනෙන් රුපියල් මිලියන ගාණනක් ලබෙන කොට ප්‍රතිපත්ති ගැනවත් රට ගැනවත් හිතෙන්නේ නෑ.”

“මගේ හිතේ නම් මුදල් ගැන ආසාවක් නෑ. මම බොහොම සරල මිනිහෙක්. අධිරාජ්‍යවාදීන් අපේ රට යටත් කරගෙන කොපමණ ධනයක් ඒගොල්ලන්ගේ රටවල් වලට අරගෙන ගියාද? අපේ රටේ ඕනෑම බෝගයකට ගැලපෙන දේශගුණ කලාප තියෙනවා. වටිනා ඛනිජ සම්පත් තියෙනවා. මේව හරියට කළමනාකරණය කළොත් අපිට දියුණුවෙන්න පුළුවන්.

අපි ගිය ගම්මානයේ ගල් තලාව උඩ තියෙන තුනී පස් තට්ටුව ආරක්ෂා කරගෙන හැම බිම් අඟලක්ම ප්‍රයෝජනයට අරගෙන තිබුණා. වනන්තරය පවා ඒකට හානියක් නොවෙන විදියට ප්‍රයෝජනයට අරගෙන තියෙනවා. ඇතුළු වෙන්න බැරිවෙන්න ආරක්ෂාව දාල වනාන්තර රැකගන්න වෙලා තියෙන්නෙ අපේ මිනිස්සු බාගෙන කන්න තියෙන වල ඉහගෙන කන නිසා. අපි අනාගතය ගැන හිතනව නම් පස ආරක්ෂා කරගන්න ඕනැ. ගංගාවල්වල බොර පාටින් මුහුදට ඇදිල යන්නෙ අනාගත පරපුර වෙනුවෙන් ආරක්ෂා කරගන්න ඕනැ සම්පතක්. ශාක වැවෙන්න සුදුසු අඟලක පස් තට්ටුවක් හැදෙන්න අවුරුදු පන්සීයක් යනවා. මේ විදියට හෝදාපාළුවට ලක්වුණොත් අපිට ඉතුරු වෙන්නෙ ගහක් කොළක් වවන්න බැරි ගල් බොරළු ගොඩක් විතරයි.

අපි ගිය ගමේ තිබ්බ්ච ක්‍රමය රටේ හැමතැනම ක්‍රියාත්මක කළොත් අපිට මේ සාරවත් බිම ඉදිරි පරම්පරාවට දායාද කරන්න පුළුවන්.”

“ඒක කරන්න නම් මේ යන ක්‍රමය සම්පූර්ණයෙන් වෙනස් කරන්න වෙනවා. ඔය පක්ෂ ඇතුළෙ අපේ අදහස් වලට තැනක් නෑ. ඒගොල්ලො වැඩකරන්නේ රට වෙනුවන් නෙවෙයි. මොන වැඩේ කෙරුවත් බලන්නේ තමන්ට කීයක් ලැබෙනවද කියලයි, නැති නම් කොච්චර ලකුණු දාගන්න පුළුවන්ද කියන එකයි. එකෙන් රටේ ආර්ථිකයට හොඳක් වෙනවද කියලා ඒ අය හිතන්නේ නෑ. හැම දෙනාම කියන්නේ ණය අරගන්නේ නැතිව රට සංවර්ධනය කරන්න බෑ කියලයි. ණය අරගෙන කරන සංවර්ධනයෙන් රටට යහපතක් වෙලා නෑ. ඒකෙන් වුණේ රටේ සේවා අංශය වර්ධනය වුණු එකයි. ණය වලින් ලැබුණු මුදල් නිසා ශ්‍රමයට තියෙන ඉල්ලුම වැඩිවුණා. සේවා අංශයේ රැකියාවකින් වැඩි මුදලක් උපයන්න පුළුවන්. නිෂ්පාදන වියදම වැඩි නිසා අපිට කිසිම දෙයක් අඩු මිලට නිපදවන්න බෑ. අපි නිපදවන අල ළූණු හාල් වලට වඩා අඩු මිලට පිටරටින් අල ළූණු ගෙන්වන්න පුළුවන්. අපනයන බෝග වලටත් මේක බලපාලා. දැන් රබර් වලින් ලැබෙන ආදායමට වැඩිය වියදම වැඩියි. තේ වල ලාබයත් හොඳටම අඩුවෙලා. හැමෝම කියන්නෙ පිටරටින් ආනයනය කරන

එකෙන් අපේ රටේ නිෂ්පාදන වලට තැනක් නැතිවෙලා කියලයි. ඇත්තටම වෙලා තියෙන්නෙ අපේ නිෂ්පාදන වියදම වැඩි එක. මේ ක්‍රමයේ වෙනසක් කරන්න ගියොත් ලොකු විරෝධතාවක් ඇතිවෙනවා.

ඊළඟ ආණ්ඩුවට මාස තුනකට වැඩිය ආයුෂ නෑ. ඡන්දයෙන් පත්වෙන ආණ්ඩුවකට ක්‍රමයේ වෙනසක් ඇතිකරන්න බෑ. රටේ වෙනසක් ඇතිකරන්න පුළුවන් විප්ලවයකින් විතරයි. අපි තව ටිකක් බලමු. ඊළඟට පත්වෙන ආණ්ඩුවට රට කරගෙන යන්න බැරිවෙනකොට මිනිස්සු විප්ලවයට පෙළගැහෙයි. ''

සාගර ගිරවකු වගේ කටපාඩමින් කියාගෙන ගියා.

''විප්ලවයකින් රටේ වෙනසක් කරන්න ගියොත් වෙන්නේ වටිනා ජීවිත නැති වෙන එක විතරයි. තවත් බලා ඉන්න පුළුවන් කමක් නෑ. තවත් කල්යන්න කල්යන්න විනාශය දරුණු වෙනවා. රට ආර්ථික පැත්තෙන් විතරක් නොවෙයි අපේ පරිසරයත් ලොකු අනතුරකට මුහුණපාල තියෙන්නේ. තව අවුරුදු සීයක් මේ විදියට ගියොත් අපිට ඉතුරු වෙන්නේ ජීවීන්ට අහිතකර බිමක්.

අපේ රටේ ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය බැහැර කරන ක්‍රමවේදයක් නෑ. පිටරටින් ගෙන්වන අඩුමිල ඉලෙක්ට්‍රොනික උපකරණවල කල්පැවැත්මක් නෑ. ඒවා කැඩුනම අලුත් වැඩියා කරන්න බෑ. අනික අලුත්වැඩියා කරනවට වැඩිය අලුතින් එකක් ගන්න එක ලාභයි. මේ නිසා අපේ රටේ ඉලෙක්ට්‍රොකික අපද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් එකතු වෙනවා. මේවයින් සිදුවෙන හානිය ගැන ජනතාව දැනුවත් වෙලා නෑ. ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය බැහැරකරන්නේ අනෙක් කසල එක්කමයි. කසල වලින් කොම්පෝස්ට් හැදුවත් ඒවයේ ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය වල තියෙන බැර ලෝහ අඩංගු වෙනවා. අපි වස විස වලින් තොර පොහොර කියල යොදන්නේ රසායනික පොහොර වලටත් වඩා අහිතකර දේවල්. මිනිස්සුන්ව දැනුවත් කරන එක අපේ යුතුකමක්. මම විපක්ෂයට සහය දෙන්න බලාපොරොත්තු වෙන්නේ පරිසර හා වැව්ලි කර්මාන්ත ඇමතිකම ලැබෙනව නම් විතරයි.''

සොබාසිරි එයාගෙ තීරණය සාදාරනිකරණය කරන්න උත්සහ ගත්තා.

''ජනතාව දැනුවත් කරන එක නම් මෙහෙම ඉදගෙනම කරන්න පුළුවන්.''

සොබාසිරි ධනපති පිලේ ඉත්තෙක් වෙනවට සාගර කොහෙත්ම කැමතිවුණේ නෑ.

''ජනතාව දැනුවත් වුණා කියලම වැඩක් වෙන්නෙ නෑ. ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය පරිසරයට එකතුවෙන එක වලක්වන්න ක්‍රමවේදයක් හදන්න වෙනවා.

ඒවයින් වෙන හානිය ගැන දැනුවත් වෙලා හිටියත් ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය බැහැර කරන ක්‍රමවේදයක් නැති නම් මොකද කරන්නේ. C F L බල්බ් වලින් වෙන හානිය දන්න නිසා ඒව කුණුගොඩට නොදමා අයිනක ගොඩගැහුවත් ඒක හැමදාම කරන්න පුළුවන්ද? හොඳ ඉලෙක්ට්‍රොනික උපකරණ දැන් හොයාගන්නත් අමාරුයි. පොලිතින් ප්ලාස්ටික් ගැනත් කියන්න තියෙන්නේ ඒකමයි. බදු වැඩි කලයි කියල පොලිත්න්, ප්ලාස්ටික් පාවිච්චිය අඩුවෙන්නෙ නෑ. ඒවා ප්‍රතිචක්‍රීකරණය කරන ක්‍රමයක් හදන්න ඕනැ. මේ ක්‍රමයේ වෙනසක් මෙහෙම ඉඳගෙනම කරන්න බෑ. පරිසර ඇමතිකම ලැබෙනව නම් රටේ ලොකු වෙනසක් ඇතිකරන්න පුළුවන්. පරිසර ඇමති වරයෙක් හැටියට ලංකාවෙ විතරක් නෙවෙයි මුළු ලෝකයම යහපත් තැනක් කරන්න මඟ පෙන්වන්න පුළුවන්.''

''අපි වගේ පුංචි රටක ඇමති කෙනෙක් ලෝකයටම බලපාන දෙයක් කරන්නේ කොහොමද. අපේ රටේ වනාන්තර විනාශය නැවැත්තුවට ඒකෙන් ලෝකයට දැනෙන්නෙවත් නෑ.''

''පරිසර ඇමතිකම ලැබුණම ලෝක පරිසර සමුළු නියෝජනය කරන්න අවස්ථාව ලැබෙනවා. ඒකෙදි මට පුළුවන් අද ලෝකය පත්වෙලා තියෙන තත්වය පැහැදිලි කරල දෙන්න. මිනිසා ගින්දර භාවිතය පටන් ගත්තු දවසෙ ඉඳලා පරිසර සමතුලිතතාවය බිඳවැටෙන්න පටන් ගත්තා. කාර්මික විප්ලවයෙන් පස්සේ ඒක තවත් දරුණු වුණා. මිනිසාගේ ක්‍රියාකාරකම් නිසා ගෝලීය උෂ්ණත්වය ඉහළ යනවා. පෘථිවියෙ උෂ්ණත්ව වැඩි වෙනකොට ධ්‍රැව ප්‍රදේශවල, උස් කඳු මුදුන්වල තියෙන හිම දියවෙනවා. ඒ වතුර මුහුදට එකතු වුණාම මුහුදු මට්ටම ඉහළ යනවා, කඳු මුදුන්වල තියෙන ග්ලැසියර, ජලය ගබඩා කරපු විශාල ජලශ වගෙයි. ඒවා සීතල කාලෙදි ගබඩා කරගන්න වතුර උණුසුම් කාලෙදි මුදාහරිනවා. දැනටමත් හිමාලයේ ග්ලැසියර සෑහෙන ප්‍රමාණයකින් දියවෙලා ඉවරයි. තව වැඩි කාලයක් යන්න ඉස්සර අපේ අසල්වැසි රටවල් විශාල ජල භියකට මුහුණපානවා. ඇත්තටම අපි ඉන්නේ වෙඩි නූල පත්තුවෙන බෝම්බයක් තුරුලු කරගෙන. අපි මේ මොහොතේ ඉඳලා ඉන්ධන භාවිතය සම්පූර්ණයෙන් නවත්වලා දැම්මත් ගෝලිය උණුසුම වැඩිවෙන එක නවත්වන්න බෑ. පෘථිවියේ උෂ්ණත්වය වැඩිවෙලා හිම දියවෙනකොට හිම අතර රැඳිල තියෙන මීතේන් වායුව නිදහස් වෙනවා. මීතේන් කියන්නේ කාබන්ඩයොක්සයිඩ් වගේ විසි ගුණයක් ප්‍රහල හරිතාගාර වායුවක්. මේ බෝම්බය පුපුරන එක නතරකරන්න බෑ. ඒත් බෝම්බයෙන් වෙන විනාශය අඩුකරන්න පුළුවන්.''

“ස(ර්) ඔය කතාව කියන්නේ කීවෙනි සැරයද. මට දැන් ඔය ටික කටපාඩම්. අර මහාචාර්යවරයගෙ ඩ්‍රයිවර්ට වගේ ස(ර්) රැස්වීම් වල කරන කතාව ඒ විදියටම කරන්න මටත් පුළුවන්.”

“මම මේ කතාව ඔයගොල්ලන්ට විතරක් කියපු දෙයක් නෙවෙයි. පරිසර සංවිධාන ගණනාවක් එකතුවෙලා අපි මුහුණදීල තියෙන භයානක තත්වය ගැන හැම රටකම පාලකයෝ දැනුවත් කරලයි තියෙන්නේ. සල්ලි තියෙන රටවල් හිතාගෙන ඉන්නේ පෘථිවියේ ජීවත් වෙන්න බැරි වෙන කොට හඳේ හරි අඟහරුවල හරි ජනපද පිහිටුවන්න. උන්ට හොඳටම පිස්සු. පෘථිවියෙ කාන්තාර වර්ධනය වෙන එක නවත්තන්න බැරිව හඳේ ජනපද හදන්නෙ කොහොමද? හඳේ ජනාවාස පිහිටුවන්න තියෙන උනන්දුව පොළොවෙ තියෙන කාන්තාරවල වනාන්තර ඇතිකරන්න තියෙනව නම් කොච්චර හොඳද. මට පරිසර ඇමතිකම ලැබුණොත් මේ ගැන ලෝකෙටම ඇහෙන්න කතාකරන්න පුළුවන් .”

“අනේ මන්දා? ස(ර්) මට වැඩිය උගත්, මට වැඩිය අත්දැකීම් තියෙනවා. ඇමතිකමක් ලැබුණොත් රටට, ලෝකයට ලොකු දෙයක් කරන්න පුළුවන්. ඒත් මට කියන්න තියෙන්නේ ධනපති පක්ෂත් එක්ක එකතුවෙන එකෙන් ස(ර්) ගැන තියෙන ප්‍රතිරූපය විනාශ වෙනවා.”

සාගර එයා ළඟ තිබ්බ්ච අන්තිම තුරුම්පුවත් ඇද්දා.

“සාගර බයවෙන්න එපා. මොන පක්ෂයේ හිටියත් මගේ ප්‍රතිපත්ති වෙනස් වෙන්නේ නෑ. මම වැඩකරන්නේ මගේ හදවතට එකඟව. මගේ ප්‍රතිරූපය විනාශ කරන්න හැදුවට ඒක තාවකාලිකයි. කොහෙමටත් මම මේ ගැන තව හිතල බලන්න ඕනෑ. ඒගොල්ලො එක්ක සාකච්ඡා කරලා මගේ ඉල්ලීම් පිළිගන්නව නම් විතරයි මම සහය දෙන්න තීරණය කරන්නේ. මේ වග තවම කාටවත් කියලා නෑ. සාගරත් මේ ගැන කාටවත් කියන්න එපා.”

***********************

සොබාසිරි විපක්ෂයත් එක්ක එක්වෙන්න දීපු කොන්දේසි ගැන විපක්ෂය ඇතුළෙ විවිධ මත පළවෙන්න පටන් ගත්තා. පසු පෙළ මන්ත්‍රීවරුන් කිව්වෙ සොබාසිරිගේ ඉල්ලීම්වල වටිනාකම සොබාසිරිගේ වටිනාකමට වඩා වැඩියි කියලයි. ඒත් විපක්ෂනායකවරයාගෙ අදහස වුණේ පක්ෂය ලක්වෙලා තියෙන ජනතා අප්‍රසාදයෙන් ගැලවෙන්න නම් සොබාසිරි අත්‍යාවශ්‍ය සාධකයක් කියලයි. සොබාසිරි ඉදිරිපත් කරන ඕනෑම කොන්දේසියක් පිළිගෙන ඔහුගේ සහය ලබාගැන්නෙ නැතිව ඉදිරි ගමනක් නැති බව ජනදාස මහත්තයා තරයේ ම විශ්වාස කළා.

‘‘මට පේන්නේ සොබාසිරි ඩිමාන්ඩ් කරනවා වැඩියි. මිනිහ ජාතික ලයිස්තුවෙන් ඉදිරිපත් වෙන්නත් ඇමතිකමක් ඉල්ලනවා.’’

රණබාහු මන්ත්‍රීතුමා පක්ෂ රැස්වීමේදි එහෙම කිව්වෙ පක්ෂය තුළ විශාල කාර්යයන් ඉටුකරන එයාගෙ අදහස් අනිත් අය පිළිගන්න ඕනැ කියල හිතාගෙන.

‘‘සොබාසිරි අපේ ස්ටේජ් එකට නගිනව නම් මිනිහට අගමැතිකම දෙන්න පොරොන්දු වුනත් කමක් නෑ. සොබාසිරිට මිනිස්සුන්ගේ පිළිගැනීමක් තියෙනවා. මිනිහ සුදු චරිතයක්. සොබාසිරි අපිත් එක්ක ඉන්නවා කියන්නේ අපේ කුණු ඉබේම හේදෙනවා. මිනිහා ස්ටේජ් එකට නැගලා වංචාව දූෂණය රටෙන් අතුගාල දමලා පරිසරය රැකගෙන රට සංවර්ධනය කරන හැටි කියන්න ගනියි. අපිට තියෙන්නේ ඒ කතාවට පෝර ටිකක් දමන එක විතරයි.’’

සොබාසිරිගේ පිහිට නොලැබුණොත් තවත් වසර හයක් විපක්ෂයේ ඉන්න වෙන බව ජනදාස මහත්තයා හොඳින්ම දැනගෙන හිටියා..

‘‘අපි ඡන්දයෙන් දිනුවොත් මිනිහ ඉල්ලන ඇමතිකම දෙන්න වෙනවා. පරිසර ඇමතිකම කියන්නේ වටින එකක්. ඇත්තටම අපිට පළවෙනි සැරේට හේත්තු වෙන කෙනෙකුට ඒ වගේ ඇමතිකමක් දෙන එක වැඩි නැද්ද. මම එදා ඉඳන් පක්ෂයක් එක්ක හිටියා, හිරබත් කෑව, මරණ තර්ජන ආවා, ඒත් මට මන්ත්‍රීකමෙන් උඩට යන්න බැරිවුණා. පැරිණි කාරයින්ට ඇමතිකම් දෙන එක අපි වගේ අයට කරන අසාධාරණයක්.’’

රණබාහු එහෙම කිව්වෙ පක්ෂ නායකයා එක්ක අමනාපයකින් .

‘‘ඇමතිකමක් ලැබුනෙ නෑ කියලා ඔබතුමාට අසාධාරණයක් වෙන්න ඉඩ තියන්නේ නෑ. අපේ පක්ෂය වැටිල ඉන්න තැනින් ගොඩ එන්න සොබාසිරි වගේ කෙනෙක් ඕනැ වෙනවා. තව අවුරුදු හයක් විපක්ෂයේ ඉන්න එකද සොබාසිරිට ඇමතිකමක් දෙන එකද වාසිදායක කියල කිරල බලල වාසිදේ තෝරගන්න ඕනැ. ඇමතිකම ලැබිලා කොමිස් කුට්ටි සාක්කුවට වැටෙනකොට එයා අපිට ඕනැ විදියට හැඩගැහේවි. ඉතිහාසය පුරාම සිදුවෙලා තියෙන්නේ ඔය ටික තමයි. එයා අපිට ඕනැ විදියට හැදෙන්නේ නැති නම් මොනවා කරල හරි අයින් කරලා දමනවා. ඔරුව ඕනැ වෙන්නේ ගඟෙන් එගොඩ වෙන්න විතරයි. ගඟෙන් එගොඩ වුණාට පස්සෙ ඔරුව කරේ තියාගෙන යන සිරිතක් නෑ.’’

විපක්ෂ නායකවරයා අන්තිම වචන ටික පිටකළේ රණබාහුගේ කේන්තිය නැතිකරන්න.

"කවදාවත් අපිට සාධාරණයක් ඉටුවෙන්නේ නෑ. කොට අදින අලි පෙරහරේ ගෙනියන්නේ නෑ. අපිත් එකම පක්ෂයේ ඉන්නෙ නැතිව දෙපැත්තට පැන්න නම් මෙලහකට ඇමති කෙනෙක්. ඔබතුමාල හිතාගෙන ඉන්නේ සොබාසිරිව ස්ටේජ් එකට නැග්ගෙවුවොත් ඔක්කොම හරියි කියලනේ. එකක් මතක තියාගන්න සොබාසිරිව නග්ගවන්න ස්ටේජ් හදන්න අපි නැතිව බෑ."

එහෙම කියපු රණබාහු එතැනින් පිටවෙලා ගියා.

"රණබාහු හිතාගෙන ඉන්නේ පක්ෂයේ හැමදෙයක්ම කෙරෙන්නේ එයාගෙ මැර බලයෙන් කියලයි. එයා මිනිස්සුන්ට ගහලා හිරේ ගියත් ඒවා පක්ෂය වෙනුවෙන් කරපු ඒවා කියලයි මිනිහා කල්පනා කරන්නේ. මිනිහ කරන වැඩවලින් වෙන්නේ අපිට ලැබෙන ඡන්ද එකක් හරි අඩුවෙන එකයි. පැටලෙන්න කෙනෙක් නැති නම් අපේම කෙනෙක් එක්ක කොක්කක් දාගෙන දෙන්නගෙම කුණු එළියට අදිනවා. මාධ්‍ය කාරයොත් මිනිහව ෆෝම් කරල ආතල් ගන්නවා. එයා හිරේ ගියේ මොනව කරලද කියල කියන්න කටට ආවත් මම කට වහගෙන හිටියා. මොකද සමහර වෙලාවට මිනිහව නැතිව බෑ."

රණබාහු පිටවෙලා ගියාට පස්සෙ ජනදාස ළඟ හිටපු වෙද ආරච්චිත් එක්ක කිවුවා. රණබාහු පිස්සෙක් බව දන්න නිසා එයා ඉන්න තැන කතාකරන්න ජනදාසත් බයයි.

"වැඬේ කියන්නේ මිනිහ මිනී මරල හිරේ ගියත් වැඩිම මනාප ගන්න එකයි. දොස්තරකම තියෙන මට වැඩිය අට පාස් රණබාහු ඡන්ද ගත්තා."

"අපි මේ වෙලාවෙ සොබාසිරිවයි, රණබාහුවයි දෙන්නම හොඳින් තියාගනිමු. සොබාසිරිගෙ මොළෙයි රණබාහුගෙ බලෙයි දෙක එකට එකතු කළාම අපිට ඡන්දෙ දිනන එක ලේසියෙන්ම කරන්න පුළුවන්."

*************** *

විපක්ෂයත් එක්ක රහසිගත සාකච්ඡාවක් තියන්න සෙබාසිරි හිතාගෙන හිටියත් විපක්ෂ නායකවරයාගේ අදහස වූණේ සාකච්ඡාවෙන් පස්සෙ දෙගොල්ලො අතර එකඟතාවක් ඇතිවුණොත් ඒක නොපමාව මාධ්‍යට කියන්න ඕනැ කියලයි.

සොබාසිරි විපක්ෂයත් එක්ක පවත්වපු සාකච්ඡාවට මුලු රටේම අවධානය යොමුවෙන්න විපක්ෂ නායකවරයා කළ ප්‍රකාශය හේතුවුණා. සොබාසිරි එක්ක පවත්වපු සාකච්ඡාවෙන් පස්සෙ ප්‍රවෘත්ති සාකච්ඡාවක් කියපු විපක්ෂ නායකවරයා කිව්වෙ සොබාසිරි වගේ ප්‍රගතිශීලී පුද්ගලයෙක් තම පක්ෂය සමඟ එකතුවීම

සතුටට කාරණාවක්  කියලයි. පක්ෂයේ අඩුපාඩු තියෙනව නම් ඒවා ඉදිරියේදී නිවැරදි කරගෙන අලුත් ප්‍රතිපත්ති මාලාවක් ඉදිරිපත් කරමින් ඉදිරි මැතිවරණයට මුහුණ දිමට බලාපොරොත්තුවන බවත්, අලුත් ප්‍රතිපත්ති මාලාව සකස් කිරිම සොබාසිරි මහත්තයගෙ උපදෙස් මත දැනටමත් පටන් අරන් තියෙනව කියල ජනදාස මහත්තයා කිවුවා.

ජනදාස මහත්තයා කිවුව වගේම පක්ෂයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය සකස්කිරීමේ වගකිම සොබාසිරිට පැවරුනා. පක්ෂයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය හදන එක පැරිෂුට් කාරයෙකුට දුන්න එකට පක්ෂයෙ ජොෂ්ඨයො කැමතිවුණේ නෑ. ඒගොල්ලො මේ ගැන කතාකරන්න ජනදාස මහත්තයව මුණගැහුනා.

"හටන් ආරච්චි මහත්තයා බයවෙන්න එපා. ප්‍රතිපත්ති ප්‍රකාශනය කියන්නෙ නිකන් වචන ටිකක් විතරයි. මේ වෙනතුරු බලයට ආපු කිසිම ආණ්ඩුවක් ප්‍රතිපත්ති ප්‍රකාශනයෙ හැටියට වැඩකරල නෑ. සොබාසිරි හදන ප්‍රතිපත්ති ප්‍රකාශනය ඡන්දය දිනන්න පාවිච්චි කරන එකක් විතරයි. ඡන්දය දිනුවට පස්සෙ ඒකෙන් වැඩක් නෑ."

පක්ෂය ඇතුළෙ නැගිල ආව කැරුල්ල බොහොම පහසුවෙන් විසඳන්න ජනදාසට පුළුවන් වුණා.

**************************************

"ඒගොල්ලො මම ඉල්ලන ඇමතිකම් දෙන්න කැමතියි. ඉදිරි ඡන්දයේදි මම කියන ප්‍රතිපත්ති වලට එකඟව කටයුතු කරන්නත් ඒ අය කැමති වුණා."

සොබාසිරි බෑග් එකකට එයාගෙ ඇඳුම් අහුරන ගමන් කිව්වා.

"ස(ර්) ඇඳුම් පැක් කරන්නේ මෙහෙන් යන්නද? ."

මේ වෙන්න යන්නෙ මොකක්ද කියල හිතාගන්න බැරිවුණු සාගර ඇහුවා.

"ඔව් සාගර, ඉස්සරහට මට වැඩ වැඩිවෙනවා. රස්සාවෙනුත් අස්වෙන්න වෙයි. පක්ෂයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය හදන එක මට පැවරුනා. මම හිතාගෙන ඉන්නේ රට ගොඩගන්න පුළුවන් ප්‍රතිපත්ති ප්‍රකාශනයක් හදන්න."

"රට ගොඩගන්න පුළුවන් ප්‍රතිපත්ති ප්‍රකාශනයක් හදන එක ස(ර්)ට කරන්න පුළුවන්. ඒත් මේ අයත් එක්ක ඒවා ක්‍රියාත්මක කරන්න පුළුවන් වෙයිද?."

"ඒ ගැන සැකයක් හිතන්න එපා. වංචාව දූෂණය රටෙන් තුරන් කරලා රට අලුත් මාවතකට ගන්න විපක්ෂ නායකයා කැමතියි. සාගරට ඒ ගොල්ලො ගැන

විස්වාසයක් නැත්තේ රතුපාට කණ්නාඩිය දාගෙන බලන නිසා. මම වගේ පාට කන්නාඩි ගලවලා ඒ අය දිහා බලන්න ."

"ජනදාස දාගෙන ඉන්නෙ වෙස්මූණක් කියන එක ස(ර්)ට තේරෙන්නෙ නැද්ද. ඡන්දෙ දිනුව ගමන් ඔය වෙස්මූණ ගලවල පරණ මූණ ම දාගන්නවා. එයා ළඟ තියෙන වෙස්මූණු අම්බලන්ගොඩවත් නෑ. කොහොම බැලුවත් ඒ අයගෙ හොඳක් දකින්න මට නම් බෑ. මට හිතෙන විදියට ඒ අය හදන්නේ ස(ර්)ව රවටලා බලයට එන්න. ස(ර්) වගේ කෙනෙක් ඉස්සරහට දාගත්තම මිනිස්සුන්ව රවට්වන්න ලේසියි."

"මම ගියා කියල ඔයා මෙහෙන් යන්න එපා. මෙතෙන්ට අවුරුද්දක සල්ලි ගෙවල තියෙන්නේ. තව මාස තුනක් ඉන්න පුළුවන්. ඊට පස්සෙ මොකක් හරි බලමු. ඒ වෙන කොට  බොහෝ විට මම ඇමතිකෙනෙක්, පාර්ලිමේන්තුව ලබන මාසෙ විසිරුවනවා."

සාගර කියන කතාව බොරුයි කියල ඔප්පු කරන්න පුළුවන් කමක් සොබාසිරිට තිබුණෙ නෑ. ඉතිහාසය පුරාම ජනදාසල වැඩකරල තිබුණෙ සාගර කියපු විදියටයි. එයා කතාව වෙන පැත්තකට හරවලා යන්න සූදානම් වුණා.

"ඒ වෙනකොට ස(ර්)ව මාව අමතකවෙලත් යයි."

අවුරුදු ගාණක් එකට හිටිය මිතුරා, ගුරුවරයා තමන්ව නවාතැනේ තනිකරල පිටවෙලා යන එක සාගරට දරාගන්න අමාරුවුණා.

විපක්ෂය ඡන්ද සටනට ආවෙ සොබාසිරිගේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ඉදිරිපත් කරගෙන. දේශීය කෘෂිකර්මාන්තය සහ කර්මාන්ත නඟාසිටුවමින් පරිසරයට හානියක් නොකර රටේ ආර්ථිකය දියුණු කරන ආකාරය පැහැදිලි කරල තිබුණෙ ප්‍රතිපත්ති ප්‍රකාශනය කියවන ඕනෑම කෙනෙකුට තේරෙන විදියට. ඡන්ද රැස්වීම්වලදි ඉදිරියේදි පිහිටුවීමට බලාපොරොත්තුවන රජයෙන් රටේ ආර්ථිකය නගාසිටුවන ආකාරය පැහැදිලි කරන එක සොබාසිරිට බාරවුණා. සෑම ඡන්ද රැස්වීමකම ප්‍රධාන කථිකයාගේ තැන හිමිවූයේ සොබාසිරිට. සොබාසිරිගේ කතා අහන්න විපක්ෂයේ ඡන්ද රැස්වීම් වලට ජන ගඟක් ගලාගෙන ආවා.

රටේ නව වෙනසක් ඇතිකරන්න සොබාසිරිට හැකියාව තියෙන බව බොහෝ දෙනාගේ මතය වුනා. එම පිළිගැනීම හින්ද ම මැතිවරණයේදී විපක්ෂයට බහුතර බලයක් ලැබුණා. පොරොන්දු වූ පරිදිම ජාතික ලයිස්තුවෙන් මන්ත්‍රී ධූරයක් සහ පරිසර හා කෘෂිකර්ම ඇමති ධූරය ලබාදීමට නව රජයේ

අගමැතිවරයා ලෙස පත්වූ ජනදාස මහතා කටයුතු කළේ ආදර්ශමත් නායකයකු විදියටයි.

ඇමති ධූරයට පත්වෙච්ච දවසෙ ඉදල ම සොබාසිරි දිවා රෑ වෙහසවෙලා පක්ෂයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය යථාර්තයන් බවට පත්කිරීමට අවශ්‍ය සැලසුම් සකස්කලා. එයා හැම පළාතකට ම ගිහින් ඒ සැලසුම් යතාර්ථයක් බවට පත්කරන්න ඕනෑ වටපිටාව සකස්කළා. ඒත් අගමැතිවරයාගේ හරි වෙනත් කිසි ඇමතිවරයකුගේ හරි ප්‍රතිපත්ති ප්‍රකාශනය ක්‍රියාත්මක කරන එක ගැන උනන්දුවක් තිබුණෙ නෑ. අගමැතිවරයා පදවියට පත්වූ දා සිටම උත්සහගත්තේ විදේශ ආධාර ලබාගන්න. එයා හැමවෙලාවෙම කිව්වෙ පසුගිය රජය ගෙනගිය වැඩපිළිවෙල නිසා රටට ණයක්වත් ගන්න බෑ කියලයි.

**********************************

03

ලෝකයම පාලනය කරන්න ආර්ථික අතින් ඉදිරියෙන් ඉන්න රටවල් වලට පුළුවන්. තමන්ගෙ රටේ තෙල් නිධි නොතිබුණත් ලෝක තෙල් මිල පාලනය කරන්නෙ ධනවත් රටවල්. සියවස් දෙක තුනකට ඉස්සර ලෝකයේ ආර්ථික බලවතා හිටියෙ හිරු නොබහින අධිරාජ්‍ය. ඒක පරදවල ඇමෙරිකාව ලෝක ආර්ථික බලවතා බවට පත්වුණේ තමන්ට අභියෝග කරපු සමාජවාදී රුසියාව කෑලි කෑලි වලට කඩල දාලයි. අද වෙනකොට ඇමෙරිකාව පරද්දලා අලුත් රටක් ලෝක ආර්ථික බලවතා බවට පත්වෙලා.

ලෝකයේ ආර්ථික බලවතුන් හට තර්ජන එල්ල කරමින් ඉදිරියට ඒමට හැකිවුණත් තමන්ගෙ රටේ නිපදවන තේ වලට ලංකාවේ තේ පරාජය කරල පළමු තැන ලබගැනීමට බැරිවෙච්ච එක ගැන ලෝකයෙ අලුත් ආර්ථික බලවතා සිටියේ නොසතුටින්. ඒකෙ නායකයො සැම වෙලාවකම උත්සහගත්තේ ලෝක තේ ඒකාධිකාරිය තමන්ගෙ අතට ගන්නයි.

"ලෝක ආර්ථික බලවතුන් එක්ක තරග කරලා ලෝක ආර්ථික බලය අරගන්න පුළුවන් වුණත් ලංකාවෙ තේ පරාද කරලා තේ ඒකාධිකාරිය අරගන්න තවම බැරිවුණා. අපිට බැරිවෙයිද අරගොල්ලො ලංකාවෙ රබර් වගාව විනාශ කරන්න රබර් දර වැඩිමිලට ගන්න පැක්ට්‍රියක් දැම්ම වගේ වැඩක් කරන්න."

අලුතෙන් ආර්ථික බලවතා බවට පත්වූ රටේ අගමැතිවරයා වෙළඳ ඇමති වරයාගෙන් ඇහුවෙ ලෝක ආර්ථිකයේ තවත් අංශයක බලය තමන් සතුකරගන්න හිතාගෙනයි.

“ඒ වගේ දෙයක් කරන්න අමාරුයි. අපි තේ ගස් අරගෙන මොනවා කරන්නද? ඒ ගොල්ලො නම් රබර් දර අරගෙන ලෑලි හැදුවා.

“අපි තේ ගස් අරගෙන ඒවයින් මල් ගස් හදමු. ලොකු ගානක් දීල තේ ගස් ගත්තම තේ වගාව නැතිකර දමන්න පුළුවන්.”

“ඒක සාර්ථකවෙයි කියලා හිතන්න බෑ. මොකද තේ ගහක් හැදෙන්න ඒ තරම් කාලයක් යන්නේ නෑ. අපිට තේ ගස් ගන්න එක දිගටම කරන්න වෙනවා. මේ ගොල්ලන්ව අල්ලේ නටවන්න පුළුවන් සැලැස්මක් මා ළඟ තියෙනවා.”

වෙළඳ ඇමතිවරයා කිව්වෙ අගමැතිවරයා බලාපොරොත්තු වන සැලැස්ම ගැන තමාත් අවධානයෙන් හිටපු බව පෙන්වමින්.

“මොකක්ද ඒ සැලැස්ම, තේ වලට කුරුමිනියෙක් දැම්මා වගේ වැඩක්ද? .”

අගමැතිවරයා ඇහුවෙ මුවට සිනාවක් නගාගෙන.

“නෑ එච්චර අමාරු වැඩක් නෙවෙයි. ලංකාව දැන් ණය උගුලේ අසුවෙලා ඉවරයි. දැන් ඒ ගොල්ලන් ණය ගන්නේ නැතිව රට කරගෙන යන්න බැරි තත්වයට පත්වෙලා. අපේ ඔත්තු සේවා සපයපු තොරතුරු අනුව ලංකාවෙ අලුතින් පත්වෙලා තියෙන ආණ්ඩුව රට කරගෙන යන්න බැරුව දහ අතේ දුවනවා. තව වැඩි දවසක් යන්න ඉස්සර ලංකාවෙ මැති ඇමතිවරු පාත්තරයත් අරගෙන මෙහාටත් එයි.”

“ඒ ගොල්ලන්ට තවත් ණය දෙන්න එපා. උන් ණය අරගෙන කරලා තියෙන්නේ ආයෝජන නෙවෙයි.”

“ඒවට අපිත් වගකියන්න ඕනෑ. මේ පාර ලංකාවට දෙන්න හදන්නේ කුණු ජොබ් එකක්. අපේ රටේ කරන්න දෙයක් නැතිව තියෙන ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය නොමිලයේම ලංකාවට ලබාදෙනවා. ඒගොල්ලන්ට කරන්න තියෙන්නේ කුණු වර්ග කරලා අමුද්‍රව්‍ය බවට පත්කරලා ආපසු අපිට ලබාදෙන එකයි. අවශ්‍ය කර්මාන්ත ශාලා අපේ වියදමෙන් හදනවා. ඒක ලංකාවට සෑහෙන ආදායමක් ලබන්න පුළුවන් ව්‍යාපෘතියක්.”

“එච්චර ආදායමක් ලබන්න පුළුවන් නම් ඒ මුදල් පිටරටකට දෙන්නේ ඇයි. ඔය කටයුතු මෙහෙදීම කරමු. අනික ලංකාවට මුදල් ලැබුණා කියලා අපේ අරමුණු ඉටුවෙනවද?”

“මේකෙන් අපේ අරමුණ ඉටුවෙන්නේ වක්‍ර විදියට. ඔය ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය අමුද්‍රව්‍ය බවට පත්කරන කොට විශාල පරිසර දූෂණයක් වෙනවා. අපේ

කාර්මික නගර වල වායු දූෂණය අහිතකර මට්ටමත් පහුකරලා. ඒ කර්මාන්ත ශාලා වෙනත් රටක තියෙන එක හොඳයි. අපේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙනකොට ඒකෙ යෙදෙන අයට විශාල මුදලක් ලැබෙනවා. ලංකාවෙ වෙන කිසිම කර්මාන්තයකින් ඒ තරම් මුදලක් ලබාගන්න බැරිවෙනවා. ඒත් එක්කම හැම කර්මාන්තයක්ම බිඳවැටෙනවා. තේ නිශ්පාදනයටත් වෙන්නේ ඒ ටිකමයි. කිසිම දෙයක් නිපදවන්නේ නැති වුණාම ලංකාව හොඳ වෙළඳපලක් කරගන්න පුළුවන්. අපේ සල්ලි ආපහු අපිටම ලබාගන්න පුළුවන්.''

වෙළඳ ඇමතිතුමා එයාගෙ සැලැස්ම පැහැදිලි කරල දුන්නා.

******************** *

ඇමති මණ්ඩලය පත්කරල සතියක් ගතවෙන්නත් ඉස්සර අගමැතිවරයා පිටරට ගියේ ඉදිරි වසර හයක කාලයට අවශ්‍ය මුදල් සොයාගෙන එන්නයි. සති දෙකක විදේශ සංචාරයකින් පස්සෙ ආපසු ලංකාවට ආව අගමැතිවරයා පක්ෂ නායක රැස්වීමක් කැදෙවුවේ ඉදිරියේදි රටට හඳුන්වල දෙන ආර්ථික වැඩපිළිවෙල ගැන තම මන්ත්‍රී කණ්ඩායම දැනුවත් කරන්න ඕනැ නිසයි. පුරුදු විදියටම අගමැතිතුමා රැස්වීමට එන්න ප්‍රමාද වුණා. මැති ඇමතිවරු රැස්වීම් ශාලාවෙන් එළියට ඇවිත් තමන්ගෙ කතා පටන් ගත්තා.

''ඇමතිතුමා ඇත්තටම දැන් වෙන්නෙ මොකද? අගමැතිතුමා ආපසු ආපු එක ගැන කිසිම සද්දයක් නෑ.''

ධනවර්දන ඇමතිතමා ළඟට ආව සුරසේන මන්ත්‍රීවරයා එහෙම ඇසුවේ රට තවත් ඉදිරියට ගෙනයාමට මුදල් නැති බවට පැතිරීයන කතාවේ ඇත්ත නැත්ත දැනගන්න හිතාගෙන.

''ඇත්තම කියනව නම් දැන් අපි බෙල්ල මුලටම හිරවෙලා. කිසිම කෙනෙක් අපිට ණය දෙන්න ඉදිරිපත් වෙන්නෙ නෑ. අපි අරගෙන තියෙණ ණය මේ රට විකුණලත් බේරන්න බෑ.''

''ඒ කියන්නේ අපිට මේක අතැරදමල යන්න වෙනවා කියලද? ඔබතුමාල ඒක මුලින්ම කිව්ව නම් අපි ඡන්දෙට වියදම් කරන්නෙ නෑ. සුළු පටු මුදලක්ද වියදම් කළේ. අඩුගානෙ අවුරුදු තුනක්වත් ඇදගෙන ගියොත් වියදම් කරපු ගානවත් හොයාගන්න පුළුවන්.''

''බොරු කියන්න එපා. අවුරුදු තුනක් යනකොට වියදම්කළ ගාන වගේ දහ ගුණයක් හොයාගන්න පුළුවන්. ඔබතුමාල බය නැතිව ඉන්න ලොක්ක මේ රටේ මිනිස්සුන්ව විකුණල හරි තව අවුරුදු හයක් දුවන්න සල්ලි හොයාගෙන එයි.

බයවෙන්න දෙයක් නෑ ඒව ගෙවන්න වෙන්නෙ අපිට නෙවෙයි. අපි රටේ මිනිස්සුන්ට ඕනෑ  රට විකුණල හරි කන්න බොන්න ජොලිකරන්න දෙන ආණ්ඩුවක්. උන්ට ඕනෑ වැඩ නොකර පඩි ගන්න, අපිටත් තියෙන්නේ රට විකුණල හරි සල්ලි හොයාගෙන රට ගෙනියන එකයි . රට ගෙනියන්න නම් මේ අවුරුද්ද ඇතුළත ට්‍රිලියන පහක ණයක් ගන්න වෙනවා.  අපි ණය ගන්න ගියොත් විපක්ෂය කෑගහන්න ගනියි රට ගෙනියන්න ණය ගන්නව කියලා.’’

‘‘ණය අරගන්නෙ නැතිව රට ගෙනියන්නෙ කොහොමද?. ඒගොල්ලො ආවත් කරන්නෙ ණය ගන්න එකනෙ. මට නම් ඕව තේරෙන්නෙ නෑ. මොකද මම උපාධි අරගත්ත කෙනෙක්යෑ. ඕලෙවල් විභාගෙට වාඩිවුණා. ලයිට් කනු හයකුයි බිලී කොකු දෙකකුයි ගත්තා. ඔබතුමාලගෙ පිහිටෙන් අපේ සල්ලි වලින් දෙයියනේ කියල ඉන්නවා. හැබැයි උපාධි කාරයන්ටත් උපදෙස් දෙන්නේ මම.’’

පණ්ඩිත රත්ත මන්ත්‍රීතුමා කිව්වෙ හිනාවක් දාගෙන. ඒ හිනාව මුදල් ඇමතිතුමාට බෝවෙන්න වැඩි වෙලවෙක් ගියේ නෑ.

‘‘පාර්ලිමේන්තු මන්ත්‍රී කමක් කරන්න මහ ලොකු උගත්කමක් ඕනෑ නෑ. මොකද අපි ඡන්දෙ දෙන්නේ හොයල බලලයෑ. තමන්ගෙ පක්ෂයේ ඕනෑම යෝජනාවක් දිනවන්න අත උස්සනවා, විරුද්ධ පක්ෂයෙන් ගෙනාවොත් පරද්දන්න අත උස්සනවා. ඔය ටික දන්නව නම් මන්ත්‍රීකම කරගෙන ඉන්න පුළුවන්. ’’

එතනට ආව රණබාහු මන්ත්‍රීවරයා කියනවත් එක්ක සූරසේනයි, මුදල් ඇමතිතුමයි බඩ අල්ලගෙන හිනාවෙන්න ගත්තා.

‘‘අන්න අගමැතිතුමා එනවා. මූණ නම් හොඳයි. මට පේන්නේ ලොකු ණයක් ගන්න පුළුවන් වෙලා.’’

වෙද ආරච්චි ඇමතිතුමා කිව්වෙ කාටත් ඇහෙන්න.

‘‘මූණ නම් හොඳයි, ඒත් ණය ගන්න පුළුවන් වුණා කියල හිතන්න බෑ. ඒත් එකක් කියන්න පුළුවන්, රට විකුණල හරි සල්ලි හොයන ක්‍රමයක් හොයාගෙන තියෙනවා.’’

මුදල් ඇමති ධනවර්ධන මහත්තයා රැස්වීම් ශාලාව දෙසට ගමන් කරන ගමන් කිවුවා. ඒත් එක්කම තැන් තැන්වල කතාකරමින් හිටිය මැති ඇමතිවරු රැස්මේ ශාලාව වෙත ගමන් කළා.

‘‘රජයක් පිහිටෙවුවට අපි පත්වෙලා ඉන්නෙ මෙතෙක් කලක් බලයට පත්වෙච්ච ආණ්ඩුවක් පත් නොවුණු තත්වයකට. මම පසුගිය දවස්වල අපිට

ආධාර දෙන කණ්ඩායම් රාශියක් එක්ක සාකච්ඡා කළා. ඒ කිසිම ආයතනයක් අපිට ණය ලබාදෙන්න කැමත්වුණේ නෑ. කිසිම වානිජ බැංකුවකින් අපිට ණය ලබාගන්න බෑ. ඒ ආයතන කියන්නේ අපේ රට බංකොලොත් තත්වයට පත්වෙලා කියලයි. දැනට තියෙන තත්වය අනුව තව මාස දෙකකට වඩා රට කරගෙන යන්න පුළුවන් කමක් නෑ. රටේ ආර්ථිකය කඩාගෙන වැටිලා. භාණ්ඩාගාරය හිස්වෙලා. මෙහෙම තත්වයක් ඇතිවෙන බව අපි ඡන්දෙට ඉස්සර වෙලා ඉඳලම දැනගෙන හිටියා.''

අගමැතිතුමා රැස්වීම් ශාලාව නොසන්සුන් කරමින් කිවුවා.

''ඔබතුමා මේ බව ඉස්සර වෙලාම කිවුව නම් අපි ඡන්දෙට වියදම් කරන්නෙ නෑ. දැන් අපි වියදම් කරපුවා හොයාගන්නෙ කොහොමද? .''

පසුපෙළ මන්ත්‍රීවරු කෑගහන්න පටන්ගත්තා.

''කලබල වෙන්න එපා මම කතා කරලා ඉවර නෑ. අපේ පක්ෂයේ ජයග්‍රහණය වෙනුවෙන් කැපවුණු ඔයගොල්ලන්ව අතරමං කරන්නේ නෑ. අපිට තව එක බලාපොරොත්තුවක් තියෙනවා. ඒක සාර්ථක කරගන්න, ඒ කියන්නේ ඒක සාර්ථකව සමාජගත කරන්න ඔබ හැමදෙනාගේ සහයෝගය අවශ්‍ය කරනවා. සල්ලි වීසි කරල හරි විපක්ෂයේ අයවත් මේකට කැමතිකරවා ගන්න පුළුවන් නම් වඩාත් හොඳයි.''

අගමැතිවරයා කතාව මඳකට නතර කලේ සභාවට ප්‍රශ්නාර්ථයක් ඉතිරි කරමින්.

''කාටත් තේරෙන භාෂාවෙන් කියනව නම් මේක කුණු ජොබ් එකක්. විශාරද භාෂාවෙන් කියනව නම් කසල ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතියක්. දැනට ලෝක ආර්ථිකය මෙහෙයවන රට කැමති වුණා ඒ අයගෙ අපද්‍රව්‍ය කළමණාකරණයට අපේ රට යොදාගන්න.

අපිට තියෙන්නේ ඒ රටෙන් අපිට එවන කසල වර්ගීකරණය කරන එකයි. කසල කිවුවම දැනටමත් සමහරුන්ගේ මූණ අමුතුවෙලා. මේ කසලවල එංගලන්තයෙන් ගෙන්වපු කසල කන්ටේනර් වල වගේ කුණුවෙච්ච ඇටකටු, රෝහල්වල පරණ මෙට්ට අඩංගු වෙන්නෙ නෑ මේවයේ තියෙන්නේ භාවිතයෙන් ඉවත් කරපු ඉලෙක්ට්‍රොනික උපකරණ. මේ ව්‍යාපෘතියෙන් පරිසරයට බලපෑමක් වෙන්නේ නෑ. අපිට තියෙන්නේ ඒවයේ තියෙන ලෝහ කොටස්, ප්ලාස්ටික් කොටස් වෙන්කරන එක. අපට අපද්‍රව්‍ය සපයන රට ම වෙන්කරපු කොටස් අමුද්‍රව්‍ය බවට පත්කළාට පස්සේ මිලට ගන්නවා. ඒ සඳහා අවශ්‍ය කර්මාන්ත ශාලා ඒ ගොල්ලොම ඉදිකරනවා. දකුණු ආසියාවෙ විශාලම යකඩ කම්හල, තඹ

කම්හල ඇතුළු කර්මාන්ත ශාලා රාශියක් අපේ රටේ බිහිවෙනවා. ඒකෙන් ඍජු රැකියා අවස්ථා මිලියන තුනක් බිහිකරන්න පුළුවන්. ඒ කසල වර්ගීකරණය කරන රැකියා වලට අමතරව. අපේ රටේ විරැකියාව සම්පූර්ණයෙන්ම නැති කරලා පිටරට ශ්‍රමිකයින්ටත් රැකියා ලබාදෙන්න පුළුවන් වෙනවා. මේක ඇත්තටම සිදුකරන්න පුළුවන්. ඡන්ද පොරොන්දු වලදි කියපු රැකියා දසලක්ෂය, කාර් හදන කර්මාන්තශාලා වගේ බොරු කතා නෙවෙයි. ...”

අගමැතිවරයගෙ කතාව තවදුරටත් අහගෙන ඉන්න සොබාසිරිට පුළුවන් වුණේ නෑ. එයා අගමැතිතුමාගේ කතාවට බාධා කරමින් ඔහු ඉදිරිපත් කරන යෝජනාවට විරුද්ධව අදහස් දක්වන්න පටන් ගත්තා.

“අගමැතිතුමාගෙ කතාවෙ පිටරටින් ගෙන්වන කුණු වල ප්‍රතිචක්‍රීකරණය කරන්න පුළුවන් දේවල් තෝරාගත්තට පස්සෙ ඉතිරිවෙන කොටසට වෙන දේ ගැන සඳහනක් වුණේ නෑ. මම දැනගන්න කැමතියි ඒ ඉතිරි දේ වලට මොකද වෙන්නේ කියලා.”

පරිසර ඇමතිවරයාගේ කතාවෙන් ආණ්ඩුවේ පසුපෙළ මන්ත්‍රීවරු ඇවිස්සුනේ දෙබරයට ගල් ගැහුවා වගෙයි. සොබාසිරි හදන්නෙ අගමැතිවරයාගේ අලුත් ව්‍යාපෘතියට විරුද්ධ වෙලා ඒක නවත්වන්න කියල ඒගොල්ලන්ට තේරුණා.

“මහලොකු මහාචාර්ය, ඒත් මැනස් දන්නෙ නෑ. රටට වැදගත් වෙන දෙයක් ගැන විස්තර කරන කොට ඔහොම මැද්දට පනිනවද? රට ගැන ආදරයක් නැති ............... .”

සොබාසිරිගෙ කතාවට ප්‍රතිචාර ලැබුණේ ලියන්න බැරි වචනවලින්.

“පරිසර ඇමතිතුමා කලබල වෙනවනේ. මම ව්‍යාපෘතිය ගැන විස්තර කරලා ඉවර නෑ. ඉතිරිවෙන අපද්‍රව්‍ය කොන්ක්‍රීට් වලින් ආවරණය කරලා ආරක්ෂිතව තැම්පත් කරනවා. ඒ සඳහා වැයවන සියලුම වියදම අපිට ලැබෙනවා. කොන්ක්‍රීට් බහාලුම් වලට වැයවන භූමියටත් වසර පනහක් ඉදිරියට ගණන් බලලා ගෙවීම් කරනවා මේ ව්‍යාපෘතියෙන් පරිසරයට කිසිම බලපෑමක් වෙන්නේ නෑ. එක බහාලුමක් මීටර තුනක් වෙන නිසා බහාලුම් අතර රබර් වගේ වගාවක් කරන්නත් පුළුවන්.”

ප්‍රතිචක්‍රීකරණය කරන්න බැරි කොටස් කොන්ක්‍රීට් වලින් ආවරණය කරල තැම්පත් කරනව කියල කියන කොට ඒවයින් පරිසරයට වෙන්න පුළුවන් හානිය සොබාසිරිගෙ ඔළුවට ආවා. රටට විපතක් වෙනකොට නිහඬව ඉන්නෙ නැති සොබාසිරිට තවදුරටත් නිහඬව ඉන්න පුළුවන් වුණේ නෑ.

“පරිසර ඇමතිවරයා හැටියට කොහොමවත් ම මේ ව්‍යාපෘතියට අනුමැතිය දෙන්න මට පුළුවන්කමක් නෑ. පිටරටින් අපට ලැබෙන්නේ ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය. ඒවයේ බැර ලෝහ ඒ කියන්නේ රසදිය, කැඩ්මියම් ආසනික් වගේ පරිසරයයට අහිතකර විෂ රසායන අඩංගු වෙනවා. එක C.F.L බල්බ් එකක තියෙන රසදිය වලින් ඝන මීටර් දහයක භූගත ජලය අපවිත්‍ර වෙනවා. ෆෝන් බැටරියකිනුත් ඒ වගේම දෙයක් සිදුවෙනවා. මේ අපද්‍රව්‍ය කොන්ක්‍රීට් බහාලුමක දැම්මත් ඒවා පරිසරයට එකතු වෙන්න පුළුවන්. එහෙම එක බහාලුමක් හරි පලුදු වුණොත් වර්ග කිලෝමීටර් ගණනක භූගත ජලය අපවිත්‍ර වෙනවා. අපි ඡන්දයට ඉදිරිපත් වුණේ රට හදන්න පුළුවන් ප්‍රතිපත්ති ප්‍රකාශනයන් ඉදිරිපත් කරලා. දැන් තියෙන්නේ ඒක ක්‍රියාත්මක කරන එකයි. අපේ රට ලෝකයට ණය වුණත් තවම අපිට සරුසාර පොළොවක් ඉතිරිවෙලා තියෙනවා. යුරෝපීය ජාතීන් අපේ රට ආක්‍රමණය කළේ අපේ රටේ වැවෙන කුළුබඩු නිසා. අපි ලංකාව පුරාම ඒ බෝග වගා කළොත් අපිට ලෝකෙට ණය නොවී රට ගෙනියන්න පුළුවන්. අවුරුද්දක් දෙකක් යනතුරු කරදර වෙන්න පුළුවන්. මේ ව්‍යාපෘතිය කළොත් වෙන්නේ අනාගත පරපුරට රටක් නැතිවෙන එකයි. අපිට ඉතිරිවෙන්නේ වස විසන් පිරුණු පොළොවක්. ඒකෙන් වෙන්නේ අනාගත පරපුර නොයෙක් ලෙඩ රෝග වලට ගොදුරුවෙන එකයි. දැනටමත් හඳුනා නොගත් වකුගඩු රෝගය රටපුරා ව්‍යාප්ත වෙලා. හඳුනා නොගත් කියලා ඇඟ බේරගත්තට වකුගඩු රෝගය ඇතිවෙන්නේ බැරලෝහ නිසයි.”

සොබාසිරිට කතා කරන්න බැරිවෙන්න හැම පැත්තෙන්ම බාධා කිරීම් නැගිල ආවා. ටික වෙලාවක් යනකොට එයා කතාකරන දේවත් එයාටම ඇහෙන්නෙ නැති තරමට බාධා කිරීම වැඩි වුණා.

පිං ඇමතිකම් අරගෙන රට ආපස්සට හැරවීමට උත්සහ ගන්නා අයකු ලෙස නැගෙන අපවාද අහගෙන ඉන්න බැරි තැන කතාව නවත්තලා අසුන් ගන්න සොබාසිරිට සිදුවුණා.

“මට පේන හැටියට අපේ බොහොමයක් උගතුන් වගේ කොරහෙත් කිඹුල්ලු දකින තත්වයට සොබාසිරි ඇමතිතුමා පත්වෙලා. මේක අපේ රට ගොඩගන්න තියෙන අන්තිම අවස්ථාව. එතුමා කියන විදියට මුලු රටේම අපනයන බෝග වගාකළත් අපි අරගෙන තියෙන ණය ගෙවන්න අවුරුදු සීයකටවත් බෑ. මෙච්චර අමාරුවෙන් ඉලෙක්ට්‍රොනික යුගයට අරගෙන ආපු රට ආයෙත් ගොවි යුගයට අරගෙන යන්න කියලද ඔබතුමා කියන්නේ. ඔබතුමා කියන විදියට රටේ ඉන්න හැමදෙනාම අමුඩ ගහගෙන ගොවිතැන් කරන්න ඕනෑ. අගමැති වරයා වශයෙන් මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා අපේ

යෝජනාවට එකඟ වෙන්න කියලා. එහෙම එකඟ වෙන්න බැරි නම් නම්බුකාර විදියට ඉල්ලා අස්වෙන්න. නැති නම් අපිට සිදුවෙනවා ඔබතුමාව ඇමතිකමෙන් ඉවත් කරන්න.''

මේ ව්‍යාපෘතියට කැමති වෙන්නෙ නැති නම් ඉල්ලා අස්වෙන්න කියල ජනදාසගෙ කටින් කියවෙන කොට සොබාසිරිට ඒක විශ්වාස කරන්නව බැරිවුණා. එයා හිතාගෙන හිටියෙ ජනදාස කියන්නෙ මහත්මා දේශපාලනයක් තියෙන කෙනෙක් කියලයි.

මම නැති නම් මේ ගොල්ලො තාමත් විපක්ෂයෙ. ජනදාස ගාව තියෙන වෙස්මූණු අම්බලන්ගොඩවත් නෑ කියල සාගරට තේරුණාට දේශපාලනයෙන් තෙම්පරාදු වෙච්ච මට ඒක තේරුණේ නෑ. තවත් මේගොල්ලොත් එක්ක කන දීගෙන් වැඩක් නෑ.....

සොබාසිරි කතාකරන්න පටන්ගත්තෙ තව දුරටත් ආණ්ඩුවෙ ඉන්න හිතාගෙන නෙවෙයි.

''මට ඇමතිකම් ලොකු නෑ. හදවතට එකඟව වැඩකරන්න බැරි නම් මේ ඇමතිකමේ මොහොතක්වත් ඉන්න බලාපොරොත්තු වෙන්නේ නෑ. මම අදම මගේ ඉල්ලා අස්විම බාර දෙනවා. ඒත් මේ ව්‍යාපෘතියට විරුද්ධව කටයුතු කරන එක ඔබතුමාලට නතර කරන්න බෑ. මම මේ විනාශයට විරුද්ධව ජනතාව පෙළගස්වන එක නතර කරන්න පුළුවන් මගේ මරණයෙන් විතරයි.''

හතර වටින් එන බාධා කිරීම් මැද්දෙ කියපු සොබාසිරි රැස්වීම් ශාලාවෙන් එළියට ආවෙ ඉදිරියේදි කරන දේ ගැන තීරණයක් අරගෙන.

''එයත් එක උගත් මෝඩයෙක්. ලෝකෙටම ණයවෙලා එල්ලෙන්න වැල් නැතිව ඉන්න වෙලාවෙ මේ උගුලෙන් ගැලවෙන්න ලැබෙන අවස්ථාවෙත් පරිසරය ගැන කල්පනා කරනවා. මිනිස්සු ඕනැවට වැඩිය ඉගෙන ගත්තම වෙනදේ තමයි. මම කියන දේ මෙතන ඉන්න අනිත් උගත් මැති ඇමති වරුන්ට අදාල නෑ.''

අගමැතිවරයා කිව්වෙ සභාවේ හිටිය උගත් මැති ඇමතිවරු දෙස බලාගෙන.

''අගමැතිතුමා, පරිසරයට අනුව අනුවර්ථනය වෙන්න බැරි ජීවීන් වඳවෙලා යනවා කියලා චාල්ස් ඩාවින් කියල තියෙනවා. අපේ සොබාසිරි ඇමතිතුමාටත් සිදු වුණේ ඒක තමයි. එතුමාට උගත්කම තිබුණට ඒක දේශපාලනයට අනුව හැඩගස්සගන්න බැරිවුණා. ආණ්ඩුපක්ෂයේ ඉන්නව නම් ව්‍යාපෘතියකින් මොන හානිය වුණත් ඒක වහලා මේකෙන් වෙන හොඳ විතරක් ඉස්මතු කරන්න

පුළුවන් වෙන්න ඕනැ. විපක්ෂයේ ඉන්නව නම් ව්‍යාපෘතියකින් මොන යහපත වුණත් ඒක වහලා ඒකෙන් වෙන අයහපත විතරක් ඉස්මතු කරන්න පුළුවන් වෙන්න ඕනැ. ඒක තමයි දේසපාලනය කියන්නේ. ''

එහෙම කිව්වෙ ජාතික ලයිස්තුවෙන් පාර්ලිමේන්තුවට පත්වෙලා ඇමතිකමක් අරගත්ත මහාචාර්ය වරයක්.

''ඇත්තටම අපිට නම් එහෙම කරදරයක් නෑ. අපි අදහස් දක්වන්නේ ඡන්දය දෙන්නේ අපේ නායකතුමා කියන විදියටයි. එතුමා එකයි එකයි එකතු කළාම තුනයි කියනව නම් අපිත් කියන්නේ එකයි එකයි එකතු කළාම තුනයි කියලයි .''

සූරසේන එහෙම කියනකොට රැස්වීම් ශාලාවෙ හිටපු සැමදෙනාම හිනාවෙන්න පටන් ගත්තා.

''සොබාසිරිගෙ විකාර වැඩ නිසා අපේ සාකච්ඡාවත් නැවතුනා. මම කොතනින්ද නැවැත්තුවේ. ''

අගමැතිතුමා එයාගෙ කතාව පටන් ගන්න සූදානම් වුණා.

''හරි මේ ව්‍යාපෘතියෙන් අපේ රටේ පරිසරයට කිසිම හානියක් වෙන්නෙ නෑ කියලයි. දියුණු රටවලත් ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය බැහැර කරන ක්‍රමවේදයම තමයි අපේ රටේත් යෙදවෙන්නේ. මම මේ ව්‍යාපෘතිය ලංකාවට අරගන්න කොච්චර මහන්සි වුණාද? ඒ රටට මේ ක්‍රමවේදයට ඒ රටේදිම අඩු මුදලක් වැයකරලා අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කරන්න පුළුවන්කම තියෙද්දි මේ අවස්ථාව අපිට දුන්නේ අපේ රට පත්වෙලා ඉන්න තත්වය පැහැදිලි කරල දුන්නට පස්සෙයි. අපද්‍රව්‍ය වෙන්කරන කෙනෙකුට දවසකට රුපියල් දහදාහක් විතර හොයන්න පුළුවන්. එක පවුලක දෙන්නෙක් මේ ව්‍යාපෘතියට දායක වුණොත් ඒ පවුලට අපේ වැටුපට වඩා වැඩි මුදලක් හොයන්න පුළුවන්.

ඔබතුමාලට තියෙන්නේ ජනතාව අතරට ගිහින් මේ ව්‍යාපාතියෙන් රටට අත්වෙන වාසි ගැන ජනතාව දැනුවත් කරන එකයි. මේකෙන් රටම සුරපුරයක් වෙන බව පෙන්නන්න ඕනැ. ඒකට අපේ මහාචාර්ය මැති ඇමතිවරුන්ගේ උපරිම සහය ලැබෙයි කියල අපි බලාපොතේතු වෙනවා. ''

අගමැතිවරයා තම කතාව නිමකළේ කසල ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපාතිය ක්‍රියාත්මක කරවීමේ වගකීම මැති ඇමතිවරුන්ට පවරන ගමන්.

''මිනිස්සු අපි කියන දේවල් පිළිගනීද? සොබාසිරි දැනමත් වැඩ පටන් අරන් ඇති. පත්තරකාරයෝ, පරිසර සංවිධාන, විපක්ෂයේ අය එයාට එකතුවෙයි දෙයි. මිනිස්සුන්ට අපි කියන බොරු අහලා ඇතිවෙලා. අපි ඡන්ද කියකදි ලංකාව

සුරපුරයක් කරන්න පොරොන්දු වුණාද? සොබාසිරිව නවත්වන්නෙ නැතිව අපිට මේක කරන්න බැරිවෙනවා. ''

රණබාහුට ඕනකරල තිබුණෙ එයා දන්න ක්‍රමයට ප්‍රශ්නය විසඳන්න.

''මේ රට සුරපුරයක් කරන්න පොරොන්දු දුන්නේ අපි විතරක් නෙවෙයි. විපක්ෂයේ ඉන්න අයත් අපිත් එක්ක මාරුවෙන් මාරුවට මේ රට සුරපුරයක් කරන්න පොරොන්දු දුන්නා. සොබාසිරි පරිසරය විනාශ වෙනවා කියලා කෑගහන්න ගනියි. මුලදී එයාට සහයෝගය දෙන්න අය හිටියත් මේ ව්‍යාපෘතියෙන් සල්ලි ගහ හොල්ලන්න පුළුවන් කියලා පෙනුනම එයාට ඉතිරිවෙන්නේ විශ්ව විද්‍යාලවල ඉගෙනගන්න උන් විතරයි. එයාව නිහඬකරන්න මහන්සි වෙන්න ඕනැ නෑ. අපි මේක ක්‍රියාත්මක කරලා සල්ලි ගහ හොල්ලලා පෙන්වමු.''

එහෙම කියපු අගමැතිතුමා කුණු ගෙන්වන බෙදාහරින වැඩවලින් මුදල් ගලා එන හැටි විස්තර කරන්න වුණා.

****************************

ආණ්ඩු පක්ෂ රැස්වීමෙන් එළියට ආව සොබාසිරි කෙලින්ම ගියේ අමාත්‍යාංශ කාර්යාලයට. එයාගෙ පළවෙනි සහ අවසාන රාජකාරිය වූයේ ඉල්ලා අස්වීමේ ලිපිය සකස්කරන එකයි. තමන්ට ලැබුණු නිල නිවස හා නිල රථ ආපසු භාරදීමට කටයුතු කරපු සොබාසිරි කාර්යය මණ්ඩලය රැස්කරලා ඇමති ධූරයෙන් සහ මන්ත්‍රී ධූරයෙන් ඉල්ලා අස්වීමට තීරණය කළ බව කිවුවා.

''මීට සති කිහිපයකට උඩදි පරිසර හා කෘෂිකර්ම අමාත්‍යාංශයේ ඇමතිතුමා වශයෙන් වැඩ බාරගන්න කොට අපේ රට වෙනුවෙන් විශාල වැඩකොටසක් කරන්න පුළුවන් වෙයි කියලා මම බලාපොරොත්තු වුණා. අපේ රට අලුත් මාවතකට අරගෙන කෘෂිකර්මාන්තයෙන් රට දියුණු කරන සැලසුම් අපි හැමදෙනාම එකතුවෙලා සකස්කලා. ඒ සැලසුම් ක්‍රියාත්මක කරන්න උත්සහ ගත්තා. ඒත් මේ රජයත් එක්ක ඒ එක සැලැස්මක්වත් ක්‍රියාත්මත කරන්න බෑ. ඒ අයට පරිසරය රැකගැනීමේ වැදගත්කම තේරෙන්නේ නෑ. ඒ අයට ඕනැ බල්ලො මරල හරි සල්ලි හොයන්න. අපේ අද දවස වෙනුවෙන් අනාගත පරපුරේ හෙට දවස නැතිකරල දාන්න.

අද ආණ්ඩු පක්ෂ රැස්වීමෙදි ගෙන ආපු පරිසරයට හානිකර ව්‍යාපෘතියට හිතට එකගව සහයෝගය දෙන්න මට පුළුවන්කමක් නැති නිසා මම ඇමතිකමෙන් ඉල්ලා අස්වෙන්න තීරණය කළා. මම දැන් ඔයගොල්ලන්ගෙන් සමුගත්තට හෙට දවසේ රටට අහිතකර ව්‍යාපෘතිය පරාජය කරන්න සහය

ඉල්ලගෙන ඔයගොල්ලො ඉදිරියට එනවා. මගෙන් පස්සෙ මේ අමාත්‍යාංශය බාරගන්න ඇමතිතුමාටත් මට දැක්වූ සහයෝගය දක්වන ලෙස ඉල්ලා සිටිමින් මම ඔබ සැමගෙන් සමුගන්නවා.''

සොබාසිරි කාර්යාලයෙන් පිටතට එනතුරු බලාගෙන හිටිය නිලරථයේ රියදුරා වෙනද වගේ නිලරථය දොරටුව අසලට පදවාගෙන ආව. ආරක්ෂක පිරිසද එයාව අනුගමනය කලා.

''දැන් මට මේ වාහනවත් ආරක්ෂාවවත් අයිති නෑ. මම දැන් ඇමතිවරයෙක්වත් මන්ත්‍රීවරයෙක්වත් නෙවෙයි. මම දැන් සාමාන්‍ය මිනිහෙක්. මම පරණ පුරුදු විදියට ම බස් එකෙන් ගෙදර යන්නම්.''

''ස(ර්)ව තනියම යවන්න පුළුවන්ද? ස(ර්) වාහනේට නගින්න.''

රියදුරා එහෙම කිවුවත් එයා කතාකළේ හිතේ බයක් තියාගෙන බව සොබාසිරිට තේරුණා.

''මට උදව් කරන්න ගිහින් ඔයගොල්ලන්ගේ රස්සාව නැතිකරගන්න එපා.''

එහෙම කිවුව සොබාසිරි අමාත්‍යාංශයේ දොරටුවෙන් එළියට ආවා.

මීට පැයකට ඉස්සර ආරක්ෂකයන් පිරිවරාගෙන ආපු මම දැන් තනිවෙලා. ඒත් රට ගැන හිතන මිනිස්සු මාව තනිකරන එකක් නෑ. කොහොම වුණත් බස් එකෙන් යන එක හොඳ නෑ. මම ඉල්ලා අස්වෙච්ච බව දන්නේ ඔෆිස් එකේ අය විතරයි. වීල් එකක් ගන්නත් පාරට යන්න වෙනවා.........

වෙනදා පරිවාර රථ පිරිවරාගෙන ඉගිල්ලෙන සොබාසිරි ඉක්මන් ගමනින් ඇවිදගෙනගෙන ගියේ පාළු පාරෙ ගතකරන තත්පරයක කාලයත් මාරයාට ලබාදෙන අවස්ථාවක් බව දැනගෙන හිටිය නිසයි. ජනදාස ඒ වගේ දේවල් අනුමත නොකලත් එයාගෙ මැර මැති ඇමතිවරු මුදල් වෙන්වෙන් ඕනැම දෙයක් කරන්න පසුබට වෙන්නෙ නෑ. සල්ලි ගහ හොල්ලන්න පුළුවන් ව්‍යාපෘතියට එල්ල වෙන්න පුළුවන් විරෝධතාවය කෙටිම ක්‍රමයෙන් නතර කරන්න එක වෙඩි උණ්ඩයකට පුළුවන්. මිනිත්තු දහයක් පමණ ඇවිදගෙන යනකොට මහපාර පෙනෙන මානයට එන්න සොබාසිරිට පුළුවන් වුණා.

වෙනදා තත්පර දහයක ගමනට දැන් මිනිත්තු දහයක් යනවා. ඉස්සරහ වංගුව පහුකළ ගමන් පාරට යන්න පුළුවන්..........

ඒත් තවත් පියවර දෙක තුනකට වැඩිය පියවර මනින්න සොබාසිරිට පුළුවන් වුණේ නෑ. වේගයෙන් ආව මෝටර් සයිකලයක් සොබාසිරිව පහුකරල

ඉදිරියෙන් නතර කළේ හිතන්නවත් වෙලාවක් තියන්නෙ නැතුවයි. ඒ එක්කම වෑන් එකක් ක්‍රාස් ගාල කෑගහගෙන නතරවෙන සද්දෙ ඇහිල පසුපස්ස හැරිල බලපු සොබාසිරි දැක්කෙ පිටිපස්සෙන් නතර කරල තියෙන සුදු පාට වෑන් එකක්. විරෝධතා වලදි පෙලීසියෙ තුවක්කු වලට බය නොවී බැරියර් පෙරලගෙන ඉස්සරහට යන සොබාසිරිට එවෙලෙ නම් මරණ බය කියන්නෙ මොකක්ද කියල තේරුණා.

********************************** *

රජය නියෝජනය කරන උගත් මන්ත්‍රීවරු පක්ෂ රැස්වීමෙන් පස්සෙ වෙනම ම රැස්වෙලා කසල ප්‍රතිචක්‍රීකරන ව්‍යාපෘතිය සමාජගත කරන හැටි සාකච්ඡා කළා.

"සොබාසිරිත් නිකන් ඉන්න බැරිව දාන ලෙඩ. මිනිහ මේකට විරුද්ධ වුණේ නැති නම් අපිට මොන කරදරයක්වත් නෑ. දැන් ඉතින් ටී. වී එකටයි මාධ්‍ය සාකච්ඡවලටයි පලයන්කො."

රාජ්‍ය පරිපාලන ඇමතිධූරය දරන කාරියකරවන මහත්තය එහෙම කිව්වෙ කේන්තියෙන් වගෙයි.

"මිනිහා තවමත් විප්ලවයෙ හීන දකිනවා. කැම්පස් එකෙන් පිටට එනකොට සමාජවාදයයි, විප්ලවයයි හිතෙන් අයින් කරගන්න ඕන බව ඒකාට තේරෙන්නේ නෑ. දැන් හොඳට ජීවත් වෙන්න නම් අවස්ථා වාදය තියෙන්න ඕනැ. බැරිවෙලා හරි ඊළඟ ඡන්දෙකදි ආණ්ඩුව අනිත් පැත්ත ගැහුවොත් ඒ පැත්තට පනින්න බලාගෙන ඉන්න ඕනැ."

"පිස්සු කතාකරන්න එපා මේක හරි ගියොත් අවුරුදු විස්සකටවත් මේ ආණ්ඩුව වට්ටන්න සක්කරයගෙ පුතා වයිමටවත් බෑ. ඒත් ඔය කොන්ක්‍රීට් බහාලුම් හදන්න පොළොවෙ ඉඩ නැතිවුණ දාට අපිට අකුලගෙන යන්න වෙනවා."

"ඇත්තටම එහෙම තත්වයක් ඇතිවේවිද? එක බහාලුමකට වැයවෙන්නේ වර්ග මීටර් නවයයි. බහාලුම් දෙකක් අතර මීටර් දෙකක ඉඩක් තිබ්බත් වර්ග මීටර් දාසයයි. වර්ග කිලෝමීටරයක බහාලුම් හැට දෙදාහක් දාන්න පුළුවන්."

"ඒ වුණාට අපේ මිනිස්සුන්ව සල්ලි හම්බුවෙන කොට මාලිගාවල් වගේ ගෙවල් හදන්න ගනීවි, එක ගෙදරකට වාහන දෙක තුන අරගනීවි. එතකොට ඒ වැඩිවෙක වාහන වලට හරියන්න පාරවල් ලොකු කරන්න වෙනවා. බහාලුම් වලට ඉඩක් නැතිවෙනවා."

“එහෙම තත්වයක් ඇතිවෙයි නම් අපිට තියෙන්නේ ඊට ඉස්සර පුළුවන් තරම් හම්බ කරගෙන රට පනින්නයි.”

එතන හිටපු මැති ඇමතිවරු කාලයන්ත්‍රයෙ නැගලා අනාගතයට ගමන් කළා. කාරියකරවන ඒ අයව වර්තමානයට අරගෙන ආවා.

“හම්බ කරන්නයි රට පනින්නයි හිතුවට ඊට ඉස්සර මේක ගොඩදාගන්න ඕනැ. ලොක්ක වැඩි බරක් දැම්මි අපේ කර උඩට. අද රෑට ටී වී එකේ මේ ගැන වැඩසටහනකටත් යන්න තියෙනවා නේද? .”

“ඒක ආණ්ඩුවෙ චැනල් එකක් නිසා බයවෙන්න එපා. නිවේදකයා අහන ප්‍රශ්න ටිකත් දෙන්නේ අපිමනේ. අපිට තියෙන්නේ පාළු ගෙයි වලං බිදිනවා වගේ අපේ ප්‍රශ්න වලට අපිම උත්තර දෙන්න. ඒත් බැරිවෙලාවත් මේ අලුත් ව්‍යාපෘතිය ගැන සොබාසිරියත් එක්ක වාදෙකට එහෙම කැමතිවෙන්න එපා. අපිට කලිසම ඔළුවෙ ඔතාගෙන තමයි එන්න වෙන්නේ. කැම්පස් කාලෙ සොබාසිරියත් එක්ක වාද කරල දිනපු එකෙක් නෑ.”

වෙද ආරච්චි අනිත් අයගේ දිහා බලාගෙන කිවුවා. එතන හිටිය හැමදෙනාගෙම මතය වුණේ සොබාසිරිත් එක්ක වාදෙකට ගිහින් දිනන්න බෑ කියන එකයි

*****************************

සොබාසිරි වටපිට බැලුවේ වටපිටාවෙ කවුරුහරි ඉන්නවද කියලයි. ඒ වෙලාවෙ ජේන හරියක කවුරුවත් හිටියෙ නෑ. කවුරුහරි හිටියත් අහක යන කුණු ගොඩවල් වලට අත දාල ජීවිතයෙන් වන්දි ගෙවන්න ඉදිරිපත් වෙන්නෙ නැති බව සොබාසිරිට මතක් වුණා. සටන පටන්ගන්නත් ඉස්සර සටන් බිමෙන් විතරක් නොව ජීවිතයෙන්ද සමුගත්ත සටන්කාමීන්ව සොබාසිරිගෙ මතකයට ආවා.

දැන් කරන්න තියෙන්නේ නොදන්න වගේ ඉස්සරහට ඇවිදගෙන යන එකයි........

එහෙම හිතපු සොබාසිරි අමුත්තක් නොදක්වා ඉදිරියට ඇවිදගෙන යන්න හැදුවා. ඒත් එයාට මෝට(ර්)සයිකලය පසුකරගෙන යන්න ලැබුණෙ නෑ. මෝට(ර්)සයිකලේ පිටුපස්සෙ වාඩිවෙලා හිටිය තරුණයා ඒකෙන් බිමට බැහැල සොබාසිරිට ඉදිරියට යන්න බැරිවෙන විදියට පාර අහුරාගෙන හිටගත්තා.

“ස(ර්) මොකද මේ පයින්ම.”

එයා ඇහුවෙ පාර අවහිර කරමින්. ඒකට දෙන්න ඕන උත්තර සොබාසිරිගෙ හිතට ගලා එන්නට වුණා.

ප්‍රජාතන්ත්‍රවාදී රටක ඇමති කෙනෙකුට පයින් යන්න නිදහසක් නැද්ද?..අපිට ඇවිදින්නවත් වෙලාවක් නැති නිසා පයින් යනවා....වාහන වලට තෙල් ගහන්නවත් ආණ්ඩුවට සල්ලි නෑ.......

මේ වගේ උත්තර සිතට ආවත්

"මම ඇමතිකමෙන් ඉල්ලා අස්වුණා. හිතට එකඟව තවත් ආණ්ඩු පක්ෂයේ ඉන්න පුළුවන් කමක් නෑ. මට කරදර කරන්න එපා. මගේ පාඩුවේ ඉන්න දෙන්න."

කියල කියවුණේ මේ අයව තරහ ගස්වන්නෙ නැතිව මෙතනින් පැනගන්න හිතාගෙන.

"ස(ර්) ආණ්ඩු පක්ෂයෙන් අයින්වෙන්න හේතුව මොකක්ද? ."

ඒකට පිළිතුරු දෙන්න ඉස්සර පිටිපස්ස හැරීල බලපු සොබාසිරි දැක්කෙ තමා දෙසට එල්ලවෙලා තියෙන වීඩියෝ කැමරා කිහිපයක්.

මම බොරුවට බය වුණේ මේ ටී වී චැනල් එකක කට්ටියක් වගේ. මම කරන්න හිතාගෙන ඉන්න දේ දැන්ම එළියට දාන්න හොඳ නෑ.....

"ඉල්ලා අස්වෙන්න හේතුව ගැන දැන්ම අදහස් දක්වන්නේ නෑ. ඉදිරියේදි මාධ්‍ය සාකච්ඡාවක් තියලා ඉල්ලා අස්වෙන්න හේතුව පැහැදිලි කරන්නම්."

"ස(ර්) පයින් යන්න එපා. අපි ස(ර්)ව ගෙදරට ඇරලවන්නම්."

මොටර්සයිකලය පදවාගෙන ආව තරුණයා සොබාසිරිට බාධා කරමින් කිවුවා. ඒ කටහඬ අහල පුරුදු එකක් වුණත් ඒක අඳුන ගන්න තරම් මානසික තත්වයක සොබාසිරි හිටියෙ නෑ.

"නෑ මම ආව වගේම ඉතිරි ටිකත් ගිහින් වීල් එකක් අරගන්නම්."

සොබාසිරිගෙ හිතේ තිබ්ච්ච බය තාම ඉතුරුවෙලා තිබුණා.

"මට පේන්නේ ස(ර්) බයවෙලා. බයවෙන්න එපා මම සාගර."

මෝට(ර්)සයිකලයේ හිටපු තරුණයා දාගෙන හිටපු හෙල්මට් එක ගලවන ගමන් කිවුවා.

“සාගර! බය නොවී පුළුවන්ද? දැන් වෙන දේවල් වල හැටියට. මම හොඳටම බයවුණා. මාව ගෙදරට ඇරලවන්න නම් කිලෝමීටර් සිය ගාණක් යන්න වෙනවා. මේ මහා නගරයේ මට යන්න කියල තැනක් නෑ. ඒත් ගෙදර ගිහින් බෑ. කරන්න වැඩ සෑහෙන්න තියෙනවා. ඉදිරියේදි අපේ රටට ලොකු අනතුරකට මුහුණපාන්න වෙනවා.”

“අපි යන ගමන් කතාකරමු.”

මෝට(ර්)සයිකලය යාළුවට දුන්න සාගර වෑන්රථයට ගොඩවුණා. අසරණව ඉන්න මොහොතේ විශ්වාස වන්ත කෙනෙක් හම්බවෙච්ච එක ගැන සොබාසිරිගේ හිතේ ලොකු සතුටක් ඇතිවුණා. එයා පක්ෂ රැස්වීමේදී සිදුවුණ හැම දෙයක්ම සාගරට කිව්වෙ හිත සැහැල්ලු කරගන්නත් එක්කයි.

“ඉල්ලා අස්වුණාට පස්සෙ නිල වාහන නිල නිවාස වල අයිතියක් මට නෑ. නවතින්න තැනක් හොයාගෙන මගේ පොත් පත් ටිකයි ඇඳුම් ටිකයි අරගෙන එන්න ඕනැ. තව පොඩ්ඩෙන් අමතක වෙනවා. මගේ පරණ කාර් එකත් තියෙනවා.”

“ස(ර්) ස(ර්)ට මගේ කාමරේ නවතින්න පුළුවන්. හැබැයි ඉතින් නිල නිවාසවල වගේ පහසුකම් නෑ.”

“සාගරත් මට විහිළු කරනවා. මට ගහක් ගලක් උඩ වුණත් ඉන්න පුළුවන් බව සාගර දන්නවනෙ. දන්නැති තැනක ඉන්නවට වැඩිය දන්න කෙනෙක් ළඟ ඉන්න එක හොඳයි. තවම ඉන්නෙ පරණ නවාතැනේමද? .”

“ඔව්, ස(ර්) ගිහින් මාස දෙකක් යනකොට මට ජොබ් එකක් හොයාගන්න පුළුවන් වුණා. මාසෙ ගානෙ කුලිය ගෙවන්න අයිතිකාරයව කැමති කරගත්තා.”

“සාගර මහත්තයා සොබාසිරි ස(ර්)ගෙ බංගලාව තියෙන්නෙ කොහේද.?”

වෑන් රථයේ රියදුරා සාගරගෙ කතාවට බාදා කරමින් ඇහුවා.

“අපිව ඉස්සරහ ත්‍රීවීල් පාක් එක ගාවින් බස්සවලා ඔයගොල්ලො ඔෆිස් එකට යන්න. මම තව තොරතුරු ටිකක් හොයාගෙන හවස හතර වෙන්න ඉස්සර එනවා කියන්න.”

*********************

ඇමති මන්දිරය ඉස්සරහ නතර කරපු ත්‍රීවීල් එකේ සද්දෙ ඇහිල ගේට්ටුවෙ හිටිය ආරක්ෂකයා පුදුම වුණා.

ඇමතිතුමා හම්බවෙන්න ත්‍රීවීල් වලින් එන්නෙ කවුද? පාර වැරදිලා ආපු එකක් වෙන්න ඇති... ඇමතිතුමාගෙ අම්ම තාත්තා පුතාව බලන්න ආවද දන්නෙ නෑ. මෙයා ඇමතිකම් කළාට අම්මල තාත්තලා පිටිසර අය. කෝකටත් පොඩ්ඩක් බැලුවොත් හොඳයි.............

එහෙම හිතපු ආරක්ෂකයා පිරික්සුම් කවුළුව අස්සෙන් පාර දිහා බැලුවා. ත්‍රීවීල් එකෙන් බිමට බහින කෙනාව දැක්ක එයාට කතාකරගන්නවත් බැරිවුණා.

මේ මොකද ඇමතිතුමා තනියම, ඒ මදිවට වීල් එකක ඇවිත්...........

මම හීනයක් දකිනවද? මේකත් වෙන්න පුළුවන්ද? ඇමතිතුමා වීල් එකකින් ඇවිත්. කෝ එතකොට ගාඩ් එක....

ආරක්ෂකයව කරකවල අතෑරිය වගේ. උතුර දකුණ හොයාගන්න බැරිවෙච්ච එයාට ගේට්ටුව අරින්නවත් අමතක වුණා. මිනිහට හොඳ සිහිය ආවෙ සොබාසිරි කතාකරන හඬින්.

“ගේට්ටුව අරිනවද වීල් එක ඇතුළට ගන්න ඕනැ.”

“ඇමතිතුමා මට සමාවෙන්න. එකපාරටම විස්වාස කරන්න බැරිවුණා. අනේ මට සමාවෙන්න.”

එහෙම කියපු ආරක්ෂකයා ගේට්ටුව විවෘත කළා.

“ඔයාට බයවෙන්න හේතුවක් නෑ. මම දැන් ඇමතිවරයෙක් නෙවෙයි. මම ආවෙ මගේ ඇඳුම් ටිකයි පොත් පත් ටිකයි අරගෙන යන්න.”

“කාර් එක තියෙන නිසා වීල් එක ආපහු යවමු.”

සාගර කිව්වෙ ගරාජ් එකේ නතර කරල තිබ්ච්ච කාර් එක දිහා බලාගෙන.

“වීල් එක ආපහු යවන්න ඉස්සර කාර් එක ස්ටාට් වෙනවද කියලා බලන්න ඕනෑ. ඒක මාස ගාණකින් එළියට ගත්තෙ නෑ.”

**************************************

“ස(ර්) ළඟ ගොඩක් පොත් තියෙනවා. මේවා පිළිවෙලකට තියාගන්න මගේ කාමරයේ නම් ඉඩක් නෑ.”

සාගර කබඩ් එක පුරෝල තියෙන පොත් දැකලා කිවුවා.

“ඔය තියෙන්නේ මගේ ජීවිත කාලෙදි හම්බු කරපු ඒව තමයි. මෙහේ ඉඩ තියෙන නිසා ගෙදර තිබ්ච්ච පොත් ටිකත් මෙහාට ගෙනාවා.”

පොත් ටිකයි ඇඳුම් ටිකයි කාර් එකට පටව ගත්තු සොබාසිරි නිලනිවසට සමුදීල මහමඟට ආවා.

"සාගරට කොහොම ස්තුති කරන්නද මන්දා? ඉන්න හිටින්න තැනක් නැතිව අසරණ වුණු මට පිහිට වෙච්ච එකට. අපි මුණගැහුනේ කොච්චර කාලෙකට පස්සෙද? අම්ම තාත්ත එහෙම සනීපෙන් ඉන්නවද?"

"මට යන්න එන්න තැනක් නැතිව ඉන්නකොට ස(ර්)ගෙ කාමරේ නවාතැන් දුන්නා. දැන් මම ස(ර්)ට නවාතැන් දෙනවා. අම්මලට කියන්න වරදක් නෑ. අයියා ඉතාලියට පැනගත්තා. එයා හදන්නේ අම්මවයි තාත්තවයි එහාට ගෙන්ව ගන්න."

"ඉතින් සාගරටත් යන්න පුළුවන්නෙ."

"මම රට යනව නම් මෙලහටත් ගිහින්. කාර් එක දොර ගාවටම කරල නවත්වන්න."

දෙන්නත් එක්ක එකතුවෙලා ගෙනාපු බඩුටික ගේ ඇතුළට අරගත්තා.

"මම කියපු විස්තර ඔක්කොම එළියට දමන්න එපා. දැනට ඉල්ලා අස්වෙච්ච බව විතරක් දමන්න. ඉල්ලා අස්වෙන්න හේතුව හෙට ප්‍රවෘත්ති සාකච්ඡාවෙදි එළිදරවු කරන බව කිවුවට කමක් නෑ. ඒත් ප්‍රවෘත්ති සාකච්ඡාව තියන්නෙ කොහේද? ප්‍රවෘත්ති සාකච්ඡාව තියන තැන කියන්නෙ නැතිව ඒ නිවුස් එකෙන් වැඩක් නෑ."

සාගර පිටත්වෙලා යන්න හදනකොට සොබාසිරි කිව්වෙ තොරතුරු එළියට යන එක අවාසි නිසයි.

"ප්‍රවෘත්ති සාකච්ඡාව තියන්න තැනක් සූදානම් කරලා ඒ ගැන නිවුස් එක දාන්නම්. මම එනකොට ටිකක් රෑ වෙයි. ස(ර්) තනියම එළියට යන්න එපා. එනකොට කෑම අරගෙන එන්නම්."

එහෙම කිව්ව සාගර බයික් එකට නැගල පිටවෙලා ගියා..

සාගරත් පුදුම ළමයෙක්, සිවිල් ඉංජිනියරින් කරලා ටී වී චැනල් එකක වාර්ථාකාරයෙක් හැටියට රස්සාව කරනවා. මම එහෙම හිතුවට දැන් ඉදිකිරීම් ක්ෂේත්‍රය එහෙම පිටින්ම කඩාවැටිලා. මෙයත් මම වගේ තමයි, උපන් රට දාල යන්න හිතදෙන්නෙ නෑ. නැති නම් පිටරටකට ගිහින් හොඳ ජොබ් එකක් කරනවා ......

මම අද දවස පටන්ගත්තේ ඇමතිකෙනෙක් හැටියට. ඡන්දයේදී ඉදිරිපත් කරපු දේ ක්‍රියාත්මක කරන්න මම සිහින දැක්කා. මගේ ආරක්ෂාවට වාහන කීයක් තිබුණද? කී දෙනෙක් හිටියද? ඒත් දැන්, දැන් මම ඉන්න හිටින්න තැනක් නැති අසරණයෙක්. මේ ඔක්කොම අතැරලා ගමට ගිහින් තාත්තත් එක්ක ගොවිතැනක් කරගෙන ඉන්න හිතෙනවා. ඒත් මේ ව්‍යාපාතිය පටන්ගත්තොත් අපිට රටක් ඉතුරු වෙන්නෙ නෑ. ඉතුරුවෙන්නේ කාල බෝම්බ වගේ කොයි වෙලාවෙ අනතුරක් කරයිද දන්නෙ නැති විෂ පිරුණු කොන්ක්‍රීට් කුට්ටි ටිකක් විතරයි. හෙට ප්‍රවෘත්ති සාකච්ඡාවෙදි මොනවද කියන්නේ. හොඳට සැලසුම් කරලා අදහස් දක්වන්න ඕනෑ. ආණ්ඩුවට කිසිම තුරුම්පුවක් ඉතිරි නොකර පටන් ගන්න ඕනෑ. මේකෙන් රටේ පරිසරයට වගේම නිෂ්පාදන වලට, අධ්‍යාපනයට වෙන්න පුළුවන් බලපෑම පෙන්වලා දෙන්න ඕනෑ.

ප්‍රවෘත්ති සාකච්ඡාවේදි ඉදිරිපත් කරන කරුණු සකස්කරමින් හිටපු සොබාසිරිට නොදැනුවත්වම නින්ද ගියා.

සාගර නවාතැනට එනකොට සොබාසිරි මේසයට ඔළුව තියාගෙන නිදාගෙන හිටියා.

ස(ර්)ට නින්ද ගිහින්. මේ මොනවද ලියලා තියෙන්නේ. හෙට ප්‍රවාත්ති සාකච්ඡාවෙදි ඉදිරිපත් කරන ඒවද? ස(ර්)ගෙ අකුරු ස(ර්)ටවත් කියවන්න පුළුවන්ද මන්දා................

සාගර මේසෙ උඩ තිබ්ච්ච කඩදාසිවල ලියල තියෙන ඒව කියවන්න වුණා.

මේ අදහස් ඔක්කොම ඇත්ත. ඒත් මේ ව්‍යාපෘතියෙන් රටේ නිෂ්පාදන ක්‍රියාවලිය අඩපණ වෙනවා කියලා කිවුවොත් අපිට අවාසියි. ඒකෙන් මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙනකොට වෙන කිසි දෙයක්න් හොයන්න බැරි ආදායමක් ලැබෙන බව තහවුරු වෙනවා...................

"ස(ර්) නැගිටින්න, දැන් රෑ දහය විතර වෙලා. මම ප්‍රවෘත්ති සාකච්ඡාවට ඔක්කොම ලැහැත්ති කළා. අපේ චැනල් එකේ හෙඩ් ලයින් එකට ගියෙත් ස(ර්) ආණ්ඩුවෙන් ඉල්ලා අස්වෙච්ච එක ගැනයි."

"එහෙ නම් මම පැය තුනක් විතර නිදාගෙන තියෙනවා. හෙට සාකච්ඡාවෙදි ඉදිරිපත් කරන කරුණු වල නෝට් එකක් හැදුවා, සාගර ඒක කියවලා හොඳද බලන්න."

"මම ඒක කියෙවුවා, ඒත් මේ ව්‍යාපෘතියෙන් රටේ නිෂ්පාදන ක්‍රියාවලිය අඩපණ වෙන බව කියන්න ගියොත් අපිට අවාසියි."

“සාගර කියන්නේ මේකෙන් රටේ නිෂ්පාදන ක්‍රියාවලියට වෙන බලපෑම පෙන්වා දෙන්න එපා කියලද? මේ ව්‍යාපෘතිය පටන්ගත්තොත් කිසිම කෙනෙක් කෘෂි කර්මාන්තයේවත් කර්මාන්ත වලවත් යෙදෙන එකක් නෑ. ඊට වැඩිය ආදායමක් ලැබෙන, කුණු තෝරන එකට හැමදෙනාම යන එක නවත්වන්න බෑ. ඒකෙන් රටේ කෘෂි කර්මාන්තය, අනෙක් කර්මාන්ත ඔක්කොම බිඳවැටෙනවා. රට වටේම මුහුදක් තියාගෙන ලුණු කැටේ ඉඳන් පිටරටින් ගෙන්වන්න වෙනවා.”

“අපි දැනටත් ඉන්නේ ඒ වගේ තත්වයකනේ. රට වටේ මුහුදක් තියාගෙන කරවල පිටරටින් ගෙන්වනවා මේ රටට හෙණ ගහල ගියත් මුදල් ලැබෙනව නම් අපේ මිනිස්සුන්ට කමක් නෑ. මේ ව්‍යාපෘතියෙන් අනෙක් හැමදේටම වැඩිය සල්ලි හොයන්න පුළුවන් බව අපි කියන්න ගියොත් වෙන්නේ ආණ්ඩුවට ඔක්සිජන් දෙන එක. මම නම් කියන්නේ මේකෙන් වෙන්න පුළුවන් පරිසර විනාශය ගැන දැනුවත් කරමු කියලයි. බැර ලෝහ නිසා ඇති වෙන රෝග ගැන වීඩියෙ පෙන්වන්න පුළුවන්.”

හෙට මාධ්‍ය සාකච්ඡාවට ඉස්සර ඒ තොරතුරු හොයාගන්න එක අමාරුවෙයි. අනෙක ප්‍රොජෙක්ටරයක් නැතිව ඒව පෙන්වන්නෙ කොහොමද?.”

“තොරතුරු හොයාගන්න එක එච්චර අමාරු නෑ. ඉන්ටනෙට් එකෙන් බැර ලෝහවලින් හැදෙන ලෙඩ ගැන තොරතුරු ඇති. මාධ්‍ය සාකච්ඡාවෙදි ඒවා ලැප් එකෙන් පෙන්නන්න පුළුවන්.”

“පිටරට කුණු අපේ රටට ගෙන්වන එකට විරුද්ධව ගෙනියන විරෝධතාව මේ මාධ්‍ය සාකච්ඡාවෙන් නවතින්නෙ නෑ. මේකට විරුද්ධව ලංකාව පුරාම රැස්වීම් තියලා මිනිස්සු දැනුවත් කරන්න ඕනැ. එතකොට තමයි අපිට මේ විනාශය නවත්වන්න පුළුවන්. ඔය වීඩියෝ ඒ රැස්වීම් වලදි පෙන්වමු. අපි ළඟ තියෙන තුරුම්පු එක පාර බිම දාන්න හොඳ නෑ. පිටරටින් ගේන අපද්‍රව්‍ය දිහා නො බලන තරමට ඒවයින් වෙන්න පුළුවන් විනාශය ගැන මිනිස්සුන්ව දැනුවත් කරන්න ඕනැ.”

සොබාසිරි ඇමතිතුමා ඇමතිධුරයෙන් ඉල්ලා අස්වෙච්ච එක ගැන රට තුළ විවිධ මත පලවෙන්න පටන් ගත්තා. ඒක ඉල්ලා අස්වීමට හේතු දක්වමින් පැවැත්වීමට නියමිත ප්‍රවෘති සාකච්ඡාව ගැන උනන්දුව වැඩිකරන්න හේතු වුණා. සොබාසිරිගේ ඉල්ලා අස්වීම විපක්ෂය අර්ථ දැක්වුවෙ රජයේ කඩාවැටීමෙ පෙරනිමිත්තක් විදියට යි. සොබාසිරි අස්වෙච්ච එක ආණ්ඩු පක්ෂය තුළත් සාකච්ඡාවට ලක්වෙන මාතෘකාවක් වුණා.

**********************

"ධනවර්ධන ඇමතිතුමා අන්න සොබාසිරිය වැඩ පටන්ගන්න හදන්නේ. ඕක දැන් මේ වැඩේ නො කෙරෙන තැනට වැඩ කරයි. පරිසර සංවිධාන ටිකක් අල්ලගෙන පිටරටින් ගේන කුණු දිහා නො බලන තරමට මිනිස්සුන්ව බයකරයි. කෙහෙද ලොක්ක අපි කියනදේ අහන එකක්යෑ. සොබාසිරියව අයින් කරලා දැම්ම නම් ගේම නිකන්ම ගොඩ."

රණබාහු මුදල් ඇමතිවරයා හමුවෙලා එහෙම කිව්වෙ සොබාසිරි කරලියෙන් අයින් කරල දාන එක එයාගෙ මාර්ගයෙන් හරි අනුමත කරගන්න හිතාගෙන.

"මටත් ආරංචියි, මිනිහ දැනටමත් මාධ්‍ය සාකච්ඡාවක් සූදානම් කරලා. මමත් අගමැතිතුමාගෙන් මිනිහව අයින් කරල දාන එක ගැන ඇහුවා. අගමැතිතුමා කියන්නේ හදිස්සි නැතිව ඉන්න කියලයි. මේක ගොඩගන්න විදියක් අගමැතිතුමා ළඟ ඇති. සොබාසිරි මේකෙන් වෙන්න පුළුවන් පරිසර හානිය ගැන කියන්න ගහයි. අපි ඊට වැඩි සද්දයක් දාල මේකෙන් පරිසර හානියක් වෙන්නෙ නෑ කියලා කියමු. අපි ළඟත් මහාචාර්ය වරු ආචාර්යවරු ඕනෑ තරම් ඉන්නවා. සල්ලි ටිකක් වීසි කරන කොට ඕනෑ තරම් කට්ටිය හොයාගන්න පුළුවන්."

"අන්න හරි ඇමතිතුමා ඕලෙවල් පාස් නැතත් මටත් ආචාර්ය කමක් තියෙනවා. සොබාසිරියට මොනවද කරන්න පුළුවන්. එයාට අපිට වගේ වීසිකරන්න සල්ලි තියෙනවයෑ."

***********************

ආණ්ඩු පක්ෂයෙන් අයින් වෙන්න හේතු දක්වමින් සොබාසිරි පවත්වන මාධ්‍ය සාකච්ඡාව සාර්ථක කරගන්න ඕනෑ කරන හැමදේම සාගර කරල තිබුණා. මාධ්‍ය සාකච්ඡාව ආවරණය කරන්න පරිසරවේදීන් සහ දෙස් විදෙස් මාධ්‍ය වේදීන් රැසක් සහභාගි වෙච්ච එක සොබාසිරිගේ සතුටට හේතුවුණා.

"ඊයෙ වනතුරු ආණ්ඩුව නියෝජනය කරන ඇමති කෙනෙක් මන්ත්‍රී කෙනෙක් හැටියට හිටියට මම අද වෙනකොට මේ ආණ්ඩුවත් එක්ක කිසිම බැඳීමක් නැති ස්වාදීන පුද්ගලයෙක්. ආණ්ඩුවෙන් ඉල්ලා අස්වෙන්න හේතුව මම නො කිවුවට හැම දෙනාම දන්නව ඇති. රට වැටිල තියෙන අර්බුදයෙන් ගොඩ එන්න යෝජනා කරන පිටරට ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය ප්‍රත්චක්‍රීකරණ වැඩපිළිවෙළට පරිසර ඇමතිවරයා හැටියට එකඟ වෙන්න බැරි නිසා මම මේ ආණ්ඩුවෙන් ඉවත් වෙන්න තීරණය කළා. මම දේශපාලනයට ආවේ අපේ රටට සේවයක් කරන බලාපොරොත්තුවෙන්.........."

ප්‍රවෘත්ති සාකච්ඡාව ආරම්භ කරමින් සොබාසිරි කිවුවා.

“ඔබතුමාට ඉල්ලා අස්වෙන්නේ නැතිව පාර්ලිමේන්තුව ඇතුළේ ඉඳලම මේ ව්‍යාපෘතියට විරුද්ධව කටයුතු කරන්න හැකියාව තියෙද්දි ඉල්ලා අස්වෙන්න තීරණය කළේ මොකද? ඔබතුමා හදන්නෙ මේ ව්‍යාපෘතියට විරුද්ධවෙලා දේශපාලන වාසි ලබාගන්න. අද වෙනකොට පරිසර ප්‍රශ්න ගැන කතාකරන එක ජාතිවාදයට වඩා ඡන්ද ගන්න පුළුවන් ක්‍රමයක්.”

එහෙම ඇහුවෙ ආණ්ඩුවෙ ටී. වී චැනල් එකක මාධ්‍යවේදියෙක්.

“මම මහජන ඡන්දයෙන් පත්වෙච්ච මන්ත්‍රී කෙනෙක් වුණා නම් ඒ වගේ තීරණයක් ගන්න තිබුණා. ජාතික ලයිස්තුවෙන් පත්කරපු මන්ත්‍රී කෙනෙක් හැටියට මට ආණ්ඩුව ඇතුළෙ ඉඳගෙන මගේ විරෝධතාව දක්වන්න බෑ. පරිසරයට විනාසයක් වෙනකොට ඒකට විරුද්ධ වෙන එක දේශපාලන වාසි ගන්න කරන එකක් හැටියට අර්ථදක්වන එක අසාධාරණයි.”

“නමුත් මාධ්‍යයෙන් ප්‍රචාරය කරන විදියට මේ ව්‍යාපෘතියෙන් රටට හානියක් වෙන්නේ නෑ. දියුණු රටවලත් ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කරන්නේ මේ ක්‍රමවේදයටයි.”

“අපේ රට ලෝකයට කොච්චර ණය වුණත් අපිට සරුසාර පොළොවක් ඉතුරුවෙලා තියෙනවා. මේ ව්‍යාපාතිය කළොත් අපිට ඒ සරුසාර භූමිය නැතිවෙනවා. ඔය අපද්‍රව්‍යවල ජීවීන්ට අහිතකර රසදිය, ආසනික් වගේ බැරලෝහ අඩංගු වෙනවා. එක කොන්ක්‍රීට් බහාලුමක් හරි පලුදු වුණොත් වර්ග කිලෝමීටර් ගණනක භූගත ජලය අපවිත්‍ර වෙනවා. ඒ ප්‍රදේශයේ වැවෙන කිසිම දෙයක් ආහාරයට ගන්න සුදුසු නෑ. අපිට අනුන්ගේ කුණු ගෙනල්ලා රටේ අනාගතය විනාශ නො කළට කෘෂි කර්මාන්තයෙන් රට දියුණු කරන්න පුළුවන්. යුරෝපීය ජාතිකයන් අපේ රට යටත්කරගෙන අපනයන බෝග වලින් විශාල ආදායමක් ලැබුවා. ආණ්ඩුව මොන ප්‍රචාරය ගෙන ගියත් මේ ගේන්න හදන්නේ අපේ රට විනාශ කරන කාල බෝම්බ. රටේ අනාගත පරපුර වෙනුවෙන් ඒකට විරුද්ධවෙන එක අපි හැමෝගෙම යුතුකමක්. මේ විනාශයට විරුද්ධව රටපුරාම ජනතාව දැනුවත් කිරීමේ රැස්වීම් මාලාවක් පවත්වන්න අදහස් කරගෙන සිටිනවා. මේ විනාශය වලක්වන්න රටට පරිසරයට ආදරයක් තියෙන හැමදෙනාගෙම සහයෝගය අපි බලාපොරොත්තු වෙනවා.”

මාධ්‍ය සාකච්ඡාව අවසානයේදි මෙම පරිසර විනාශය වලක්වන්න ගෙනයන වැඩපිළිවෙලට බොහෝ මාධ්‍ය ආයතන සහ පරිසර සංවිධාන වල සහයෝගය පලවුණා.

සොබාසිරි අලුත් ව්‍යාපෘතියට විරුද්ධව කටයුතු කරද්දි අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතිය ජනතාව අතරට ගෙනයන ආකාරය සාකච්ඡා කරන්න ආණ්ඩුපක්ෂයේ ක්‍රියාකාරී මන්ත්‍රී පිරිසක් අතර සාකච්ඡාවක් අගමැතිතුමාගෙ ප්‍රධානත්වයෙන් පැවැත්වුණා.

"අපේ ප්‍රචාරණ කටයුතු තවත් වැඩිකරන්න වෙනවා. සොබාසිරි මාධ්‍ය සාකච්ඡාවත් තියලා. මිනිහ ළඟදිම වැඩ පටන් ගනියි. අපි හැමදෙනාම එකතුවෙලා මේ ව්‍යාපෘතිය ජනතාව අතරට ගෙනියන්න කටයුතු කරන්න ඕනැ. විපක්ෂයේ සහයෝගයත් අපිට ලබාගන්න පුළුවන්."

අගමැතිවරයා කිව්වෙ සාකච්ඡාව ආරම්භ කරමින්.

"එහෙම නම් අපේ වැඩට බාධා කරන්න කවුද ඉන්නේ. සොබාසිරි ලංකාවෙම ඉන්න මිනිස්සු එකතු කරගත්තත් පාර්ලිමේන්තුවේ බලය අපිට තියෙනවා. විපක්ෂයත් අපිත් එක්ක නම් ඕනැ පනතක් හදාගෙන සම්මත කරගන්න පුළුවන්. ජනාධිපතිටවත් තව අවුරුදු හතර හමාරක් යනතුරු පාර්ලිමේන්තුව විසුරුවන්න බෑ."

මුදල් ඇමති ධනවර්ධන මහත්තය කිව්වෙ කවුරු මේ ව්‍යාපෘතියට විරුද්ධ වුණත් ප්‍රශ්නයක් නෑ කියන්න වගේ.

"එතුමා ඒ වගේ දෙයකට අත දාන්නෙ නෑ. එයාට තව මාසයකට වැඩිය ඉන්න බෑ."

අගමැතිවරයා නියම තත්වය පැහැදිලි කරදුන්නා.

"කොහොම වුණත් සොබාසිරිට වැඩිය දඟලන්න දෙන්න හොඳ නෑ. මහජන විරෝධතාව වැඩිවුණොත් අපිට අපද්‍රව්‍ය ලබාදෙන රට වුණත් මේ වැඩේට බයවෙන්න පුළුවන්. ගේන කුණුවල බිල්ලන් මවලා මිනිස්සුන්ව බය කළාම කුණු තෝරන්න කවුරුවත් බාරගත්තෙ නැති නම් ඒව අපි තෝරන්නද? අනෙක අපි මතක තිගෙන්න ඕනැ තව මාස දෙක තුනකින් ජනාධිපතිවරණයට මුහුණ දෙන්න වෙන බව. එක්කෝ සොබාසිරිය අපේ පැත්තට හරවගන්න ඕනැ. නැති නම් අයින්කරන්න ඕනැ. මේ ප්‍රශ්නය විසඳන්න තියෙන ලේසිම ක්‍රමය ඒක විතරයි."

රණබාහු නැවත තමාගේ මතය ක්‍රියාත්මක කරන්න උත්සහ කළා. එයා කල්පනා කරන්නේ පක්ෂය රැකෙන්නේ තමාගේ ක්‍රියාකාරීත්වය උඩ කියලයි.

"මේ ව්‍යාපෘතිය ජනතා කැමැත්ත ඇතිව කරන්න පුළුවන් බව මට හොඳටම විශ්වාසයි. ඒක කරන්න පුළුවන් වෙන්නේ අපි මේ ව්‍යාපෘතිය, ඒකෙන් රටට

ලැබෙන ප්‍රතිලාභ. ගැන හරියාකාරව පැහැදිලි කරන එක මතයි. සොබාසිරි කියන දේ බොරුවක් බව අපි පෙන්වා දෙන්න ඕනැ. ඒක වචනයෙන් කරන්න බැරිවුණොත් ක්‍රියාවෙන් ඔප්පු කරන්න වෙනවා.''

අගමැතිවරයා කිව්වෙ ජාතික ලයිස්තුවෙන් පත්වූ උගත් මන්ත්‍රීවරුන් දිහාවට හැරිලා.

''කොහොම වුණත් අගමැතිතුමා අපිට නම් සොබාසිරිත් එක්ක වාදෙට යන්න බෑ. මේකෙදි මිනිහත් එක්ක වාද කරල නම් දිනන්න බෑ. ඒකත් එක්ක වාද කරන්න ගියොත් අපිට කට උත්තර නැතිවෙනවා. අන්තිමේදි සොබාසිරි කියනදේ හරියි කියන එක ඔප්පු වෙනවා.''

''සොබාසිරිගෙ කට වහන එක මම බාරගන්නම්. ඒකට ආචාර්ය වරු මහාචාර්ය වරු ඕනැකරන්නේ නෑ. මිනිහ ඉස්කෝලෙ ගිය කාලෙ ඉදලා විස්තර මම හොයාගෙන තියෙනවා. දැන් උපාධි අරගෙන මහ ලොකුවට හිටියට ඕකගෙ තාත්ත අපේ කුලී වැඩ කරපු එකෙක්. ඕකලා කැමති නෑ මිනිහෙක් යමක් කමක් හම්බකරගෙන ජීවත් වෙනවට.''

සොබාසිරිගේ අසනයේ පාර්ලිමේන්තු මන්ත්‍රී සූරසේන කිවුවෙ මහ ලොකු වීරකමක් වගෙයි. සොබාසිරිට විරුද්ධව ප්‍රචාරක කටයුතුවල මූලිකත්වය ගත්තෙ සූරසේන මන්ත්‍රීතුමා.

''අපි මාධ්‍ය ප්‍රචාරය දෙපැත්තකින් කරගෙන යමු. අපේ මහාචාර්යවරුන්ට පුළුවන් අපේ මාධ්‍ය වලින් මේ ව්‍යාපෘතියෙන් රටට ලැබෙන වාසි ගැන පැහැදිලි කරන්න. සූරසේන මන්ත්‍රීතුමාට පුළුවන් පරණ දේවල් එළියට ඇදලා සොබාසිරිට මඩගහන්න.''

අගමැතිවරයා සොබාසිරිට විරුද්ධව සටන් පෙරමුණු දෙකකට අනුමැතිය දෙමින් කිවුවා.

''අපිට වැඩකරන්න වෙන්නේ සොබාසිරිට විරුද්ධව විතරක් නොවෙයි. පරිසර සංවිධාන ගණනාවක් සොබාසිරිත් එක්ක එකතුවෙලා.''

කාරිය කරවන මහත්තය කිව්වෙ බැරෑරුම් විදියට.

''පරිසර සංවිධානවල අය ගැන කරදර වෙන්න එපා. සල්ලි ටිකක් වීසි කරන කොට ඒ ගොල්ලන්ව අපේ පැත්තට ගන්න පුළුවන්

අපි ඔය පරිසර සංවිධානවල අයව එකතු කරලා කරුණු පැහැදිලි කරමු. ඒ අයට ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කරන හැටි බලන්න පිටරට

සවාරියක් ලබාදෙමු. දියුණු රටවල කසල ප්‍රතිචක්‍රීකරනය කරන්නෙ පරිසරයට හානියක් නො වෙන විදියටයි. ඒකට යොදාගන්න වාතය ජලය පිරිපහදු කරලා හානිකර බව නැත්තටම නැති කළාට පස්සෙයි පරිසරයට මුදාහරින්නෙ. ප්‍රතිචක්‍රීකරනය කරන්න බැරි කොටස් දාන කොන්ක්‍රීට් බහාලුම් අවුරුදු දස දහස් ගණනක් පවතින විදියට තමයි නිර්මාණය කරන්නෙ.”

අගමැතිවරයාගේ කපටි මොළ්ට එන අදහස් ක්‍රියාත්මක වෙන්න වැඩි දවසක් ගියේ නෑ. පරිසර සංවිධානවල අයත් එක්ක පවත්වපු සාකච්ඡාවකට පස්සෙ ලංකාවට අපද්‍රව්‍ය එවන රටේ අපද්‍රව්‍ය කළමනාකරණය සිදුකරන විදිය බලන්න ගිය පරිසර කණ්ඩායම් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණයේදී පරිසර හානියක් සිදුවෙන්නෙ නෑ කියල කියන්න ගත්තා. රටේ ජනතාවට මුදල් ලැබෙන කටයුත්තකට විරුද්ධ වෙන්න විපක්ෂය කටයුතු නො කළේ ඒක ඉදිරි ජනාධිපතිවරනයේදී තමන්ට පාඩුවක් වෙන හින්දයි. සොබාසිරි ඉස්සර නියෝජනය කරපු පක්ෂය හැම දෙයක්ම අමතක කරලා රට වෙන්වෙන් සොබාසිරිත් එක්ක එකතු වෙන්න කැමති වුණත් සොබාසිරි ඒකට කැමති වුණේ නෑ. ඒ වෙන කොට ජනාධිපති සිහිනය සොබාසිරිගෙ හිතට ඇවිත් තිබුණා. තවත් පක්ෂයක් එක්ක එකතු වෙලා ඉන්න එක ඉදිරි ජනාධිපතිවරණයට ඉල්ලන්න බාධාවක් වෙයි කියල සොබාසිරි හිතුවා. අන්තිමේදි කසල ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතියට විරුද්ධව කරන සටන සොබාසිරි විතරන් රඟපාන වන් මෑන් ෂෝ එකක් වුණා.

## 04

සාගර සැම වෙලාවෙම සොබාසිරිගේ වැඩ වලට උපරිම සහයෝගය දුන්නත් එයාගෙ කාර්යය බහුල ජීවිතය ඒකට බාධාවක් වුණා.

“ස(ර්) ජනතාව දැනුවත් කිරීමේ වැඩ පටන්ගන්නේ කොහෙන්ද? කොළඹින් පටන්ගත්තොත් රැස්වීමට ලොකු සෙනඟක් ගෙන්වන්න පුළුවන්. මටත් ස(ර්)ගෙ වැඩවලට උදව් කරන්න පුළුවන්.”

සාගර කිව්වෙ තමන්ගෙ රැකියාව කරන අතරම සොබාසිරිට උදව් කරන්න හිතාගෙන.

"රැස්වීම් කොළඹින් පටන්ගත්තොත් ලොකු සෙනඟක් ගෙන්වන්න පුළුවන්. ඒත් ඒ අය මේ ප්‍රශ්නය හදවතින් දකින අය නෙවෙයි. මේ ව්‍යාපෘතියෙන් වැඩිපුරම බලපෑමක් වෙන්නේ. ගොවි ජනතාවට. මම හිතන්නේ මේ රැස්වීම් මාලාව පටන්ගන්න ඕනෑ ගොවි ජනතාව ඉන්න පළාතකින්. මම හිතාගෙන ඉන්නේ අපේ ගම් පළාතෙන් පටන් ගන්න. ආණ්ඩුව මේ ව්‍යාපෘතිය නවත්වන බලාපොරොත්තුවක් නෑ. තව සති දෙකක් යනකොට පිටරටින් එන පළමු කුණු නැව කොළඹ වරායට ගොඩබානවා. අපි රට පුරාම රැස්විම් තියලා වරායෙන් කුණු පිටකරන දවසට කොළඹදී ලොකු රැස්විමක් තියලා විරෝධය දක්වමු, පිටරටින් ගෙනාපු කුණු ආපහු අරගෙන යන්නම. අපිට ජනතාව දැනුවත් කරන එක හරියට කරන්න පුළුවන් වුණොත් ඔය කුණු තෝරලා වෙන්කරන්න කවුරුවත් නැතිවෙනවා. කුණු තෝරන්න වෙන්නේ මන්ත්‍රීවරුනටයි ඇමතිවරුන්ටයි තමයි. ඒ අයට ජනතාවගේ බලය පෙන්වන්න හොඳ අවස්ථාවක්."

පිටරටින් කුණු ගෙන්වීමට විරුද්ධව පැවත්වන පළමු රැස්වීම සොබාසිරිගේ ගම් පළාතෙම තියන්න තීරණය කළා. ඒ රැස්වීම සංවිධානය කරන්න වුනේ සොබාසිරිටමයි. සූරසේන මහත්තයා මේ රැස්වීම තියන එක නවත්තන්න පුළුවන් හැම දේම කරන බව සොබාසිරි දැනගෙන හිටියා. ඒවයින් සොබාසිරිව නවත්වන්න බැරි බව එයා දැනගෙන හිටියෙ නෑ. එයා රැස්වීම තියන්න නගර සභා පිට්ටනිය වෙන්කරගන්න ගියේ ඒක ලබාගන්න බැරි බව දැනගෙනයි.

"රැස්වීම් තියන්න නගරසභා පිට්ටනිය දෙන්න එපා කියල සභාපතිතුමා ලියුමක් එවල තියෙනවා. මේ ඉල්ලුම්පත්‍රයට අනුමැතිය ලබාදෙන්න බෑ."

සොබාසිරිගේ ඉල්ලුම් පත්‍රය පරීක්ෂාකරපු නිලධාරියා කිවුවා.

"ප්‍රශ්නයක් නෑ මට නගර සභා පිට්ටනිය ගන්න බැරි බව මුල ඉඳලම දැනගෙන හිටියා."

එහෙම කියපු සොබාසිරි එතනින් එළියට ආවා. යාළුවෙක්ගෙ ඇඳුනුම් කමක් මත රැස්වීම තියන්න ඉඩමක් හොයාගන්න සොබාසිරිට පුළුවන් වුණා.

සභය දෙන්න ඉදිරිපත් වුණ පරිසර සංවිධානත් නෑ, මේ ඔක්කොම තනියම කරන්න පුළුවන්ද? ස්පීකර් වලට අවසර ගන්න ඕනෑ, සවුන්ඩ් ,ස්ටේජ් තව කොච්චර වැඩ තියෙනවද? රැස්වීම් වල කතා පවත්වන කොට රැස්වීම් තියන්න ඉස්සර මේ වගේ දඟලන්න වෙනබව දැනගෙන හිටියෙ නෑ. ඒ කාලෙ මම හිතුවෙ ස්ටේජ් එක හෙල්ලෙන්න කතා පවත්වන එක තමයි අමාරුම වැඩේ කියලයි. පටන් ගත්ත නිසා මේ රැස්වීම තියනවා. තවත් රැස්වීම් තියන්න බෑ.

ඉතුරු ටික පත්තර වලිනුයි ටී වී එකෙනුයි කරනවා. ස්පීකර් ෆෝම්ට් අරගන්න පොලීසියට වෙලා පැය කීයක් කට්ට කන්න වෙයිද දන්නෙ නෑ........

සොබාසිරි පොලීසියට එනව දැක්ක පොලිස් නිලධාරියෙක් ස්ථානාධිපති ළගට දුවගෙන ගියේ සොබාසිරිව නොදැන්න වගෙයි.

ඉස්සර මට සැලියුට් ගහපු අය නොදැක්ක වගේ මාරු වෙනවා. ස්පීකර් ෆෝම්ට් එක ගන්න එකත් ලේසි වෙන එකක් නෑ.......

එයාව දැකල දුවගෙන යන පොලිස් නිලධාරිය දැකපු සොබාසිරිට හිතුනා.

"ස(ර්) සොබාසිරි මහත්තයා එනවා. ඔය එන්නෙ ස්පීකර් වලට අවසර ගන්න."

ස්ථාධිපතිවරය ළඟට ගිය පොලිස් නිලධාරියා හති හලමින් කිවුවා.

"තමුසෙ දුවගෙන ආපු විදියට මම හිතුවෙ බෝම්බ ලොරියක් එනවා කියල. ඕන කරන ෆෝම් පිරෙවුවට පස්සෙ මා ළඟට එවනවා."

එහෙම කිවුවත් සොබාසිරි එන ආරංචිය එයාට ලොකු ප්‍රශ්නයක් වුණා.

"ඔය රැස්වීම තියන තැන ඉදලා මීටර් පන්සීයක් ඇතුළත ආගමික ස්ථානයක් තියෙනවා. රැස්වීම නිසා එතන කටයුතුවලට බාධා ඇතිවෙන්න පුළුවන්. ඒ නිසා අපිට අවසර ලබාදෙන්න බෑ."

ශබ්ද විකාශන බලපත්‍ර ලබාගන්න දීපු ඉල්ලුම්පත්‍රය පරීක්ෂා කළ පොලිස් ස්ථානධිපතිවරයා කිව්වෙ ප්‍රශ්නය සොබාසිරිගෙ පැත්තට තල්ලු කරලා.

"ඒත් පසුගිය ඉරිදා ඔය පන්සලට අල්ලපු වැටේ තියෙන පිට්ටනියේ සංගීත සන්දර්ශනයකට අවසර දුන්නේ කොහොමද?."

සොබාසිරි විමසා සිටියේ පොලිස් නිපධාරියා නිරුත්තර කිරීමේ අදහසින්.

"ඒක සූරසේන මන්ත්‍රීවරයගෙ සංගීතයක්. ඒකට කිසිම කෙනෙක් විරුද්ධ වුණේ නෑ. පන්සලේ හාමුදුරුවො වත් සංගීත සන්දර්ශනය තියනවට විරුද්ධ වෙලා නෑ."

"මෙතන රැස්වීම තියනවට හාමුදුරුවෝ විරුද්ධ නැති නම් අපිට අවසර දෙන්න පුළුවන්ද?

ප්‍රශ්නය ඕ අයි සී මහත්තයයෙ පැත්තට තල්ලු කරන්න සොබාසිරිට පුළුවන් වුණා.

“එහෙම නම් අපිට සලකා බලන්න පුළුවන්.”

පොලිස් ස්ථානාධිපතිවරයා කිව්වෙ වෙනත් දිය හැකි පිළිතුරක් නැති නිසයි.

“බලනවා අපිට කොන්ද කෙලින් තියාගෙන රස්සාව කරගෙන යන්න විදියක් නැති හැටි. පන්සලේ නායක හාමුදුරුවෝ විරුද්ධ නොවුනොත් රැස්වීම තියන්න අවසර දෙන්න වෙනවා. එතකොට සූරසේන ඇවිත් මගේ පිත්තල බොත්තම් ගලවලා දමයි. දැන් මොකද කරන්නේ.”

සොබාසිරි එතනින් ගියාට පස්සෙ පොලිස් ස්ථානාධිපතිවරයා එතන හිටපු නිලධාරියකුට කිව්වෙ හිතේ ඇතිවෙච්ච කලකිරීමත් එක්ක.

“ස(ර්) පන්සලේ හාමුදුරුවෝ විරුද්ධ නැති නම් රැස්විම තියන්න අවසර දෙමු. දැන් රැල්ල ගහන පැත්ත හිතාගන්න බෑ. මට පේන විදියට සොබාසිරි මහත්තයා රටේ අනාගත ජනාධිපති වෙයිද කියන්න බෑ. මේ කුණු වැඩෙන් මිනිහා නැගලා යනවා. අහන අහන හැමදෙනාම පිටරට කුණු අපේ රටට ගේනවට විරුද්ධයි. සොබාසිරි ජනාධිපති වුනාම ඔය සූරසේනලට රට ගම දාල යන්න වෙනවා. මට තේරෙන හැටියටත් පිටරට කුණු ගේන එකෙන් රටට හොඳක් වෙන්නේ නෑ.”

“ඒවයේ හරි වැරැද්දෙන් වැඩක් නෑ. කොහොමටත් අපිට අද හෙටම පිටරට කුණු ගේන එකට විරුද්ධවෙන එවුන්ගේ ඔළු පලන්න සිද්ද වෙනවා. අපිට තියෙන්නේ හදවත පැත්තකින් තියලා රස්සාව බේරගන්න වැඩ කරන එකයි. මේ ජොබ් එක හදවතට එකඟව කරන්න පුළුවන් එකක් නොවෙයි.”

************************************

සොබාසිරි පන්සලට යන කොට නායක හාමුදුරුවන් බණ පොතක් කියවමින් තමන්ගෙ කුටියෙ වැඩහිටියා. එයා නායක හාමුදුරුවන් හමුවෙලා ආපු කාරණය කිව්වෙ දුක්ගැනවිල්ලක් කියනවා වගෙයි.

“ඇත්තටම ඕ අයි සී මහත්තයා එහෙම කිවුවද? කාගෙවත් විරුද්ධත්වයක් නැතිවෙන්නේ කොහොමද? ඕකට මම කොච්චර විරුද්ධ වුණාද? මේ පන්සලට අල්ලපු වැටේ විසූක දස්සන එපා කියලා. එක අතකට ඒ මහත්තයා කියපු කතාවත් හරි. ඔය විසූක දස්සන වලට කවුරුවත් විරුද්ධ වෙලා නැහැනෙ. ඒකට විරුද්ධව මම පැමිණිලි කරන්න ගියත් පොලීසියෙ මහත්වරු පැමිණිල්ල බාරගත්තේ නෑ. මමත් මහත්තයත් එක්ක පොලීසියට එන්නම්. එතකොට බොරු කියල කර අරින්න බෑ. ඔය ඔක්කොම කරවන්නෙ සූරසේන. මිනිහට පොලීසියෙ

මහත්තුරු බයයි. එයා හදන්නෙ මේ රැස්වීම නො තියන තැනට වැඩකරන්න. බලමු කවුද දිනන්නෙ කියලා.''

සොබාසිරි ආපසු ආවෙ රැස්වීම තියන්න ඕන කරන කටයුතු ඔක්කොම පිළියෙල කළාට පස්සෙයි..

''රැස්වීමට ඕනැ කරන හැම දෙයක්ම සූදානම් කළා. මාර කට්ටක් කෑවෙ. හාමුදුරුවන්ව හම්බවුණේ නැති නම් මේ ටික කරන්න තව දවසක් යනවා. ඒත් අපිට ලංකාව පුරාම රැස්වීම් තියන්න පුළුවන් වෙයි කියලා හිතන්න බෑ.''

වෙහෙසකාරී දිනක් ගෙවිල යද්දි නවාතැනට පැමිණි සොබාසිරි කිවුවේ කලකිරිල වගෙයි.

''ස(ර්) ඇයි එහෙම කියන්නේ. රටේ බහුතරයක් මේ වැඩේට කැමති නෑ. ඒ අය අපිත් එක්ක එකතුවෙනවා.''

සාගර කිව්වෙ රැස්වීම් තියන එක බොහොම ලේසි දෙයක් වගේ.

''ඔයා දන්නෙ නෑ මේකට වෙච්ච මහන්සිය. මේ රැස්වීම සම්පූර්ණයෙන්ම සංවිධානය කරන්න වුණේ මට. අපිට සහයෝගය දෙන්න පොරොන්දු වුණු පරිසර සංවිධාන එකක්වත් අපිත් එක්ක නෑ. මා ළඟ තියෙන සල්ලිත් ඉවරයි. තව රැස්විමක් තියන්න වියදම් කරන්නේ කොහොමද?''

සොබාසිරි උද්ගතවී තියෙන තත්වයයි රැස්වීම සංවිධානය කරන්න වෙච්ච මහන්සියයි විස්තර කළා.

''ආණ්ඩුව පරිසර සංවිධාන වල  අයව සල්ලි වලට අරන්. ස(ර්) බයවෙන්න එපා.  මම ස(ර්) එක්ක ඉන්නවා. අපි තනිවෙලා නෑ සමාජයේ බහුතරය ඉන්නෙ අපිත් එක්කයි. අපිට ඒ බලවේග එකම ප්‍රවාහයකට එකතු කරගන්න බැරිවෙලා. ස(ර්) කියපු හාමුදුරුවොත් අපේ ප්‍රවාහයට එකතු වෙන්න කැමැත්තෙන් හිටියා. අපිට හිතවත් බලවේග එකතුකර ගත්තම මේ ගමන අමාරු එකක් නෙවෙයි.''

''අපි කොහොමද අපිට හිතවත් අයව හොයාගන්නෙ. ඒ වැඩවලට වෙනම දවසක් වෙන්කරන්න වෙනවා. සාගර මට හිතවත් බව මම දන්නවා. ඒත් රස්සාව කරන ගමන් මට උදව් කරන්නේ කොහොමද? ''

''අපි පිටරටින් කුණු ගෙන්වන එකට විරුද්ධ සංවිධානයක් පිහිටුවා ගනිමු. පළවෙනි රැස්වීමෙදි ඒ ගැන දැනුවත් කරන්න පුළුවන් මම හිතාගෙන හිටියේ ස(ර්)ගෙ වැඩපිළිවෙල වාර්ථා කරන ගමන් ස(ර්)ට උදව් කරන්න. අපේ චැනල් එක ස(ර්)ගෙ කටයුතු ප්‍රචාරය නෙකරන්න තීරණය කරලා. මම රස්සාවෙන්

අයින්වෙලා මේ විනාශය නවත්වත්ත ස(ර්) එක්ක එකතු වෙනවා. පළවෙනි රැස්වීම තියාගන්න පුළුවන් වුණොත් අනිත් රැස්වීම් තියන්න සල්ලි හොයාගන්න පුළුවන්. ස(ර්)ට තියෙන්නේ අපි මුහුණපාල තියෙන තත්වය විස්තර කරලා පුළුවන් විදියට ආධාර කරන්න කියන එකයි.''

''අපි කොහොමද මිනිස්සුන්ගෙන් සල්ලි ඉල්ලන්නේ. ඒ ගෙල්ලො මේ දවස්වල ජීවත්වෙන්නේ බොහොම අමාරුවෙන්.''

''අපි බලෙන් සල්ලි ඉල්ලන්නේ නෑ. මේ වෙලාවෙ අපිත් පැත්තකට වෙලා හිටියොත් මේ විනාශය නවත්වන්න කවුරුවත් නැති වෙනවා. මිනිස්සු පුළුවන් හැටියට ආධාර කරයි. අපි ඒ සල්ලි පරිස්සමින් පාවිච්චි කරමු. ස(ර්) ඉදිරි ඡන්ද වලට ඉදිරිපත්වෙන බව නොකියා කියන්න ඕනැ. රටේ බොහොම දෙනෙක් හිතාගෙන ඉන්නේ ස(ර්) ජනාධිපතිවරණයට ඉදිරිපත්වෙයි කියලයි. ටික දවසක් යනකොට රැස්වීම් සංවිධානය කරන්න ඕනැ තරම් අය ඉදීවි. ස(ර්)ට තියෙන්නේ රැස්වීම තියෙනදාට ගිහින් කථා පවත්වන එක විතරයි.''

*****************

සොබාසිරිගේ ගම් පලාතේ පැවත්වපු පළමු රැස්වීම කවුරුවත් නොසිතපු තරම් සාර්ථක වුණා. බොහෝ දෙනෙක් රැස්වීම බලන්න ආවෙ සොබාසිරිගේ ගැඹුරු කටහඬ අහන බලාපොරොත්තුවෙන්. පිටරටින් ගෙන්වන කුණු රට විනාශ කරන ආකාරය පැහැදිලි කරමින් පැය ගණනක් පැවත්වන සොබාසිරිගේ කතාව අවසානයේ එයට සවන්දීපු අය සොබාසිරිගේ අනුගාමිකයන් බවට පත්වුණා. පිටරට කසල වලට විරුද්ධව පිහිටුවාගත්තු හරිත එකමුතුව සංවිධානයට දිවයිනේ දස අතින් ආධාර ගලා එන්නට පටන් ගත්තා. සාගර කිවුව වගේම පළවෙනි රැස්වීමෙන් පස්සෙ සොබාසිරිට රැස්වීම් සංවිධානය කරන්න මහන්සි වෙන්න වුණේ නෑ. සෑම දිස්ත්‍රික්කයක් ආවරණය වන පරිදි පවත්වපු රැස්වීම් මාලාව අවසානයේ කොළඹදී පවත්වන්න බලාපොරොත්තු වෙන විරෝධතාව වරායට ගොඩබාල තියෙන ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය වරායෙන් පිටකරන දිනයේදීම පැවත්වන්න තීරණය කළා.

*************************************

මේ අතර අගමැතිවරයාගේ ප්‍රධානත්වයෙන් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රී වරුන්ගේ රැස්වීමක් පැවැත්වන්න තීරණය කරල තිබුණෙ වරායට ගොඩබාල තියෙන ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය වරායෙන් පිටකරන ආකාරය ගැන සාකච්ඡා කරන්න හිතාගෙන.

“සොබාසිරි අපි හිතාගෙන හිටියට වැඩිය ඉහළින් ඉන්නේ. මිනිහගේ රැස්වීම් වලට හිටිය සෙනඟ දැක්කම බයත් හිතෙනවා. මේ විදියට ගියොත් මිනිහා නවතින්නේ ජනාධිපතිකම අරගෙන. මට හිතෙන විදියට මේ වෙලාවෙ කරන්න තියෙන්නේ මිනිහව අයින් කරන එකයි. මගදි සොබාසිරිගේ කාර් එකේ වාහනයක් හැපුනට අපි වගකියන්න ඕනැ නෑ .”

රණබාහු මන්ත්‍රීවරයා එහෙම කිව්වෙ සාකච්ඡාව ආරම්භ කරනත් ඉස්සර. සාකච්ඡාවට සහභාගි වූණ බොහෝ දෙනක් රණබාහු මන්ත්‍රීවරයාගේ අදහස අනුමත කළා. ඒත් ඔවුන්ට බාධා කරමින් අගමැතිවරයා කතාකිරීමට පටන් ගත්තා.

“මම ඔයගොල්ලන්ට එන්න කිව්වෙ ඔයගොල්ලන්ගෙන් උපදෙස් අරගන්න නෙවෙයි. සොබාසිරිව මරල දැම්මත් වෙන කෙනෙක් සොබාසිරිගෙ චරිතය රඟපාන්න පටන් ගනියි. සොබාසිරිගෙ මිනිය විකුණගෙන එයාට පුළුවන් සොබාසිරිට වැඩිය ඉහළට එන්න. මට ලැබිල තියෙන ආරංචි වල හැටියට දැනට වරායට ගොඩබාල තියෙන කන්ටේනර් වරායෙන් පිටකරන්න ලැබෙන්නේ නෑ. අපිට වචන වලින් සොබාසිරිව පරද්දන්න බැරි වුණා. මම සැලසුම් කරල තියෙන්නේ ලබන සඳුදා ලොකු උත්සවයක් තියල වැඩේ පටන්ගන්න............”

“ඒ මොන ලජ්ජ නැති වැඩක්ද? කුණු කන්ටේනර් වරායෙන් පිටකරන්න බැරි බව දැන දැනම ලොකු උත්සව තියන්න. අපිට හමුදාව දාල කන්ටේනර් එළියට ගන්න බැරිද? දෙතුන් දෙනෙක් බිම බැවෙන කොට අනිත් එවුන් ගිය තැනක් හොයන්න බැරිවෙයි. එහෙම නැති නම් කවුරුවත් හිතන්නෙ නැති වෙලාවක කන්ටේනර් වරායෙන් පිටකරමු”

කිසිදින පරාජය භාරගැනීමට අකමැති සූරසේන අගමැති වරයගෙ කතාව මැද්දට පැනල කේන්තියෙන් කිවුවා.

“ඕකට හමුදාව ගාවගන්න ඕනැ නෑ. මම දෙන්නන්කො සාමාන්‍ය ජනතාව. උද්ඝෝෂණ නිසා පීඩාවටපත් ජනතාව උද්ඝෝෂණකරුවන්ට පහරදෙයි කියල නිවුස් එකක් හදන්න විතරයි තියෙන්නේ.”

සූරසේනගේ කතාව අවසන් වෙන්නත් ඉස්සර රණබාහු සූරසේනගෙ කතාවට පෝර දැම්මා.

“මේ වැඩ ඇඟේ හයියෙන් කරන්න පුළුවන් දේවල් නෙවෙයි. අපිට අපේ රට ගැන විතරක් හිතල තීරණ ගන්න බෑ. අපි මිනිස්සුන්ව මර්දනය කරන්න හැදුවොත් අපිට විරුද්ධව ජාත්‍යන්තර බලපෑම් එල්ල වෙන්න පුළුවන්. අපි උද්ඝෝෂණවලට පහර දුන්නොත් මාධ්‍යකාරයො අපිව පතුරු ගහයි. ඒකෙ

ප්‍රතිඵල හැටියට කසල ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතිය අපිට නො ලැබෙන්නත් ඉඩ තියෙනවා. අනික අපිට හමුදාව ගැන විශ්වාසයක් තියන්න බෑ. හමුදාව මිනිස්සුන්ගෙ පැත්ත ගත්තොත් අපි ඉවරයි. මේ වැඩේ මහ රෑ හොරෙන් ආණ්ඩු හැදුව වගේ රටට හොරෙන් කරන්න හොඳ නෑ. ලොකු උත්සවයක් තියල සෙත් පිරිත් කියල එහෙම වැඩේ පටන්ගන්න ඕනැ. මම නතර කලේ කොතනින්ද? ..........හරි අපිට වරායට ගොඩබාල තියෙන කන්ටේනර් පිටකරන්න ලැබෙන්නෙ නෑ කියපු තැනින්.

ඒක සිද්ධ වෙන්නෙ මෙහෙමයි. කන්ටේනර් වරායෙන් පිටකරන්න නො ලැබුනොත් ඒව ආපහු වරාය ඇතුළටම අරගෙනයනවා. එහෙම වුණොත් අපිට ඔබතුමාලගෙ සහයෝගය ඕනැ කරනවා.''

''ඔච්චර හරියක් වුණාට පස්සේ අපේ සහයෝගය ඕනැ කරන්නේ කුණු ටික අපහු නැව්වලට පටවන්නද? ඔබතුමා අපේ අදහස් පිළිගන්නේ නැති නම් අපි මෙතන ඉඳල වැඩක් නෑ .''

රණබාහු පුටුව පස්සට දාල නැඟිටින ගමන් කිවුවා..

''ඔබතුමාල හැමදේටම කලබල වෙනවා. ඒක මගේ රහසිගත සැලැස්මේ කොටසක්. ඒක සැලැස්ම ක්‍රියාත්මක වෙනතුරු රහසක් හැටියටම තියෙන එක හොඳයි.''

''ඒ කියන්නේ අගමැතිතුමාට අපිව විස්වාස නෑ කියන එකද? ඔය සැලැස්ම ගැස්සිලා ගියොත් අපි ඔක්කොම ඉවරයි. සොබාසිරිය නවතින්නේ ජනාධිපතිකම අරගෙන. ඒකගෙ රැස්වීම් වලට හිටිය සෙනඟ දැක්කම පිස්සු හැදෙනවා. බස් දාල කන්න බොන්න දිලවත් අපේ රැස්වීමකට ඒ සෙනගෙන් බාගයක් එකතුකරගන්න බෑ.''

''මගෙ ප්ලෑනක් මේ වෙනතුරු වැරදිලා නෑ. සොබාසිරියව අල්ලගෙන ගහපු ගේම නොවෙන්න අපිට තව අවුරුදු ගණනක් විපක්ෂයේ ඉන්න වෙනවා. මේකත් ඒ වගේ එකක් තමයි. ඔබතුමාල බයවෙන්න එපා.''

අගමැතිතුමා කිව්වෙ බොහොම සන්සුන් විදියට.

''අගමැතිතුමා කියනව නම් අපි ටිකක් ඉවසමු. අපිට තියෙන්නේ අගමැතිතුමා කියන දෙයක් කරල දෙන එකයි .''

සූරසේනට රණබාහුව සන්සුන් කරගන්න පුළුවන් වුණා.

************************************

“අපේ රැස්වීම් ටික නැගල ගියා අන්තිම රැස්වීමට හිටපු තරම් සෙනඟක් කවදාවත් එකතුවෙලා නෑ. ආණ්ඩුව හෙල්ලිලා ගිහින් ඇති. ස(ර්) ඊළඟ ජනාධිපතිවරණයට ඉල්ලුවොත් නරකද? උඩින්ම දිනන්න පුළුවන්.”

සොබාසිරිගෙ රැස්වීම් වල අන්තිම එක ඉවරවෙලා ආපහු නවාතැනට ආපු සාගර කිවුවා.

“ආණ්ඩුව හෙල්ලිලා කියල මම නම් හිතන්නෙ නෑ. ඒගොල්ලන්ගේ වැඩපිළිවෙල අඩියක්වත් අකුලගන්න ඒ ගොල්ලො සූදානම් නෑ. ලබන සඳුදා දහයකුත් ගානට තියෙන සුභ මොහොතින් කුණු කන්ටේනර් වරායෙන් පිටකරනවලු. මේ ගොල්ලො ගාව අපි නොහිතන ප්ලෑනක් තියෙනවා. නැති නම් කන්ටේනර් ටික උත්සවයක් නොතියා හොරෙන්ම වරායෙන් පිටකරන්න තිබුණා.”

“එහෙම නම් ලබන සඳුදා වරාය ළඟ උද්ඝෝශනයක් කරන්න වෙනවා. දැන්ම ඉදන් නොකා හිටියට කමක් නෑ. එදාට ඇතිවෙන්න කන්න ලැබෙයි.”

“ආණ්ඩුව මේ වෙලාවෙ එහෙම දෙයක් කරන එකක් නෑ. රටේ සියයට අසූවක් විතර මේ වැඩේට කැමති නෑ. මේ ප්‍රශ්නය දිහා අපේ රටට කුණු එවන රටත් විමසිල්ලෙන් ඉන්නෙ. රටේ ජනතාව කැමති නැත්නම් කුණු එවන්නෙ නැතිව ඉන්න ඒගොල්ලා තීරණය කරල තියෙනවා.”

“සඳුදා තියෙන විරෝධතාවයට අපිට සහයෝගය දෙන අයට එන්න කියලා ප්‍රචාරය කරනවද?.”

“එදාට අපි දන්න අය විතරක් ගෙන්වමු. කැම්පස් එකේ ළමයි ආවත් ඇති. එක එක කණ්ඩායම් වෙන වෙනම සංවිධානය කරන්න ඕනෑ. උද්ඝෝෂණය වෙලාවෙ රජයේ දේපල වලට හානිකරල අපිට තියෙන ජනතා පිළිගැනීම නැති කරන සැලසුම් තියෙන්න පුළුවන්. අපේ කණ්ඩායම එකා පිට එකා වැටුනත් පස්සට යන්නැති අය වෙන්න ඕනෑ. මේ වෙලාවෙ අපි පරිස්සමින් වැඩකරන්න වෙනවා. දැන් රටේ මොනව වෙනවද දන්නෙ නෑ. සති ගානකින් පත්තරයක් ටී වී එකක් බැලුවේ නෑ .”

සොබාසිරි රූපවාහිනී යන්ත්‍රය ක්‍රියාත්මක කරවමින් කිවුවා. ඒකෙ විකාශනය වුණේ කසල ප්‍රතිචක්‍රීකරණය පිළිබඳ දැන්විමක්.

“කන්ටේනර් එළියට දාන්න හදන්නේ ලොකු උත්සවයක් තියලයි. හොඳයි බලමු ඔය එක කන්ටේනරයක්වත් වරායෙන් පිටකරන්න ලැබෙයිද කියලා.”

සොබාසිරි මුවට නඟාගත් හිනාවක් එක්ක සාගර දිහා බැළුවා.

**********************

සඳුදා උදේ පාන්දරම නැගිට්ට සොබාසිරි හතර වටේට කෝල් කර කර විරෝධතාවය සූදානම් කලා.

"දැන් හමුදාවයි පොලීසියයි අපිව පිළිගන්න ලෑස්තිවෙනවා ඇති. අද අපිට හොඳ කෑමක් ලැබෙයි."

සාගර එහෙම කිව්වෙ නවාතැනෙන් පිටවෙන ගමන්..

"ඒව අපිට පුරුදු නැති දේවල් නෙවෙයිනෙ. ගිහිල්ලම බලමු."

විරෝධතා පෙලපාලිය වරාය දොරටුව ළඟට එනකොට උදේ අට විතර වුනා. පෙලපාලිය නවත්වන්න පොලීසිය හමුදාව නොහිටපු එක ගැන හැමදෙනාටම පුදුමයි.

"මට නම් ගෙදර යන්න හිතෙනවා. අපිව පිළිගන්න කිසිම සූදානමක් නෑ. පොලීසියෙ හමුදාවෙ ට්‍රක් දෙක තුනක් වතුර බවුසරයක් එහෙම ඇවිල්ල තිබුණ නම් හිතට පුදුම ගැම්මක් එනවා. උත්සවයට එන ලොක්කොත් තවම ඇවිත් නැතිව ඇති. උන්ට ඇතුළට යන්න බැරිවෙන්න පාර බ්ලොක් කරමු. එතකොට උත්සවත් නෑ."

විරෝදතාවයට සහභාගී වුණ විශ්වවිද්‍යාල ශිෂ්‍යයෙක් කිව්වෙ ඒ ගොල්ලො ගිය හැම විරෝධතාවකදිම බඩ කට පුරා කන්න ලැබිච්ච නිසයි.

"අපි මෙතෙන්ට ආවෙ කුණු පටවපු කන්ටේනර් එළියට එන එක නවත්වන්න මිසක උත්සවය නවත්වන්න නෙවෙයි. අපි උත්සවය තියන්න දෙමු. උත්සවය තියල මහ සද්දෙට කෑගහල අන්තිමේදි කුණු එළියට දාගන්න බැරි වුණාම නටපු තොවිලෙකුත් නෑ බෙරේ පලුවකුත් නෑ. ආණ්ඩුව විෂිල් ගැහුවට බල්ට් බෑ කියල රටම දැනගන්නවා."

හිරු රැස් කැරලි මර්දන කුළු පොළු හමුදාවේ වගකීම බාරගෙන තමන්ගෙ උපරිම බලය යොදල විරෝධතා කරුවන්ගෙ හිස් මුදුනට පහර දුන්නා. පසුගිය මාසයක විතර කාලයක ඉඳලා කසල ව්‍යාපෘතිය නිසා සිදුවෙන විනාශය ගැන කියපු සොබාසිරිගේ වදන් අවබෝධ කරගත් සුළඟ වළාකුලක් තල්ලු කරගෙන ඇවිත් විරෝදතාකරුවන් පලවා හැරීමට උත්සහ ගන්න හිරු රැස් වලකාලීමට කටයුතු කළා.

"ස(ර්) මට නම් දැන් එපා වෙලා, කන්ටේනර් එළියට එන්න තව කොච්චර වෙලාවක් යනවද? ."

''තව පැය පැය බාගයක් යනකොට කන්ටේනර් වරායෙන් පිටවෙන්න ඕනැ. ඊට ඉස්සර අපිට සංග්‍රහ කරන කණ්ඩායම මෙතෙන්ට එයි. එතකොට පාලුවක් නැතිව ඉන්න පුළුවන්.''

පැය බාගයක් ගතවුණත් තත්වයේ කිසිම වෙනසක් වුණේ නෑ

''දැන් නම් වෙලාව හරි. කෝ තවම කිසිම සූදානමක් නෑ. අපිව පිළිගන්න කවුරුවත් ඇවිත් නෑ. අපි මෙතන කරවෙන කොට කන්ටේනර් වෙන දොරටුවකින් පිටවෙලා ගියාද දන්නෙ නෑ.''

කන්ටේනර් රථ වරායෙන් පිටවෙන තුරු බලා ඉන්න පිරිස නොසන්සුන් වුණා. සොබාසිරි ඔවුන් සන්සුන් කරන්න උත්සහ ගත්තා.

''කවුරුවත් කලබල වෙන්න එපා. කන්ටේනර් එකක්වත් වරායෙන් පිටකරලා නෑ. වෙන දොරටුවකින් පිටකරන්න හදනව නම් මට ඒ ගැන දැනගන්න ලැබෙනවා. එකා පිට එකා වැටුනත් එක වාහනයකටවත් වරායෙන් පිටවෙන්න නොදෙන්න අපි හිතට ගන්න ඕනැ. ජනතාව අපේ පැත්තෙ ඉන්න තුරු අපි මොන බලවේගය ආවත් පස්සට යන්න හොඳ නෑ.... .''.

කතාව එකවරම නතර කරපු සොබාසිරි පිවිසුම් දොරටුව දිහාවට දුවගෙන ගියා. සොබාසිරි දුවගෙන යන්නෙ මොකද කියල බලපු පිරිසට දැකගන්න ලැබුණේ නොයෙක් වර්ණවල කොඩිවැල් වලින් සරසපු කන්ටේනර් රථ පේලියක්. ඒක කවුරුවත් බලාපොරොත්තු වෙච්ච දර්ශනයක් නෙවෙයි. ඒ ගොල්ලො බලාපොරොත්තුවුණේ කැරලි මර්දන කණ්ඩායමක්, ජල ප්‍රහාරක රථයක් පෙරටුකරගත්තු රථ පේලියක්.

මේ මොකද වෙලා තියෙන්නේ. පොලිසියේ මහත්තුරු අපිට විරුද්ධ වෙන්න බෑ කිවුවද? නැති නම් මෙහෙම දෙයක් වෙන්න බෑ..................

විරෝදතා පුවරුවක් ඔසවාගත් සොබාසිරි මාර්ගය අවහිර කරමින් පාර මැද වාඩිවුණා, අනෙක් විරෝදතාකරුවන්ද සොබාසිරිව අනුගමනය කළා. රථපෙල ඉදිරියට ගමන් කිරිමට නොහැකිව එක පෙළට නතරවෙලා බලා ඉන්නවා.

''එක වාහනයක්වත් මෙතනින් එහාට අරගෙන යන්න දෙන්නෙ නෑ. පිටරට කුණු අපිට එපා. ප්‍රශ්න ඇතිකරගන්නේ නැතිව වාහන ආපහු හරවගෙන යන්න.''

සොබාසිරිගේ විධානයට අවනතවු රථපෙළ විරෝධතාකරුවන්ගේ ප්‍රීති ඝෝෂා මැද්දෙ ආපසු වරාය තුළට ගමන්කරන්නට වුණා.

“සහෝදරවරුනි! හැම බලයකටම වඩා ජනතා බලය ඉහළයි. අද ඒක ඇස්පනාපිටම දැකගන්න ලැබුණා. අපිට විරුද්ධව හමුදාව, පොලීසිය යොදවන්න පවා ආණ්ඩුව බයයි. කැප්පෙටිපොල සෙනවිතුමා සුද්දන්ගෙ තාන්න මාන්න අතැරල විමුක්ති සටනට එකතුවුණා වගේ හමුදාවෙ, පොලීසියෙ මහත්වරුත් අපේ රට පිටරට කුණු රකුසාගෙන් බේරාගන්න ගෙන යන සටනට එකතුවෙයි කියලා ආණ්ඩුව බයයි. හොර රහසේ මේ කන්ටේනර් පිටකරන්න හැදුවොත් අපි ජනතාව එක්ක එකතුවෙලා මේ ආණ්ඩුව ගෙදර යවන්න කටයුතු කරන බව රටට විනකරන්න හදන පාලකයන්ට මතක්කර දෙමින් මගේ කතාව නිමකරනවා. දැන් අපි සාමකාමීව විසිරයමු.”

සොබාසිරි කිව්වෙ මහත් උද්දාමයකින්.

******************

කුණු පුරවපු කන්ටේනර් වරායෙන් පිට කරන උත්සවය ඉවරවෙලා මැති ඇමති පිරිස සුපිරි හෝටලයක සවුදිය පිරීමේ සාදයකට සහභාගී වූණා

“අගමැතිතුමා හිතන්නේ සොබාසිරි අපේ වාහනවලට වරායෙන් පිටවෙන්න දෙයි කියලද.”

සූරසේන අගමැතිතුමාගෙන් ඇහුවෙ ඔහුගේ ඉදිරි සැලැස්ම අනාවරණය කරගන්න අදහසින්.

“සොබාසිරි පණපිටින් හිටියොත් අපේ වාහන වලට එළියට යන්න දෙන්නේ නෑ. තව මිනිත්තු දහයක් යනකොට වාහන වලට එළියට යන්න ලැබුණද කියල දැනගන්න පුළුවන්. අපි සැලැස්මේ ඊළඟ පියවරට සූදානම් වෙන්න ඕනෑ. ඒකට රණබාහු මන්ත්‍රීතුමාගේ සහයෝගය ඕනෑ කරනවා. තව පැයක් යනකොට සීයක විතර කණ්ඩායමක් වරාය ඇතුළට ගේන්න ඕනෑ.”

“රටපුරා පොස්ටර් ගහලා, දවස පුරාම ටීවී එකෙයි රේඩියෝවෙයි කෑ ගහලා මහ උත්සවයක් තියලා කුණු කන්ටේනර් වරායෙන් පිට කරන්න බැරිවුණොත් අපිට රෙද්දක් ඇඳගෙන එළියට යන්න පුළුවන්ද? අපි බලයට ආවට අපිට වැඩ කරපු අයට සලකන්න බැරිවුණා. අපි කොහොමද උන්ට තව වැඩ කියන්නේ. ඔබතුමා කියනව නම් කොහොමහරි සීයන් විතර හොයලා දෙන්නම්. හැබැයි දවල් බත් එකයි හවසට රුපියල් දාහකුයි දෙන්න ඕනෑ”

රණබාහු කිව්වෙ නොරිස්සුම් බවකින්.

“දාහට දහ දාහක් දෙන්න බැරියෑ, අපිට පුළුවන් සොබාසිරිව පැත්තකට ඇදල දාල වාහන අරගෙන යන්න. එහෙම කළොත් ඊළඟ දවසෙදි අද ඉන්නව

වගේ දහ ගුණයක් එකතු කරගෙන මිනිහා පාර හරස් කරයි. ඊළඟ ජනාධිපතිවරණයට ඉදිරිපත් වුණොත් ඒකා උඩින්ම දිනනවා. මගේ ප්ලෑන් එකේ හැටියට සොබාසිරිට තව දවස් තුනකට වැඩිය දඟලන්න ලැබෙන්නේ නෑ. ඊට පස්සෙ මිනිහ ආගිය තැනක් හොයන්න බැරිවෙනවා. අපි මේක ඉක්මනට ඉවර කරලා ආපහු වරාය පැත්තට යමු.''

විනාඩි දහයක් ගතවෙනකොට ආපු ආරංචිය සතුටුදායක එකක් වුණේ නෑ.

''සීයක් නම් හොයාගන්න බැරිලු. පනහක් විතර තව පැයක් යනකොට එවන්නම්ලු. ඒකත් හොයාගන්න වෙන්නෙ බොහොම අමාරුවෙන්.''

දුරකතන ඇමතුම් කිහිපයක් හුවමාරු කිරීමෙන් පස්සෙ රණබාහු ඇමතිතුමාට කිවුවා.''

''වෙලාවෙ හැටියට ඒත් මදෑ. අරගෙන එන අයව මේ නම්බරේට සෙට්කරවන්න.''

අගමැතිතුමා එයාගෙ ලේකම් වරයගෙ දුරකථන අංකය රණබාහු මන්ත්‍රීතුමාට දුන්නා.

''හවස් වෙන්න ඉස්සර වරාය පැත්තෙ යන්න ඕනෑ. ඉදිරි වැඩ සාර්ථක වෙන්නේ අද රණබාහුගේ ගෝලයන්ට සලකන විදියට තමයි.''

අගමැතිතුමා වීදුරුවක් හිස්කරන ගමන් කිවුවා.

********************

නියෝගය ලැබිච්ච රණබාහුගෙ ගෝල බාලයො තමන්ට එන්න කියපු තැන්වලට එකතු වුණා. ඒ ගොල්ලන්ව එකතු කරගනිමින් බස් එක ඉදිරියට ගමන් කරන්න පටන් ගත්තා. ඒත් යන්නෙ කොහෙහෙද කියල ඒගොල්ලො දැනගෙන හිටියේ නෑ.

''සෝමෙ අයියා, ලොක්ක එන්න කිවුවට බස් එකට නැග්ගට කොහේ යනවද? මොකට යනවද කියල දන්නෙ නෑ. ගේමකට එන්න කිවුව නම් අපි දෙන්න විතරක් අත් දෙක වන වනා ගිහින් හරියනවද?''

බස් එකට මුලින්ම ගොඩවෙච්ච මූණපුරා රැවුල වැවිච්ච කැහැටු මිනිහෙක් එයත් එක්ක හිටිය අනෙක් කෙනාට කිවුවා.

''කොහේ ගියත් මොකට ගියත් අපිට මොකෝ. උඹ හිතන්නෙ රණබාහු මහත්තයට මිනිස්සු නෑ කියලද? තව දෙතුන් පලක නවත්තන කොට බස් එක පිරෙන්න සෙනඟ ඉදියි. හවසට රුපියල් දාහක්වත් ලැබෙනව නම් ඒ ඇති. මේ

එක්ක යන්නෙ@ ගේමකට නෙවෙයි. ගේමකට යනවා නම් අපිව අමුවෙන් යවන්නෙ නෑ.''

තවත් කීප තැනක නැවත්පු බස් රථය වරාය දෙසට ගමන් කරන්න පටන් ගත්තා.

''ඒයි මේක යන්නෙ වරාය පැත්තට. අපිව වරාය ඇතුළට ගන්න එකක් නෑ. අපහු හැරිල යන්න වෙනවා.''

''ලොක්ක ඒව බලාගනියි. අපිට තියෙන්නේ දෙන දෙයක් කාල වෙනදෙයක් බලාගෙන ඉන්නයි.''

ඉහළින් ආපු නියෝග අනුව බස් රථය වරාය තුළට ඇතුළු කෙරුණා. ඒක කෙලින්ම ගමන් කළේ කුණු කන්ටේනර් නවත්තලා තිබ්ච්ච තැනටයි. ඒගොල්ලන්ව පිළිගන්න අගමැති ලේකම්වරයා එතන බලාගෙන හිටියා. බස් රථයෙන් බිමට බහින දිරාගිය සිරුරු හිමි තරුණ පිරිස දැක්කම ලේකම්වරයා පුදුම වුණා.

අගමැතිතුමා අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතිය කරන්න් මේගොල්ලො එක්කද? අපේ තරුණ පරපුරට වෙලාතියෙන විනාශය. හරි නම් මේගොල්ලන්ව පුනුරුත්තාපනය කරන තැනකට යවන්න වෙනවා. ඒවයින් වැඩක් නෑ. කියපු විදියට වැඩ කරන එකයි තියෙන්නේ.......

''දොරේද අපිව හැඩල් කරන්නේ. අපේ ලොක්ක එන්න කිවුව අපි ආව. මොනවද අපෙන් කෙරෙන්න තියෙන්නේ.''

ලේකම් වරයා ළඟට ආපු කෙසඟ සිරුරක් ඇති මිනිහෙක් ඇසුවෙ කිසිම ගරු සරුවකින් නැතුවයි.

මොනව කරන්නද? මට කරන්න වෙලා තියෙන්නෙ තනතුරට අදාල වැඩ නෙවෙයි................

අගමැති ලේකම් වරයගෙ හිතේ ඇතිවුණේ කලකිරීමක්.

''ඔයගොල්ලන්ට කරන්න තියෙන්නේ මේ කන්ටේනර්වල තියෙන බඩු කොටස් වලට ගලවලා වෙන්කරන එකයි. ඕනැකරන ආයුධ මෙතනින් අරගන්න.''

අගමැති ලේකම් වරයා කළයුතු කාර්ය පැහැදිලිකර දුන්නා.

''මේක බෝතල් පත්තර බිස්නස් එකක්ද? මේව කරලා කීයක් හොයන්නද? අපිත් ඉස්සර නම් මේ ජොබ් එක කළා. වැඩක් නෑ, දවසෙ ගානවත් කවර්

කරන්න බෑ. මොනව උනත් කමක් නෑ. හවස් වෙන කොට අපේ අතට ගානක් ලැබෙනව නම්.

ලේකම්තුමාට ඇහෙන්න පිරිස අතරේ සිටි අයෙක් කිවුවා.

“උඹල බයවෙන්න එපා. රණබාහු මහත්තයා ඒක බලාගනියි. අපි මේක කරල දාමු.”

ලේකම්වරයා එක්ක කතා කරපු අයගේ මෙහෙයවීමෙන්, නියඟයට හසුව කේඩැරිවී ගිය ගස් වගේ සිහින් තරුණ පිරිස තම රාජකාරිය ආරම්භ කළා. දවල් කෑමවත් ගන්නෙ නැතිව වැඩ කරපු ඒගොල්ලන්ට සවස තුන විතර වෙන කොට කන්ටේනරයක තිබ්බිච කුණු තෝරලා ඉවර කරන්න පුළුවන් වුණා.

************************************

“උඹලා කන්න බොන්න ගියාම ඉවරයක් නෑ. මෙතන තියෙන්නේ ලෝකෙ තියෙන අන්තිම බීම ටික නෙවෙයි. දැන් හවස තුනටත් ළඟයි. දැන්වත් ඕක නවත්වලා වරාය පැත්තේ ගිහින් එමු.”

අගමැතිවරයා කිව්වෙ ඉවසීමේ සීමාව පැන්නට පස්සෙයි. ඒ වෙන කොටත් පිරිස අතරේ හිටපු බොහොම දෙනකුගේ රතු ඉර ඉක්මවා ගිහින් ඉවරයි.”

“දැන් වරාය පැත්තේ ගිහින් මොනවා කරන්නද? ඇත්ත වශයෙන්ම කියනව නම් අද මට හරියට කනගාටු දවසක්. කිසිම ගේමකින් පරාජය වුණේ නැති මම අද සොබාසිරිට පරාද වුණා. ඒකට වගකියන්න ඕන ඔයා. ඔයා එපා නොකීව නම් අද වෙනකොට සොබාසිරි ගේමෙ නෑ. අපේ පරාජයට ඔබතුමා වගකියන්න ඕනැ. ඇහුනෙ නැතිව වගේ ඉන්න හදන්න එපා. මම මේ කතා කරන්නෙ තමුසෙට.”

රණබාහු අගමැතිවරයා හිටපු තැනට යන ගමන් ගමන් කිවුවා. මන්ත්‍රීවරු කීප දෙනෙක් මැදට පැනලා එයාගෙ ගමන බොහොම අමාරුවෙන් නවත්ත ගත්තා.

“සොබාසිරිව මේ ගේමෙන් අයින් කරන්න තව කල් තියෙනවා. මේ වෙලාවෙ ඔබතුමාට මේව තේරුම් කරලා දෙන්න බෑ. සිහි බුද්ධිය තියෙන වෙලාවක පැහැදිලි කරලා දෙන්නම් රණබාහු මන්ත්‍රීතුමා මෙතන හිටියාවෙ. අපි වරාය පැත්තෙ ගිහින් එමු.”

අගමැතිවරයා කිව්වෙ කිසිම දෙයක් සිදුවුණේ නෑ වගෙයි.

“ස(ර්) දැනටමත් අපි පරක්කුද මන්දා. කවුරුවත් එතන නැති වෙන කොට උන් පොරොන්දු වෙච්ච දේවල් ලැබෙන්නෙ නෑ කියල හිතලා ආපු අය වැඩේ දාල ගියාද දන්නෙ නෑ.”

මුදල් ඇමති ධනවර්ධන මහත්තයා කිව්වෙ පුටුවෙන් නැගිටින ගමන්. අගමැති තුමත් එක්ක වරාය පැත්තෙ යන්න පුළුවන් තරමට සිහි බුද්ධියෙන් හිටියෙ මුදල් ඇමතිතුමා විතරයි.

“එහෙම වුණොත් නම් වැඩ ඔක්කොම ඉවරයි. මගේ පැලෑන් ඔක්කොම වතුරේ. එහෙම දෙයක් වුණා නම් ලේකමා දන්වන්නෙ නැතිව ඉන්නෙ නෑ.”

තමාටම කියාගත්තු අගමැතිතමා වාහනය ළඟට දුවගෙන ගියා. මුදල් ඇමතිතුමත් එයාව අනුගමනය කළා.

“ගාටන්නෙ නැතිව ඉක්මනට යනවා.”

වාහනයට නැගපු අගමැතිතුමා රියදුරාට කෑහැහුවෙ කවදත් නැති හදිස්සියකින්.

අගමැතිවරයාගේ අණ දීමත් එක්කම රථ පෙළ හඬ නගමින් වරාය දෙසට පියඹන්න වුණා.

**********************************

“ඔන්න අපේ වැඩේ නම් හරියට කෙරුණා. දැන් තියෙන්නේ ස(ර්)ල පොරෙන්දු වුණු දේවල් දෙන එකයි.”

පිරිස හසුරවමින් හිටපු මිනිහා අගමැති ලේකම් වරයා ඉදිරියේ පෙනී සිටිමින් කිවුවා.

“ඔයගොල්ලන්ට තව ටික වෙලාවක් ඉන්න වෙනවා. තෝරපු දේවල්වල බර අනුව තමයි ඔයලට ගෙවීම් කරන්නේ. එක එක්කෙනා තෝරපු ගොඩවල් කිරල බලන්න ඕනෑ.”

“ඒ මොන කුණුහරුප කතාවක්ද? වෙන් කරපු දේවල් ඔක්කොම එකට ගොඩ ගැහුවා. කිරල මැනල ගෙවන්න හදන්න එපා. කෑම බීමත් නැති නිසා එක්දහස් පන්සීයක්වත් ඕනෑ.”

දවසේ වියදමවත් ලැබෙන එකක් නෑ කියල හිතපු මිනිහ කිව්වෙ බොහොම කේන්තියෙන්.

“කලබල වෙන්න එපා. හැම දෙනාම තෝරපු දේවල් වෙන වෙනම නැති නිසා මේ කන්ටේනර් එකක් තෝරල වෙන්කළාට ලැබෙන මුදල හැමදෙනාටම සමානව බෙදල දෙන්න වෙනවා. මෙතන පනස් දෙනෙක් ඉන්නවා. ඒ කියන්නේ එක්කෙනෙකුට රුපියල් දහ දාහක් ලැබෙනවා.”

ලියනගේ මහතාගේ අවසන් වචන කීපය පිරිස පුදුමයෙන් පුදුමයට පත්කෙරුවා.

“රුපියල් දහදාහක්! ස(ර්) ඕක මුලින්ම කිවුව නම් අපි තව ටිකක් මහන්සිවෙලා වැඩකරනවා. ස(ර්) මේ ජොබ් එක අදින් ඉවරද? අපි හෙට එන්න එපාද? ”

අපේක්ෂා නොකල මුදලක් ලැබීම පිළිබඳව හැමදෙනා තුළ ම ඇතිව තිබුනේ පුදුමයක්. ලැබිච්ච අවස්ථාවෙන් උපරිම ඵල නෙලා ගැන්න බැරිවුණු එක ගැන පසුලැවිල්ලක් එක්ක මෙම වාසනාව දිගටම උදාවෙනව නම් යන හැඟීම ද ඒගොල්ලන්ගෙ හිත්වල තිබුණා.

“තව පොඩි වෙලාවක් ඔහොම ඉන්න. අපේ අගමැතිතුමා තව ටිකකින් ඇවිත් හෙට කරන්න ඕනැ දේ කියයි.”

අගමැතිතුමා එතනට එනකොටම එතුමා එනතුරු මගබලමින් සිටි පිරිස වෙතින් ප්‍රීති ඝෝෂාවක් නිකුත්වුණේ කාගෙවත් අණ කිරීමකින් නෙවෙයි. එම හඬින් තමාගේ බලාපෙරොත්තු සඵල වෙලා තියෙන බව වැටහී ගිය අගමැතිවරයා ආරක්ෂක භටයන් නැතිව ම පිරිස ඉදිරියට ගමන් කළේ ඡන්ද කාලෙදි රටටම පේන්න මිනිස්සු අතරට යනව වගෙයි.

“අපේ රටේ අනාගතය සුබිත මුදිත කරන ව්‍යාපෘතියේ පළමු හවුල් කරුවන් වන ඔබ සමඟ වචනයක් කතා කරන්න ලැබීම ගැන මම බෙහෙවින් සතුටු වෙනවා. මේ ව්‍යාපෘතියෙන් ජනතාවට කොතරම් සවියක් ලැබෙනවද කියලා අලුතෙන් කියන්න ඕනැ නෑ. ඒ ප්‍රතිලාභ ඔබ හැම දෙනාම මේ වෙන කොටත් අත් විඳල තියෙන බව මට පේනවා.

මේ රටේ ජනතාවගේ දුප්පත්කම තුරන් කරන්න බලාපොරොත්තු වුණත් නැති බැරි අය ඇති හැකි අය වෙනවට අකමැති අය මේ ව්‍යාපෘතියට විරුද්ධව කටයුතු කරනවා. ඒ අයගේ බාධා කිරීම් නො වෙන්න මේ ව්‍යපාතියේ ප්‍රතිලාභ මේ වෙන කොටත් ජනතාවට ලැබිලා අවසානයි. ජනතා සුභ සිද්ධියට බාධා කරන ප්‍රතිගාමීන් පරාජය කරන්න ඔබ සැමගේ සහයෝගය අවශ්‍ය කරනවා. අපේ ව්‍යාපෘතිය එක්ක දිගටම සම්බන්ද වෙන්න කැමති කවුද?

මෙ පමණ කාලයක් රැකියා ලබාදුන්නේ මැති ඇමතිවරු. ඒ ක්‍රමය වෙනස් කරලා හෙට දවස වෙනකොට ඔබ සැම දෙනාම රැකියා ලබාදෙන අය බවට පත්කරනවා. නිකම්ම නොවෙයි අපි ළඟට එක්කරගෙන එන එක්කෙනෙක් වෙනුවෙන් අපි ලබාදෙනවා රුපියල් දහසක මුදලක්.

එක්කෙනා විසි දෙනෙක් එක්කරගෙන ආවොත් හෙට දවසෙදි දාහකට වැඩි පිරිසක් මෙතනට එකතු වෙනවා. ඒක වරායෙ කටයුතුවලට බාධාවක්. ඉදිරියේදි කුණු වෙන්කිරීමේ කටයුතු වරායෙන් පිටත කරන්න සිදුවෙනවා. මෙතන ඉන්න හැම දෙනාම මේ ව්‍යාපෘතියට එකතු වෙන්න කැමති අයත් එක්ක හෙට උදේ හත වෙනකොට වරාය ගේට්ටුව ළඟට එන්ක කියලා ඉල්ලා සිටිනවා.”

එතන හිටපු අයගෙ ප්‍රීති ඝෝෂා මැද්දේ අගමැතිතුමා කිව්වෙ බොහොම සතුටෙන්.

“ස(ර්) වැඩේ කරන තැන කිවුව නම් අපිට එතනට එන්න පුළුවන්. නැති නම් අපිට කුණු ගෙනියන කන්ටේනර් පස්සෙන් වාත වෙන්න වෙයි.”

පිරිසේ සිටිය කීප දෙනෙක්ම එකවර කිවුවා.

“වැඩ කරන තැන දැන්ම ම කියන්න බෑ. මොනද මේ ව්‍යපෘතියට විරුද්ධ අය ඒක දැනගත්තොත් අපේ කටයුතුවලට බාධා කරන්න පුළුවන්. අපි වරායෙ දොරටුව ළඟ ඉඳලා කුණු වර්ග කරන තැනට යන්න වාහන සපයනවා. අපි එදත් අදත් හෙටත් දිවි හිමියෙන් කටයුතු කරන්නේ මහජනතාවගේ යහපත සඳහා පමණයි. දැන් හැමදෙනාම මෙතන තියෙන බස් එකට නගින්න. ඔයගොල්ලන්ව එක්ක ආව වගේ ආපසු ගෙවල් වලට ඇරලවන එක අපේ වගකීමක්.”

අගමැතිවරයා පිරිස බස් රථයට ගොඩවන ආකාරය බලාසිටියේ සිනාමුසු මුහුණෙන්.

“මල්ලි අපිව ගේට්ටුව ළඟින් හලාගෙන ඔයා යන තැනක යන්න. සල්ලි හම්බුවුණු වෙලාවෙ ගෙවල්වලට ඕන දේවල් අරගන්න ඕනැ.”

බස් එකේ හිටිය අයගෙන් වැඩිදෙනෙක් බහින්න ලැහැත්ති වුණා..

“උඹලට පිස්සුද? මෙහෙදි වියදම් කළාට කාටවත් පේන්නේ නෑ. අපි වත්තට ගිහින් සුද්දො වගේ වියදම් කරනකොට මේ ජොබ් එකෙන් සැහෙන්න හොයන්න පුළුවන් බව මුළු පළාතම දැනගන්නවා. එතකොට වත්තෙ එකාල අපේ ජොබ් එක ගැන අහන්න වටවෙයි. අපිට දාහෙ කැලි දෙතුන් සීයක් හොයාගන්න පුළුවන්.”

පිරිසේ නායකයා වගේ වැඩකරපු කෙනා කිවුවා. ඒත් බස් එක නතරකරවාගත්තු ටිකදෙනෙක් වරාය දොරටුව අසළදී ම බස් එකෙන් බැස්සෙ තමන් අතේ තියෙන මුදල් ඉක්මනින් වියදම් කරන්න තියෙන ආසාව නිසයි.

**********************

ආණ්ඩුවෙ සැලසුම් පරජය කරන්න පුළුවන් වෙච්ච එක ගැන සොබාසිරිගෙ හිතේ ලොකු සතුටක් තිබුණා. විරෝධතාවය අවසානයේ පවත්වපු මාධ්‍ය සාකච්ඡාව ඉවරවෙලා නවාතැනට එනකොට හොඳටම රෑවෙලා ඉවරයි.

“අද කිසිම විවේකයක් තිබුනෙ නෑ. ඒත් හිතට තියෙන්නේ පුදුම සතුටක්. සතුට නිසා මහන්සිය දැනෙන්නෙ නෑ.”

සොබාසිරි කිව්වෙ රටක් රාජ්‍යක් ජයගත්ත වගේ සතුටකින්.

“අපිට දිගටම වරාය ළඟ මුරකරන්න වෙනවද? ආණ්ඩුව අපිට එපාවෙන තුරු අපිව වාතකරන්න හදන්නේ.”

“එහෙම වුණොත් ඒගොල්ලන්ට තාවකාලිකව දිනුම දෙමු. මේ මොරාල් එක දිගටම තියාගන්න පුළුවන් වුණොත් දිනුම අපේ අතේ. තව මාස දෙකක් ඇතුළත ජනාධිපතිවරණය තියන්න ඕනෑ. ඒකට මමත් ඉදිරිපත් වෙන්න බලාපොරොත්තු වෙනවා. මට අනිවාර්යෙන්ම දිනන්න පුළුවන්. මම අද තිබ්බ මාධ්‍ය සාකච්ඡාවෙදි පිටරට කුණු අපේ රටට ගේන එකට විරුද්දව පාරට බැහැලා අපිත් එක්ක එකතුවෙන්න කියලා ජනතාවගෙන් ඉල්ලුවා. හෙට විරෝධතාවයට ජනතා සහයෝගයත් ලැබෙයි.”

“බලය ලබාගන්න හිතට ආවම ඒකෙ කෙළවරක් නෑ. ස(ර්) මුලින් ඇමතිකමක් බලාපොරොත්තු වුණා. දැන් ජනාධිපති වෙන්න හදනවා හෙට විරෝධතාවෙට මට එන්න බැරිවෙනවා. මම ජොබ් එකකට ඇප්ලිකේෂන් දාල තිබුණා. ඒකෙන් ඉන්ටවු කෝල් කරල තියෙනවා. ස(ර්) ජනාධිපති වුණාට පස්සෙ අපිටත් යන කලදවසක් තියෙන්න එපායැ. ”

“මම ජනාධිපතිවරණයට ඉදිරිපත් වෙන්නේ මේ විනාශය වලක්වන්න තියෙන එකම මාර්ගය ඒක නිසයි. ජනාධිපතිකම ලැබුණොත් මට පුළුවන් රටේ ලොකු වෙනසක් ඇතිකරන්න.”

සාගරගෙන් පිළිතුරක් බලාපොරොත්තු වුණත් ඒ වෙනුවට ඇසුණේ ගෙරවුම් හඬක්. සොබාසිරි කල්පනා සයුර තරණය කරන්න වුණා.

මම ජනාධිපතිවරණයෙන් දිනුවට පස්සේ ජනමතවිචාරණයක් තියලා පාර්ලිමේන්තුව විසිරුවනවා. මේ හොරු ටික පන්නලා උගත් බුද්ධිමත් මහජන නියෝජිතයන් ඉන්න පාර්ලිමේන්තුවක් හදනවා. දැන් තියෙන පාර්ලිමේන්තුවේ උගත්කමක් තියෙන කීදෙනාද ඉන්නේ.වැඩිපුර ඉන්නේ ඕලෙවල් පාස් නැති අය. පාර්ලිමේන්තුව කියන්නේ රටේ නීති හදන තැන, ව්‍යවස්ථාදායකය. හරි නම් එතන ඉන්න ඕනෑ උගත් අය. එතන උගතුන්ට තැනක් නෑ. මට වුණෙත් ඒ ටිකමයි. පාර්ලිමේන්තුවේ ඉන්න උගතුන්ටත් නූගතුන් කියන විදියට ඉන්න වෙනවා..........

කල්පනා සයුර තරණය කරමින් සිටි සොබාසිරිට නිදි ලොව වෙත පැමිනීමට හැකිවුණා.

***************************

"මුදලාලි මගේ පොතේ ගාන බලනවද?"

පළාතටම ඇසෙන්නට කෑගහගෙන සෝමෙ කඩයට ගොඩවුණා.

"දැන් කීසැරයක් පොතේ ගාන බලලා තියෙනවද? තරහවෙන්න එපා පොතේ ගාණෙන් බාගයක්වත් ගෙවන්නෙ නැතිව ආයෙ බඩු ඉල්ලන්න එපා."

"දැනට මේ පහ තියාගන්න ඉතුරු ටික හෙට දෙන්නම්. අපිට ආණ්ඩුවේ ජොබ් එකක් සෙට් වුණා. මුදලාලිත් මේක වහල දමලා අපිත් එක්ක යමු. අවුලක් නැතිව දහයක් පහළොවක් හොයන්න පුළුවන්."

සොමපාල කියපුදේ අහල මුදලාලි පුදුම වුණා.

"දහයක් පහළොවක්! යකෝ මට මේ කඩේ දවසම හිටියත් රුපියල් දාහක් හොයාගන්න බෑ. උඹල කරන්නේ හිරේ විලංගුවේ වැටෙන වැඩන් නෙවෙයිනේ. මාවත් ගණන් තියාගනින්."

"එහෙම නම් හෙට උදේ හය වෙනකොට අපේ ගේ ළඟට එන්න. තව සීයක් සෙට්කරගත්තත් අවුලක් නෑ."

තමන්ගෙ අලුත් රැකියාවෙන් හොයපු සල්ලි ගමටම ඇහෙන්න වියදම්කරපු සෝමපාල ඇහැරුනේ එයාගෙ හාමිනේගෙ කෑගැහිල්ලෙන්.

"රෑ තිස්සෙ බීගෙන ඉර පායනකන් නිදාගන්නවා. අන්න සීයක් විතර ගේ ඉස්සරහ පිරිල. ඒ මිනිස්සුන්ට රස්සාවල් දෙනව කිවුවද? ."

"සීයක් විතර ඇවිත්! කොලුවට කියපන් පොලියගෙන් සල්ලි ඉල්ලගෙන බස් එකක් හයර් එකට අරගෙන එන්න කියලා.

එහෙම කියපු සෝමපාල දඩ් බිඩ් ගාල ලැහැත්ති වුණා. සෝමපාලලා වරාය ළඟට යන්න ලැස්ති වෙනකොට සොබාසිරි වරාය ලඟට යන්න හිතලවත් නෑ.

"උදේ හතටත් ළඟයි. පත්තරවල හෙඩ්ලයින් බල බලා හිටියා දන්නෙම නෑ දවල්වෙලා. අපේ විරෝධතාව ගැන පත්තරවලින් හොඳ ප්‍රචාරයක් දීල තියෙනවා. අද හවස මාධ්‍ය සාකච්ඡාවක් තියලා මම ජනාධිපතිවරණයට ඉදිරිපත් වෙන බව කියන්න ඕනෑ."

සොබාසිරි කිව්වෙ වරාය ළඟ මුරට යන්න සූදානම් වෙන ගමන්.

"ස(ර්)ව වරාය ළඟට ඇරලවන්නම්. මට තව වෙලාව තියෙනවා."

සොබාසිරිව බයික් එකට නග්ග ගත්ත සාගර බයික් එක පාරට අරගත්තා. වරායට කිට්ටු වෙනකොට වෙනදා නැති වාහන තදබදයක් ඔවුන්ගේ ගමන පමා කළා.

"අපිට අට වෙන්න ඉස්සර වරාය ළඟට යාගන්න බැරිවෙයිද?. කුණු පටවපු කන්ටේනර් උදේ අට වෙනකොට වරායෙන් පිටවෙනවා. එතන දැනුමක් තේරුමක් තියෙන කවුරුවත් නෑ. ඉන්නෙ පස්ට් ඉයර් එකේ කට්ටියක් විතරයි."

"තව විනාඩි විස්සක් තියෙනවා. මේ ට්‍රැපික් එක නැත්නම් විනාඩි පහේ ගමන."

එහෙම කියපු සාගර වාහන අතරින් හා පදික වේදිකා උඩින් යතුරුපැදිය එලවන්න පටන් ගත්තා. සාගරට අටට මිනිත්තු පහක් තියෙද්දි වරාය දොරටුව පේන මානයට එන්න පුළුවන් වුණා.

"තව ඉස්සරහට යන්න බෑ. ඉස්සරහ පාර වැහෙන්න සෙනඟ පිරිලා."

"අපිට සෑහෙන ජනතා සහයෝගයක් තියෙනවා. මේ මිනිස්සු ඇවිත් ඉන්නේ අපේ සහයෝගයට. සාගර ආපහු හරවගෙන යන්න. මම මේ ටික පයින් යන්නම්."

පිටරට කුණු අපේ රටට ගේන එක වලක්වන්න සහයෝගය දෙන්න කියලා ඊයෙ කරපු ඉල්ලීමට හොඳ ජනතා ප්‍රතිචාරයක් තියෙනවා. අපේ කට්ටිය පැත්තක, ඒගොල්ලො අපේ සභයට ආපු අයත් එක්ක කතා කරලවත් නෑ. දෙගොල්ලොම එකට එකතු වුණා නම් මහා බලවේගයක් වෙනවා. කොහෙද මේ ට්‍රැපික් එකක් හින්ද පරක්කු වුණානෙ. හැමදේම කරන්න වෙලා තියෙන්නේ මටමයි..................

එලෙස සිතමින් වරාය පිවිසුම් දොරටුව වෙත ඉක්මන් ගමනින් ගමන් කරන සොබාසිරිට වරායෙන් පිටතට පැමිනෙමින් තිබෙන කුණු පැටවූ රථ පෙළ දකින්න ලැබුණා. සොබාසිරි විරෝධතා පුවරුවක් අරගෙන රථ පෙළ ඉදිරියට දුවගෙන ගියේ වාහනවල ගමන නවත්තන්න. අනෙක් විරෝධතා කරුවන්ද සොබාසිරි අනුගමනය කරමින් ඔහු පසුපසින් එක්වුණා.

**********************************

“මේ ඔක්කොම ඇවිත් ඉන්නේ ජොබ් ගන්නද? දැනටමත් දාහකට වැඩිය ඉන්නවා. මේ ඔක්කොටම දෙන්න ජොබ් තියෙනවද? ”

මුදලාලි සෝමෙගෙන් ඇහුවෙ සැකමුසු හඬකින්.

“ලංකාවෙ ඉන්න ඔක්කොම ආවත් ජොබ් දෙන්න පුළුවන් කියලයි අගමැතිතුමා කිව්වෙ. අපේ ජොබ් එක නැතිවෙන්නේ එහා පැත්තෙ බෝඩ් අල්ලගෙන ඉන්න හෙනහුරෝ හින්දයි.”

සෝමසිරි කිව්වෙ පාරෙන් එහා පැත්තෙ ඉන්න පිරිස පෙන්වමින්.

“උන් ටික මොනවා කරන්නද? එතන පනහක්වත් නෑ. උන් ටික බෝඩ් අල්ලගෙන කෑගහලා හති වැටුනම ආපහුයයි.”

“මුන් ටික ඔහොම හිටියට ඊයෙ පාර හරස් කරලා වාහන එළියට යන එක නැවැත්තුවා. මුන්ගෙ ලොක්ක තාම ඇවිත් නෑ. අර පහුගිය දවස්වල මීටින් තිය තිය රට වටේම ගියේ.”

“මොකා වුණත් කමක් නෑ. අද පාර හරස්කරන්න පාරට බැස්සොත් කනෙන් අල්ලලා පැත්තට ඇදල දනවා. කඩෙත් වහල ඇවිත් රෙද්දක් ඇඳගෙන හිස් අතින් ගෙදර යන්න පුළුවන්ද? .”

“මුදලාලි ඕවට අත දාන්න යන්න ඕනෑ. එහෙම දෙයක් වුණොත් මම බලාගන්නම්. මුදලාලිට වගේ නොවෙයි අපිට උලත් එකයි පිලත් එකයි. අන්න අපේ වාහන එනවා. අපිත් එක්ක ආපු අය එකතැනකට එකතු වෙන්න.”

තමන් එක්කරගෙන ආපු පිරිස එක තැනකට කරපු සෝමසිරි පාර දිහා බැලුවේ තමා පසුකරයන කන්ටේනර් රථයක් දැකගන්න. ඒත් ඔහුට දක්නට ලැබුණේ පාර අවුරාගෙන සිටන විරෝධතා කරුවන් පිරිසක්.

මේ යක්කු හදන්නේ අපිට බඩේ පාර ගහන්න. සති ගාණකට පස්සේ සෙට් වෙච්ච ජොබ් එක නැතිකරන්න හදනවා. කඳ බඩ පුරා කාල ඉන්න එවුන්ට

දුප්පතාගේ දුක තේරෙන්නේ නෑ. කාපුව දිරවන්න බැරුව අපිට බඩේ පාර ගහන්න............

"වාහන වලට ඉඩදීල පාරෙන් අයින්වෙයල්ලා. අපිට පාන් කෑල්ලක් කන්න කීයක් හරි හොයාගන්න ඉඩදීල."

සෝමපාලගේ හඬ උද්ඝෝෂකයින්ගේ හඬ පරදවා පැතිරගියා. එම හඬ රැකියාවක් බලාපොරොත්තුව සිටි පිරිස අවදි කිරීමට සමත්වුණා.

"වරෙල්ලා මුන්ව පාරෙන් ඇදලා දාන්න."

පිරිස අතරින් නැඟුනු හඬත් එක්ක කිහිප දෙනෙක් උද්ඝෝෂකයින් පලවාහැරීමට ඉදිරියට පැමිණියා. ඊළඟ තත්පරයේදී එම පිරිස සිය ගණනත් දක්වා වැඩිවුණා. තමන්ට විරුද්ධව ඉදිරියට එන පිරිස දැකපු උද්ඝෝෂකයන් පසුබැස යන්නට වූණේ බයිසිකල් චේන් දැලිපිහි ප්‍රහාර වලට තියෙන බයෙන්. හමුදාව පොලීසිය එන්නෙ නැති තැන්වල මැර හමුදා රජකරන බව ඒගොල්ලො දන්නවා. අන්තිමේදි කුණු පටවපු රථපෙළේ ගමන නවත්තන්න පාර මැද ඉතිරි වුණේ සොබාසිරි විතරයි.

දැන් මොකද කරන්නේ. සිය ගාණක් මැද මාව තනිවෙලා. අපි මේ කරන්න හදනේ අපේ රට බේරගන්න මිසක දුප්පත් අයගේ බඩවියත නැතිකරන දෙයක් නොවන බව පැහැදිලි කරලා දෙන්න ඕනෑ. සොබාසිරි තමාට විරුද්ධව නැඟීසිටින පිරිස අමතා කතාකිරීමට පටන් ගත්තා.

"සහෝදරවරුනි අපේ සටන ඔයගොල්ලන්ට විරුද්ධව කරන සටනක් නොවෙයි. මේක ඔබේ, ඔබේ දරු දැරියන්ගේ අනාගතය වෙනුවෙන් කරන සටනක්....."

සොබාසිරිට තවත් ඉදිරියට කතාකිරීමේ අවස්ථාවක් ලැබුණෙ නෑ.

"වහපිය කට. වේල් ගාණකින් කන්න නැතිව ඉන්න අපේ දරුවන්ගේ අනාගතය වෙනුවෙන් උන්ට පාන් කෑල්ලක් ගන්න කියක්හරි හොයාගන්න එක නවත්වනවා. තොපිට දෙන්න ඕන රජකාලෙ දඬුවම්. කඳ බඩ පුරා කාල ඉන්න එවුන්ට බඩගින්න නිවාගන්න අපි විදින දුක තේරෙන් නෑ."

එහෙම කෑගහගෙන ළඟට ආපු මුහුණ පුරා රැවුල වැවිච්ච හැඩිදැඩි මිනිහෙක් සොබාසිරිව පාරෙන් ඉවතට තල්ලුකර දැම්මා. බෝනික්කෙක් වගේ විසිවී ගිය සොබාසිරි පාර අයිනේ කානුවකට වැටිල නතරවුණා.

****************************************

තමුසෙ මොකද ඒ මහත්තයව තල්ලු කළේ. රැස්වූ පිරිස රැවුල වවාගත් මිනිසාට පහරදෙන්න පටන්ගත්තා.

"එයාට ගහන්න එපා. පිටරට කුණු ලංකාවට ගේන එකෙන් රටට වෙන හානිය එයාට තේරෙන්නේ නෑ."

සොබාසිරි පිරිස සන්සුන් කරල තමාට පහරදුන් මිනිහව බේරාගත්තා එයා සොබාසිරි දිහා බැලුවෙ පුදුමයෙන් වගෙයි. වරාය දොරටුව ළඟ මාර්ග බාධකයක් හැටියට තියල තිබුණු බැරලයක් මතට නැඟගත්ත සොබාසිරි රැස්ව සිටි පිරිසට පිටරටින් ලැබෙන කුණු මගින් සිදුවන හානිය පහදා දෙන්න වුණා. කතාව අවසාන වෙනකොට  කුණු පටවාගත්තු වාහන පේළිය ආපසු වරාය තුළට ගමන් කරන්න පටන්ගත්තා. පහුවදා පුවත්පත්වල සිරස්තලය වුණේ කුණු පටවපු කන්ටේනර් වරායෙන් පිටතට ගෙනයාම රියදුරන් විසින් ප්‍රතික්ෂේප කිරිම නිසා ලංකාවට ගෙන ආ කණු පිරවූ කන්ටේනර් සියල්ලම ආපසු යැවීමට කටයුතු කරන බවයි.

ඒ ජයග්‍රහණයත් එක්ක සොබාසිරිට ඉදිරි ජනපතිවරණයට ඉදිරිපත්වන ලෙස ඉල්ලීම් ගලා එන්නට පටන්ගත්තා. සොබාසිරි නාමයෝජනා බාරදුන්නේ නියත ජයක් ලබන බලාපොරොත්තුවෙන්. ලංකාව පුරා පැවැත්වපු රැස්වීම් වලට බලාපොරොත්තු නොවූ ජනතා සහභාගීත්වයක් ලැබුණා. ආණ්ඩුපක්ෂයේ සහ විපක්ෂයේ අපේක්ෂකයින්ට සොබාසිරිට අභියෝගයක් වෙන්න පුළුවන් කමක් තිබුණ නෑ. පෘථිවිය තම කක්ෂය වටා භ්‍රමණය වෙමින් මැතිවරන දිනය උදාකළේ අලුත් වෙනසක් බලාපොරොත්තුවෙන්.

"ස(ර්) මෙහාට ම වෙලා ඉන්න මම ඡන්දෙ දාල ටක් ගාල එනවා."

උදෙන්ම ඡන්දය දාපු  සොබාසිරිව නවාතැනට ඇරලවපු සාගර ඡන්දෙ දාන්න ගමට යන්න ලැහැත්තිවෙලා කිවුවා.

"සාගරගෙ ඡන්දෙ නැතිවට මට අනිවාර්යයෙන්ම දිනන්න පුළුවන්. සාගර ඔන්න ඔහේ මෙහාටවෙලා ඉන්න."

සොබාසිරි එහෙම කිව්වෙ තමාගේ ජය නියත බව දන්නා නිසායි.

"මෙච්චර කරපු එකේ මේකත් කරලම දානවා. මම ඡන්දය නොදැම්මොත් සොබාසිරිගේ ළඟම ගෝලයත් ඡන්දෙ දැම්මෙ නෑ කියල ටී වී එකේ දායි."

එහෙම කියපු සාගර පිටවෙලා ගියා.

ඇත්තටම ජනදාස කියන්නේ නියම මහත්තයෙක්. පරාද වෙන බව දැනගෙන ඒකට ඉඩදුන්න මිසක මට අනතුරක් කරලා මාව මරලදාල දිනුම ලබාගන්න හිතුවෙ නෑ. මම ජනාධිපති වුණාම එයත් එක්ක සහයෝගයෙන් වැඩකරන්න ඕනෑ........

සාගර පිටවගියාට පස්සෙ නවාතැනේ තනිවෙච්ච සොබාසිරි කල්පනා කළා. සාගර අපහු ආවෙ සොබාසිරිගේ ජය ස්ථිර බව පවසමින්.

“ඔන්න මම ඇඳුම් දෙකක් මැදලා තිබ්බා. තව ටිකක් වෙලා යනකොට ටීවී චැනල්වල කට්ටිය ස(ර්)ව ඉන්ටවීවු කරන්න මෙතනට එයි.”

මැතිවරණ ප්‍රතිඵල විකාශනය නරඹන අතර සාගර කීවේ විහිළුවට වගෙයි.

“දැනට කියවිච්ච ප්‍රතිඵල වලට අනුව නම් මම අනවාර්යෙන්ම දිනන්න ඕනෑ . මම ටිකක් නිදාගන්නවා. මම නැගිටිනකොට කම්පියුටර් ජිල්මාට් එකක් කරල මාව පරාදවෙලා තියෙයිද දන්නෙ නෑ. ටීවී චැනල් වලින් එනවා නම් කෝල් එකක් දෙයි. කෝල් එකක් ආවොත් මට ඇහැරවන්න. හෙට වැඩ ගොඩක් කරන්න තියෙනවා. ”

එහෙම කියපු සොබාසිරි නින්දට ගියේ ජනාධිපතිවරයකු ලෙස පිබිදෙන බලාපොරොත්තුව හිතේ තියාගෙන.

*********************************

රෑ වෙනතුරු නිදිවරල නිදාගත්ත සොබාසිරි ඇහැ ඇරියෙ සාගරගෙ හඬින්.

“ස(ර්) නැගිටින්න, නැඟිටලා මේක බීල ඉන්න.”

“මම ගොඩක්වෙලා නිදාගත්තද? බොන්න දෙයක් ගෙනාපු එක නම් හොඳයි. මහ රෑ වුණත් පුදුම රස්නයක් තියෙන්නේ.”

සොබාසිරි එහෙම කිව්වෙ සාගර තේ එකක් හදාගෙන ඇවිත් කියල හිතාගෙනයි. ඇස් හැර බලපු සොබාසිරිට එයා ඉන්නෙ පාර අයිනේ තියෙන පේමන්ට් එකක බව තේරුණා. එයාට කතා කළේ සාගර නොවන බවත් කෙසඟ සිරුරක් හිමි නන්නාඳුනන  අයෙක් තමා වෙත තැඹිලි ගෙඩියක් දිගුකරගෙන සිටින බවත් දැකගන්න සොබාසිරි පුළුවන් වුණා.

“මම මේ කොහේද ඉන්නේ ප්‍රතිඵල කියල ඉවරද?. සාගර කෙහේද ගියේ.”

“ස(ර්) කියන ඒවා මට තේරෙන්නේ නෑ. මේ වරාය ගේට් එක ළඟ. මම මෙතෙන්ට එනකොටත් ස(ර්) ඔතන වැටිල හිටියා මම හිතුවේ කවුරු හරි බීපු

කෙනෙක් කියලයි. ස(ර්) අතේ තිබුණු බෝඩ් එක දැකලා තමයි ස(ර්)ව අඳුන ගත්තේ. ස්(ර්) මේක බීල ඉන්න.''

තැඹිලි ගෙඩිය අතටගත් සොබාසිරි ඒක හුස්මට බීල දැම්මා.

''බොහොම ස්තුතියි.''

එහෙම කියපු සොබාසිරි සාක්කුවට අත යැවුවේ තැඹිලි ගෙඩිය සඳහා මුදල් ගෙවන්න හිතාගෙන. අතේ ඇඟිළි  සාක්කුවේ අඩිය ස්පර්ෂ වෙනකොට මුදල් පසුම්බිය සාක්කුවෙ නෑ කියල සොබාසිරිට තේරුණා. උඩ සාක්කුවට නෙත් යොමපු ඔහුට තමන්ගෙ දුරකථනයත් නැති බව වැටහුණා.

''සොරි මගේ ප(ර්)ස් එක උස්සලා. ඒ මදිවට ෆෝන් එකත් නෑ.''

''මට සල්ලි ඕනැ නෑ. තව ටික වෙලාවක් හිටිය නම් ස(ර්)ගෙ කලිසමයි කමිසෙයි නැතිවෙනවා. ස(ර්) දැන් ගෙදර යන්නෙ කොහොමද? ඔළුවත් තුවාලවෙලා, ඇඳුම්වල හැමතැනම ලේ ගැවිල. මේ ඇඳුම් ඇඳගෙන බස් එකක යන්නෙ පුළුවන්ද? වීල් එකක් නවත්තලා දෙන්නද? උදේ පාන්දර මගේ අතෙත් ලොකු ගාණක් නෑ. ගෙදර ගිහින් වීල් එකේ සල්ලි දෙන්න පුළුවන්නෙ.''

''ඒක කරන්නත් බෑ. මා ළඟ තිබ්ච්ච සල්ලි ඔක්කොම තිබුණෙ ප(ර්)ස් එකේ. මට කෝල් එකක් ගන්න පුළුවන්ද? ''

තැඹිළි වෙළෙන්දාගෙන් දුරකථනය ඉල්ල ගත්තු සොබාසිරි සාගරට ඇමතුමක් ලබාගත්තා. ඊට පස්සෙ එතන තිබ්ච්ච බංකුවෙ වාඩිවෙලා මෙච්චර සෙනඟක් එකතුවුණේ කොහොමද කියල ඇහුවෙ මේ සිද්ධවුණේ මොකක්ද කියල හිතාගන්න බැරුවයි.

''මම හැමදාම ඉන්නේ මෙතන තමයි. ස(ර්)ලගෙ පිකටින් එක හින්දා ඊයෙ උදේ වරුවම බිස්නස් එකක් නැති වුණා. හවස් වෙනකොටත් රුපියල් දෙසීයක් හොයාගෙන තිබුණේ නෑ. මේ ගෙඩියක් විකුණුවම මට රුපියල් විස්සක ලාබයක් තියෙනවා. තවත් ඉන්න එකේ වැඩක් නෑ කියලා ආපහු යන්න හදනකොට වරාය ඇතුළෙ ඉඳලා ආපු බස් එකකින් විස්සක් විතර මෙතනින් බැහැගත්තා. උන් වියදම් කළේ සුද්දො වගෙයි. එක්කෙනෙක් රුපියල් දාහක් දික්කරලා තැඹිලි ගෙඩියක් ඉල්ලුවා. දාහක් මාරුකරන්න නෑ කිවුවම  සල්ලි ප්‍රශ්නයක් නෑ මල්ලි දාහ තියාගෙන  මල්ලි ළඟ තියෙන ගානත් දෙන්න කිවුවා.''

''එහෙම වියදම් කරන්න සල්ලි කොයින්ද?.''

"ඒගොල්ලො කුණු කන්ටේනර් එකක් තේරුවලු ඒකට එක්කෙනෙකුට රුපියල් දහදාහක් ලැබිල තියෙනවා. මටත් අඬගැහුව. මේ තැඹිලි ටික ඉවර වුණාම මමත් ඒ ජොබ් එකට යනවා. මෙහෙම අවුවෙ කරවෙලා හොයන ගාන වගේ දහගුණයක් කුණු තෝරල හොයන්න පුළුවන්."

වෙනද නම් කුණු ගෙන්නන එකට විරුද්ධව කතා කරන සොබාසිරි කතා නැතිව හිටියා. වේගයෙන් ආපු සාගරගෙ මෝටර්සයිකලය තමන් හිටපු තැන නතරකරන කොට සොබාසිරිගෙ හිතට සහනයක් දැනුනා.

****************************************

05

"සාගර අපි පරාද වුණා. අපි නොදන්න ප්ලෑන් එකක් තියෙන බව මට තේරිලා තිබුණා. ඒත් ඒක මේ තරම් දරුණු එකක් කියලා කොයිවෙලාවකවත් හිතුනේ නෑ. අන්තිමේදි අපි නියොජනය කරන සාමාන්‍ය ජනතාව ලවාම අපිට පහර දෙන්න තරම් ආණ්ඩුව දක්ෂ වුණා."

නවාතැනට ආපු සොබාසිරි කිව්වෙ පරාජිත හඬකින්.

"මුදලට කෑදර සුළු පිරිසක් අපිට විරුද්ධ වුණාට රටේ ඉන්න බුද්ධිමත් ජනාතාව අපිත් එක්ක නිසා අපි පරාජය බාරගන්න හොඳ නෑ."

සාගරගෙ හිතේ පරාජය බාරගන් කැමැත්තක් තිබුණෙ නෑ.

"අන්න එතන තමයි අපිට වැරදුනේ. අපි කල්පනා කරන්නේ රටේ ඉන්න හැමදෙනාම බුද්ධිමත් අයයි කියලයි. ඒ ගොල්ලන්ට රට වෙනුවෙන් කැපකිරීම් කරන්න පුළුවන් කියලයි. අපිට රස්සාවක් තියෙන නිසා මුදල් තියෙනවා. කැපකිරීම් කරන්න පුළුවන්. අපි හිතන්නේ මධ්‍යම පාන්තික මානසිකත්වයෙන්. ඒත් වේල කන්න නැතිව කී දෙනෙක් ඉන්නවද කියලා අපිට හිතුනේ නෑ. කන්න දෙයක් නැතිව දරුපැටවු අඬනකොට පිටරටින් ගේන කුණු වලින් රටට වෙන හානිය ගැන හිතන්න ඒ අයට පුළුවන් කමක් නෑ. ඒක අපිට හිතුනේ නැතිවට අගමැතිතුමාට තේරුණා. එයා අපේ ව්‍යාපාරය විනාශ කරන්න ඒක යොදාගත්තා."

"ස(ර්) කියන්නේ විරෝධතාවෙට පහර දුන්නේ ආණ්ඩුවේ මැරයො නෙවෙයි කියලද? ස(ර්) කොහොම කිවුවත් ඒක විශ්වාස කරන්න බෑ. මිනිස්සු

අපිත් එක්ක කියන එක අපි තියපු රැස්වීම් වලදි ඔප්පු වුණා. අපිට පහරදීල තියෙන්නේ මැර පිරිසක්. අපි මාධ්‍ය සාකච්ඡාවක් තියලා පහරදීම හෙලාදකිමු.''

''පහර දුන්නෙ ආණ්ඩුවෙ මැරයො නම් මම මෙලහකටත් පහරදීම හෙලා දැකල මාධ්‍ය සාකච්ඡාවක් තියනවා. මට පහර දුන්නේ දුප්පත්කම නිසා මැරයෙක් බවට පත්වුණු මිනිහෙක්. ඊයෙ අපේ විරෝදතාවය හින්ද කුණු පටවපු කන්ටේනර් ආපහු හරවගෙන ගියාට පනහක් විතර ගෙන්නලා එක කන්ටේනරයක තිබිච්ච කුණු තෝරලා තියෙනවා. ඒක තේරුවට එක්කෙනෙකුට රුපියල් දහදාහක් දීල තියෙනවා. අපි කාල ඇඳල හිටියට කුලී වැඩක්වත් නැති දාස් ගාණක් ඉන්නවා. ඒ අය තමයි අද උදේ වරාය ළඟ පිරිල හිටියෙ. දැන් අපි මොනදේ කිවුවත් වැඩක් නෑ. අපිට තියෙන්නේ පරාජය බාරගෙන පැත්තකට වෙන්න.''

''ස(ර්) ජනාධිපතිවරණයට ඉදිරිපත් වෙන්නේ නැතිද?.''

''රටට විහිළුවක් වෙන්න මම කැමති නෑ. තව ටික දවසක් යනකොට රටේ සල්ලි වැහි වහිනවා, රැකියා හිඟය නැත්තම නැතිවෙනවා. එහෙම වුණාම ආණ්ඩුවෙන් පොල්පිත්තක් ජනාධිපති විදියට ඉල්ලුවත් එයාව පරාජය කරන්න කාටවත් බෑ. මේ සේරටම හේතුවුණේ මා ළඟ තිබිච්ච බල තණ්හාව. අපි කරපු සටනෙ මූලයක් නෑ. ඒක මම තනියම කරපු සටනක්. මම අපිට උදව්වෙන්න ආපු අයත් එක්ක එකතුවුණා නම් මේ වගේ දෙයක් වෙන්නෙ නෑ.''

''රටට මුදල් ලැබුණට පිටරට කුණු අපේ රටට ගේන එකෙන් පරිසරය විනාශ වෙන බව රටටම තේරුම් කරලා දෙමු. අපිට දැන් වුණත් අපිට උදව් කරන්න හදපු අයත් එක්ක එකතුවෙන්න පුළුවන්.''

සාගර දුරකථනය අතට ගන්න ගමන් කිව්වා.

''ඒක වැඩක් තියෙන දෙයක් නෙවෙයි. මුදල් ලබාගන්න පුළුවන් නම් ඕන දෙයක් කරන්න අපේ රටේ මිනිස්සු සූදානම්. මාළු කල්තියාගන්න ෆෝමලීන් ගහන්නේ පලතුරු ඉදවන්න කාබයිඩ් ගහන්නේ එළවළු කෘමිනාශක වලින් නාවන්නේ ඒවායින් වෙන හානිය නොදැන නොවෙයි.''

''ස(ර්) දැන් මොකද කරන්න බලාපොරොත්තු වෙන්නේ.''

''ඒක තමයි මම කල්පනා කළේ . මට තවදුරටත් මේ රටේ ඉන්න බෑ. අහන්නත් බැරි වුණා ඔයා ගිය ඉන්ටවු එක කොහොමද? .''

“මාව ජොබ් එකට තේරුණා. ඒක අලුතෙන් පටන් ගන්න කම්පැනි එකක්. මට දහයක් දෙන්න පුළුවන් කිව්වා. පිටරට ගිහින්වත් එච්චර හොයන්න බෑ. ස(ර්)ටත් එතන ජොබ් එකක් ගන්න පුළුවන්.”

“මම මේ රටේ හිටියොත් හිරේ වැටෙන්න වෙනවා. රට දාල ගන්න හිත දෙන්නේ නෑ. අනෙක රට යන්න තරම් මුදලත් මා ළඟ ඉතුරුවෙලා නෑ.”

“ස(ර්)ව හිරේ දාන්න! ස(ර්) වැරදි කරලා තියෙනවද? ස(ර්) හිරේ දැම්මොත් රටේ ලොකු කැලඹීමක් ඇතිවෙනවා. ”

“කිසිම කෙනෙකුට රස්සාවක් කරන කොට සීයට සීයක් නීතියට වැඩකරන්න බෑ. හිරේ දාන්න ඕනැ නම් ඒ වගේ වැරැද්දක් හොයාගන්න පුළුවන්. රට වෙන්වෙන් ජීවිතය පරදුවට තියල වැඩකරපු අයවත් හිරේ දාපු රටක මාව හිරේ දාන එක මහ ලොකු දෙයක් නෙවෙයි.”

“ස(ර්)ට රට යන්නත් බැරි නම් මෙහෙ ඉන්නත් බැරි නම් මොකද කරන්නේ.”

“මට ටිකක් නිදහසේ කල්පනා කරන්න දෙන්න.”

රෑ වනතුරු කල්පනා කලත් තීරණයකට එන්න සොබාසිරිට බැරිවුණා.

“සාගර මම තීරණයකට ආවා. මට මේ සමාජයෙන් පලායන්න වෙනවා. ඒකට මට සාගරගේ උදව් ඕනෑ කරනවා.”

නිදි නැති රැයකට පස්සෙ උදෑසනම සොබාසිරි එහෙම කියනකොටත් සාගර නැඟිටල හිටියෙ නෑ.

“ඒ කියන්නෙ ස(ර්) රටෙන් පිටවෙන්නද හදන්නේ.”

සාගර ඇහුවෙ ඇනුමක් යවමින්.

“ඒක කරන්න පුළුවන් කමක් තිබුණ නම් මම මේ රටින් යන්නෙ මීට අවුරුදු පහකට විතර ඉස්සර. මම කවදාවත් මේ රට දාල යන්නෙ නෑ.”

“එහෙමනම් ස(ර්) හදන්නේ හැමදාම මේ වගේ කාමරයට වෙලා ඉන්නද? ”

“නෑ මම හිතාගෙන ඉන්නේ වනගත වෙන්න. සාගරට මතකද අපි ගිය පරිසර චාරිකාව.”

“ස(ර්) කියන්නේ ගිය අවුරුද්දෙ ගිය චාරිකාවද? අර නවීන තාක්‍ෂයට හසුනොවුණ ගම්මානය, ඇයි එකපාරටම ඒ ගම්මානය මතක්වුණේ.”

‘‘අම්මවයි තාත්තවයි බලාගෙන සමාජයෙන් හැංගිලා ඉන්න පුළුවන් එකම තැන එතන විතරයි.’’

‘‘එතන ස(ර්)ට කරන්න රස්සාවක් තියෙනවද? ’’

‘‘ඒ ගමට ගියාම මෙහෙදිට වැඩිය මම ඉගෙන ගත්තු දේ වලින් ප්‍රයෝජන ගන්න පුළුවන් වෙයි. මට පුළුවන් එහාට ගිහින් ගොවිතැන් කරන්න. ගොවිතැන මට අලුත් දෙයත් නෙවෙයි.’’

‘‘එහේ ගිහින් ගොවිතැන් කරන්න ස(ර්)ගේ ඉඩම් එහේ තියෙනවයෑ.’’

සොබාසිරි සමාජයෙන් පලායන්න හදන එකට සාගර කොහෙත්ම කැමතිවුණේ නෑ. එයාගෙ කල්පනාව මේ සටන දිගටම කරගෙන යන්නයි.

‘‘ඉඩම් අරගන්න එක අමාරු වැඩක් නෙවෙයි.’’

‘‘ස(ර්) ගහන්න හදන්නේ අමුතුම ගේමක්.’’

සාගර කිවුව නෙවෙයි කියවුණා

‘‘විවෘත ආර්ථිකයෙන් ඇතිවුණු සමාජ වෙනස්කම් වලට අපේ ආදිවාසීන්ට බේරෙන්න බැරි වුණා. ඒත් දැන් රටේ සිදුවෙන ආර්ථික පරිවර්ථනය දරාගන්න ඒ ගම්මානයට පුළුවන් කමක් නෑ. ගමේ ආර්ථිකය රැඳිල තියෙන්නෙ තේ දළු වලින් ලැබෙන ආදායමෙන්. කුණු ආර්ථිකය රට පුරා ව්‍යාප්ත වෙනකොට ෆැක්ට්‍රි වහල දාන්න වෙනවා එතකොට ගම්මානයේ ජීවත්වෙන අය ගම අතහැරලා නගරයට සංක්‍රමණය වෙන්න පටන්ගනියි. සල්ලි ටිකක් තියෙනව නම් ඒ අයගේ ඉඩම් අරගන්න පුළුවන්. සාගරට පුළුවන්ද මගේ කාර් එක විකුණන්න කෙනෙක් හොයල දෙන්න.’’

සොබාසිරි සාගර කියපු දෙය ඇහුනෙ නෑ වගේ කියාගෙන ගියා.

‘‘තව ටිකදවසක් ගියාම ඒක නම් ලේසියෙන් කරන්න පුළුවන්. මිනිස්සුන්ට සල්ලි ලැබෙන කොට හැමදෙනාම වාහන ගන්න හදනවා. තව සතියන් දෙනන් යකනොට වාහන සේල්වල තියෙන වාහන ඉවරවෙනවා. එතකොට ස(ර්)ගෙ කාර් එක නොවටිනා ගානකට විකුණන්න පුළුවන්.’’

ආණ්ඩු පක්ෂයෙන් ජනපති සටන සඳහා ඉදිරිපත් වූණේ අගමැතිවරයයි. එයාට අභියෝගයක් වෙන්න පුළුවන් කිසිම කෙනෙක් ජනපති සටනට ඉදිරිපත්වෙලා හිටියෙ නෑ.

‘‘අගමැතිතුමා මට සමාවෙන්න ඕනෑ. මම ඔබතුමාගෙ වැඩපිළිවෙළට විරුද්ධව කතා කළා. මට ඔබතුමා තරම් දුර දකින්න පුළුවන්කමක් නෑ.

සොබාසිරියට ගහපු ගේම අපිට තේරුනේ නෑ මේ පාර ඔබතුමා ජනාධිපති පුටුවේ වාඩිකරලා තමයි අපි පස්ස බලන්නේ.''

ජනපති අපේක්ෂකයා ලෙස නම්කිරීමෙන් පසුව අගමැතිතුමාගේ නිවසේ පැවැත්වපු භෝජන සංග්‍රහයෙදි, තමා අතින් සිදුවෙච්ච වරැද්දට සමාව ඉල්ලා සිටින ගමන් රණබාහු මන්ත්‍රීවරයා කිවුවා.

''පහුගිය දවස් ටිකේ අපි මොන තරම් බයෙන්ද හිටියේ. මම හිතුවේ සොබාසිරි අනිවාර්යෙන් ම ජනාධිපති වෙයි කියලයි. මිනිහා දැන් සද්දයක් නැතිව හිටියට තව ටික දවසකින් ආපහු පාරට බහීද කියන්න බෑ. මොකක් හරි වැරුද්දක් අල්ලලා ඕකව අවුරුදු හත අටකට හිරේ දැම්ම නම් අපිට බයක් නැතිව ඉන්න පුළුවන්.''

සූරසේන කිව්වෙ සෙබාසිරි කෙරෙහි තවමත් පවතින නිමනොවූ කෝපයෙන්.

''සොබාසිරි පාඩමක් ඉගෙන ගත්තා. එයා ආයෙත් අපේ වැඩවලට අත දාන්න එන එකක් නෑ. දැන් කාටවත් පිටරටින් ගෙනෙන කුණු වලින් වෙන හානිය මතක නෑ. සොබාසිරිට විරුද්ධව නඩු අහන්න ගියොත් මිනිහා ආයෙත් මේ කුණු ගොඩ අදිනවා. දැන් කරන්න තියෙන හොඳම දේ තමයි සොබාසිරි කියලා කෙනෙක් නොහිටිය විදියට වැඩ කරන එකයි.''

අගමැතිවරයා තමාගේ දිගු දේශපාලන ගමන් මගෙන් ලබාගත්ත අත්දැකීම් අනුව කිවුවා.

''ස(ර්) කියන්නේ මිනිහා ආයෙත් දේශපාලනයට එන එකක් නෑ කියලද? ''

''සොබාසිරි කියන්නේ ලජ්ජබය තියෙන කෙනෙක්. එහෙම කෙනෙකුට දේශපාලනය කරන්න බෑ. දැන් සොබාසිරි ඒ ටික තේරුම් අරගෙන. තව ටික දවසක් යනකොට මිනිහා පැදුරටත් නොකියා රටෙන් පැනල යයි.''

****************************************

06

''ස(ර්) අර කියපු ගමන යන්නේ කවදද. ස(ර්)ට මේක ඇතුළට වෙලා ඉඳල එපා වෙන්නේ නැද්ද.''

''සාගරට මාව ඉක්මනට පන්න ගන්න ඕනැ වෙලා.''

“මට හදිස්සියක් නෑ. ඒත් ළබන සතියෙ ඉඳල ජොබ් එකට යන්න වෙනවා. එතකොට නිවාඩුවක් ගන්න අමාරුවෙයි. මුලදි නම් ඉරිදට නිවාඩුවත් තියෙනවා පහුවෙනකොට ඉරිදටවත් නිවාඩුවක් ගන්න බැරිවෙයි.”

“මට තවම අම්ම තාත්තව කැමති කරගන්න බැරි වුණා. ඒ ගොල්ලො ගම දාල යන්න කැමැත්තක් නෑ. කොහොමත් තව සතියක් ඇතුළත මෙහෙන් පිටවෙන්න ඕනැ.”

“ස(ර්) යන්නෙ වෙනස් නොවෙච්ච ගමකට කියල කිව්වම අම්මල කැමතිවෙයි. කාර් එක නැති නිසා වාහනයක් කුලියට ගන්න වෙනවා. මේ ගොඩ ගහලා තියෙන පොත් ඔක්කොම අරගෙන යනවද?”

“අර වගේ ගමකට යනව කියල කිව්ව නම් අම්මලව කැමති කරව ගන්න පුළුවන් වෙයි. මොනව නොගෙනිච්චත් මේ පොත් ටික අරගෙන යන්න ඕනැ. මේ පොත්වලින් බාගයක්වත් කියවල නෑ. මෙ පොත් කියවනකොට මට පාළුවක් නැතිව ඉන්න පුළුවන්.”

දවස් ගෙවිල ගියෙ බොහෙමෙ හිමින්. සොබාසිරි දවස පුරාම කළේ ටී. වී එක බලන එකමයි. පිටරටින් ගේන කුණු රට පුරා ව්‍යාප්ත වෙන විදිය බලාගෙන හිටියෙ දරාගන්න බැරි දුකකින්. දන්නෙම නැතුව සාගර අලුත් රස්සාවට යන දවසත් උදාවුණා

“සිවිල් කෙරුවට අද තමයි අදාල ෆීල්ඩ් එකේ ජොබ් එකකට යන්නේ.”

සාගර රැකියාවට යන්න සූදානම්වෙලා කිවුවා.

“මොන ජොබ් එක කලත් හිතට එකඟව කරන්න ඕනැ.”

සොබාසිරි සාගරට කිව්වෙ දෙන්න පුළුවන් හොඳම අවවාදය හැටියටයි.

*****************************************

අලුත් රස්සාවට ගිය සාගර ආපසු ආවෙ දුක්ගැනවිල්ලක් කියාගෙනයි.

“එතන ජොබ් එක නම් කොහොමටවත් කරන්න බෑ. ඒක පිටරටින් ගේන කුණු වල ප්‍රතිචක්‍රීකරන්න බැරි කොටස දමන්න කොන්ක්‍රීට් බින් හදන කම්පැනියක්. හැබැයි ඒව නියම ප්‍රමිතියෙන් ඩිසයින් කරල තියෙනවා. මේ බලන්න ස(ර්) කොන්ක්‍රීට් වෝල් එකේ ඝනකම මීටර් බාගයක්.”

සාගර අරගෙන ආව ඩ්‍රෝවින් රෝලක් සොබාසිරි වෙත දිගුකරන ගමන් කිව්වා.

‘‘මේක නම් නියම විදියට ඩිසයින් කරල තියෙනවා. ඇත්තටම මේ විදියට බින් හැදුවොත් අවුරුදු පන්දාහකටවත් හානියක් වෙන්නේ නෑ.’’

ඩ්‍රෝවින් මිටිය පරීක්ෂා කරපු සොබාසිරි කිව්වෙ ලොකු සතුටකින්..

‘‘බලන්න ස(ර්) මට වෙච්ච දේ පෙරුම්පුරල පෙරුම්පුරල හම්බවෙච්ච රස්සාවත් හිතට එකඟව කරන්න බැරි එකක්. පිටරටින් ගේන කුණු වලට විරුද්ධව රස්සාවත් එපයි කියල පාරට බැහැපු මට ලැබුනේ ඒ කුණු දාන්න කොන්ක්‍රීට් කුට්ටි හදන්න. රස්සාවක් නැතුව හිටියත් මේ ජොබ් එකට නම් යන්නෙ නෑ. මාත් එනවා ස(ර්) එක්ක වනගත වෙන්න.’’

සාගර එහෙම කියනකොට සොබාසිරිලෙ මූණ අඳුරු වුණා. ටිකක් වෙලා කල්පනා කරපු සොබාසිරි කතාකරන්න පටන් ගත්තා.

‘‘සාගර මේ අහන්න, අපි පිටරටින් කුණු ගේන එක නවත්වන්න ජීවිතය පරදුවට තියල කටයුතු කළා. අපි කොච්චර කැපවුණත් අපිට ලැබුනේ පරාජය. අපි සටන් කළේ පිටරටින් ගේන කුණු නිසා අපේ රටට සිදුවෙන්න පුළුවන් හානිය වලක්වන්න. අපිට ඒක කරන්න බැරි වුණාට පිට රටින් ගේන කුණු වලින් අපේ රටට සිදුවෙන හානිය වලක්වන්න අවස්ථාව සාගරට ලැබිල තියෙනවා. සාගර ඔය ජොබ් එකට ගියේ නෑ කියල පිටරටින් කුණු ගේන එක නතර වෙන්නේ නෑ. ඔයා එතන රස්සාවට නොගියොත් ඔයා වෙනුවට වෙන කෙනෙක්ව අරගනීවි. ඔයා එතන රස්සාවට ගියොත් මේ කුණු වලින් පරිසරයට වෙන හානිය අඩුකරන්න පුළුවන්. මේ කුණු වල තියෙන අවදානම දන්න නිසා ඔයා මේ බින් හදනකොට පුංචි වැරද්දක්වත් වෙන්න දෙන්නේ නෑ.’’

සොබාසිරි කරපු පැහැදිලි කිරීම් වලින් පස්සෙ සාගරගෙ හිත වෙනස්වුණා. එයා රස්සාවට ගියේ රට වෙනුවෙන් ලැබුණ වගකීමක් ඉටුකරනව කියල හිතාගෙනයි.

‘‘ස(ර්)ට ආරංචියක් කියන්න තියෙනවා. ලබන සතිය වෙනකොට මට කම්පැනිය ගානෙ වාහනයක් ලැබෙනවා. තව සතියක් බලා ඉන්න පුළුවන්නම් ස(ර්)ට ඒ වාහනෙන්ම යන්න පුළුවන්.’’

රැකියාවට ගිහින් දවස් තුනකට පස්සෙ වැඩ ඇරිල නවාතැනට ආව සාගර කිව්වෙ ලොකු සතුටකින්.

‘‘වාහනයක් හයර් කරගෙන යන එක ඊට වැඩිය හොඳයි. එතකොට කවුරුවත් දැනගන්නේ නෑ. ඔයා සෙනසුරාදා හවස එනකොට වාහනයක් අරගෙන එන්න.’’

සොබාසිරි සාගර කියපු දේට කැමති වුණේ නැත්තෙ ඒක ආරක්ෂාවට තර්ජනයක් වෙන්න පුළුවන් බව දැනගෙන හිටිය නිසයි.

*************************

සෙනසුරාදා හවස සාගර නවාතැනට ආවෙ ඩබල් කැබ් එකක් අරගෙනයි.

"පොත් පැටෙවුවට පස්සේ තව මොනවත් දමන්න ඉඩනෑ. මෙතන වැඩිපුර තියෙන්නේ බණ පොත්. මේව හරියන්නේ ස(ර්)ගෙ අම්ම තාත්තට මිසක ස(ර්)ට නොවෙයි."

සොබාසිරිගේ පොත් වාහනයට පටවලා ඉවර වුනාට පස්සෙ සාගර කිව්වා.

"ඔය පොත් හරියන්නෙ මට. මට දැන් තියෙන්නේ බණක් භාවනාවක් කරගෙන ඉන්න එකයි."

"මේ ලෝකෙ කිසිම දෙයක් හේතුවක් නැතිව සිදුවෙන්නෙ නෑ. දැන් මෙච්චර දවසකට කවුරුවත් ස(ර්) ගැන හෙවුවෙ නෑ. අඩුම ගානෙ පත්තරවලින්වත්. දැන් හැමදෙනාටම ස(ර්)ව අමතකවෙලා තියෙන්නෙ. ස(ර්)ට රස්සාවක් කරගෙන මෙහෙම ඉන්න පුළුවන්. ඒත් වනාන්තරේ තියෙන ගමට යන්න හිත කියන්නේ ස(ර්)ගෙ ජීවිතයේ වැදගත් දෙයක් ඒ ගමේදි සිදුවෙන්න තියෙන නිසයි."

"සාගර මොනව කියනවද කියල මට තේරෙන්නේ නෑ. මට තව ඉතුරුවෙලා තියෙන්නේ මැරෙන්න විතරයි. බඩු පටවලා ඉවර නම් යමු."

ඉදිරිපස අසුනේ අසුන් ගන්න ගමන් සොබාසිරි කිව්වෙ අමනාපයෙන් වගෙයි. පටු මාවත ඉවර වුණාට පස්සෙ වාහනයෙ වේගය වැඩිකරගත්තු සාගර අඳුර කපාගෙන වාහනය පදවන්න පටන්ගත්තා.

"මම එළියට එන්නේ නැතිව හිටපු ටික දවසට රටේ ලොකු වෙනසක් වෙලා."

"දැන් මිනිස්සුන්ට කරන්න දෙයක් නැතිවෙන්න සල්ලි තියෙනවා. දැන් අපේ රට කේතුමතී පුරයක් වෙලා දන්සල් දොරෙහි නැත යදියෝ සල්පිල් වලය පුරවැසියෝ."

සාගර සිනාවෙන ගමන් කිව්වා. සොබාසිරිගේ ගෙදරට යන පාර ළඟට එකකොට මැදියමට ආසන්න වෙලා. තවත් පැය පහක ගමනකට පස්සෙ ඉලක්කය වෙත ළඟාවීමට ඔවුන්ට පුළුවන් වුණා.

“බඩු ටික බෑව ගමන් සාගර ආපහු යන්න. එළිය වැටෙන්න ඉස්සර පහළට ගියොත් කවුරුවත් දකින්නේ නෑ.”

සොබාසිරි කිව්වෙ වාහනය නතර කරන්නත් ඉස්සර.

“අම්මයි තාත්තයි එක්කරගෙන කන්ද උඩට යන්නෙ කොහොමඳ. බඩු නම් පස්සෙ ඇවිත් අරගෙන යන්න බැරියෑ. කවුරු හරි වාහනය දැක්කොත් ගල උඩ ගම බලන්න ආපු කෙනෙක් කියල හිතයි. මාව හම්බුවෙලා ඇහුවත් මොකක් හරි බොරුවක් කියන්න බැරියෑ. මමත් ස(ර්) එක්ක කන්ද උඩට යන්න එන්නම්.”

“ඒක හරියන්නෙ නෑ ඔයා ආපහු යන්න. ටික දුරක් යනකොට කවුරු හරි හම්බවෙයි.”

“මේ උදේ පාන්දර කවුරු එන්නද? ඒ ගමේ අය පාන් ගන්න කඩේ එනවයෑ.”

“පාන් ගන්න කඩේ එන අය නැතත් ඉස්කෝලෙ යන ළමයිව මඟට ඇරලවන්න එන කෙනෙක් හරි මුණගැහෙයිනෙ.”

“අද ඉස්කෝලෙ නෑ දහම් පාසල් යන කොනෙක් තමයි. එහෙම නම් මම යනවා.”

සොබාසිරිට කන්දුන් සාගර වාහනය හරවාගෙන ආපසු යාමට පිටත්වුණා.

මේ වෙලාවට ඉස්කෝලෙ යන ළමයින්ව මඟට ඇරලවන්න එන්නේ......

සගරගේ සිත අතීතයට ගමන්කළේ නොදැනුවත්වමයි.

හරි ඒක තමයි. එහෙම නම් ස(ර්) මේ ගමට එන්න හේතුවත් ඒකද?........................

*******************************

07

ජීවිත කාලෙම හම්බු කරපු වස්තුව කරත්ත මඩුවෙ තනිකරපු සොබාසිරි අම්මවයි තාත්තවයි අත් දෙකෙන් අල්ලගෙන කන්ද නගින්න පටන්ගත්තා.

“පුතේ අපිව කොහාටද එක්කරගෙන යන්නේ. උඹ වනගත වෙනවා කිවුවට මම හිතුවේ බොරුවට කියලා. අපි මේ වනාන්තරේ ජීවත් වෙනනේ කොහොමද?”

“අම්මා බය නැතිව ඉන්න. මේ අඩිපාර දිගේ ගියාම ගමක් හම්බවෙනවා. එතන අපිට කරදරයක් නැතිව ඉන්න පුළුවන්.”

“මේ වනාන්තරේට උඹ ඉගෙනගත්ත දෙයින් වැඩක් තියෙනවද? ඔය දේශපාලනේට නොගිහින් හිටිය නම් මේ වගේ වනගත වෙන්න ඕනැ නෑ.”

සොබාසිරි නිහඬව සිටියේ කියන්න දෙයක් නැති නිසයි.

වනාන්තරය තුළ වූ අඳුර පලවා හරිමින් මිහිදුම් සළුව ඉරාගෙන වනහිස අතරින් හිරුරැස් ගලා ආවා. මව සහ පියා අත් දෙකින් අල්ලගත්තු සොබාසිරි ගස් අතරින් ස(ර්)පයෙක් මෙන් දඟර ගැසෙමින් ඇදී යන අඩිපාර දිගේ ඉදිරියට ගමන් කරන්න වුණා.

“මේ අපිව කොහේ අරගෙන යනවද? දැන් කෙයිවෙලේ හරි තුන් දෙනාම ගලක් පල්ලෙ ඇදගෙන වැටෙනවා.”

සොබාසිරිගේ අම්මා එහෙම කිව්වෙ පාර එන්න එන්න අමාරු වෙන බව දැකලයි.

“එහෙම නම් අම්මයි තාත්තයි ඔතන වාඩිවෙලා ඉන්න. මම ගමට ගිහින් කාව හරි එක්කරගෙන එන්නම්.”

එහෙම කිවුව සොබාසිරි අඩි පාර දිගේ ඉස්සරහට ගමන් කරන්නට වුණා.

ඉක්මන් කළොත් දහම් පාසල් යන ළමයි එන්න ඉස්සර අඩිපාර ළඟට යාගන්න පුළුවන්...........

ඉක්මන් ගමනින් ගිය සොබාසිරි පැය බාගයක් ගත වෙන කොට ඉස්කෝලෙට හැරෙන අඩිපාර ළඟට ආවා.

එදා කිවුව විදියට ඉස්කෝලෙ යන ළමයින්ව එක්ක එන අය මෙතනින් එහාට යන්නෙ නෑ. මම පරක්කු වුණාද?.............

ඉස්කෝලෙ යන කාලෙ කරපු බාලදක්ෂ පාඩම මතක් වුණු සොබාසිරි අඩිපාර පරීක්ෂා කළේ දහම් පාසල් යන අය ගිහින්ද කියල දැනගන්න.

ඊයෙ රෑ වැහැපු වැස්සට පස්සේ කවුරුවත් මේ පරෙන් ගිහින් නෑ. අද ඉරිද නිසා මෙතන බලා ඉඳල වැඩක් නැතිවෙන්න පුළුවන්. හෙමින් හෙමින් උඩට යන්න ඕනෑ............

ගල උඩ ගමේ ඉඳල එන කෙනෙක් බලාපොරොත්තුවෙන් අඩිපාර දිගේ ඉහළට ගමන් කරන සොබාසිරිගේ ගමන ඉහළින් ඇසුණු ළමා හඬත් සමඟ නතර වුණා.

ළමයි විතරක් තනියම එන්නේ නෑ. තව කවුරු හරි ඇති. එයාව අඬගහගෙන අම්මවයි තාත්තවයි එක්කරගෙන යන්න පුළුවන්.

නමුත් සොබාසිරිගෙ බලාපොරොත්තු බිඳවැටෙන්න වැඩි වෙලාවක් ගතවුණේ නෑ. ළමුන් පිරිසක් පෙරටුකරගත් තරුණියන් දෙදෙනෙක් අඩිපාර දිගේ පහළට ආවා.

මෙතන ඉන්න ඔක්කොම දහම් පාසල් යන අය වගෙයි. මගෙ උදව්වට කවුරුත් නතරවෙන එකක් නෑ......... එහෙම හිතපු සොබාසිරි ඒ අයගෙන් උදව් ඉල්ලන්නෙ නැතිව ගල උඩ ගමට යන්න තීරණය කළා.

"මහත්තයා අද තනියම? කෝ එදා ආපු අය?"

සොබාසිරිව පුදුමයට පත්කරවමින් තරුණියන් දෙදෙනා අතරින් වැඩිමහළු තරුණිය ඇසුවා.

"මම ආවෙ තනියම නොවෙයි. මාත් එක්ක මගේ අම්මයි තාත්තයි ආවා. ඒ ගොල්ලො පල්ලෙහා ඉන්නවා. මම යන්නේ ඒ ගොල්ලන්ව උඩහට එක්කරගෙන යන්න උදව්වට කවුරු හරි අඬගහගෙන එන්න."

"ඔයගොල්ලන්ට ඉතුරු ටික තනියම යන්න පුළුවන් නේද? මම මහත්තයට උදව් කරන්න නවතින්නම්."

සොබාසිරිත් එක්ක කතාකරපු කෙනා එහෙම කියනකොට සොබාසිරි අසරණ වුණා.

මෙයත් එක්ක අම්මල ඉන්න තැනට යන්නෙ කොහෙමද? අම්මල මොනව හරි හිතුවොත්....

"මට උදව් කරන්න ආවොත් ඔයාලගෙ ගමන නැතිවෙනවා."

සොබාසිරි එයාව මගහරින්න හිතාගෙන කිව්වා.

"මහත්තයා උඩහට ගිහින් ආපහු එනකොට පැය තුනක්වත් යනවා. එතකන් අම්මයි තාත්තයි කැලේ මැද්දෙ තියන්නද හදන්නෙ."

එහෙම කියපු ඇය අඩිපාර දිගේ පහළට යන්න පටන්ගත්තා. ඇගේ වචනයට අවනත වෙනව හැර වෙන විකල්පයක් සොබාසිරිට තිබුණෙ නෑ.

“එදා යනකොට මෙහේ නවතින්නම එනව කියල කිවුවට මම නම් කවදාවත් හිතුවෙ නෑ මහත්තයා අපහු එයි කියලා. මහත්තයගෙ නම සොබාසිරි රක්ෂිත නේද? ඒ කියන්නෙ සොබා සෞන්දර්යය රකින්නා කියන එක නේද?.”

අනෙත් පිරිස අඩිපාරෙන් හැරිල ගියාට පස්සෙ ඇතිවුණු නිහඬනාවය බිඳිමින් තරුණිය කිවුවා. ඊළඟ වාරය ආවෙ සොබාසිරිට. වාද පිටිය දෙවනත් කරන සොබාසිරි නිහැඬියව බිඳින්න වචන හොයාගන්න බැරුව අසරණ වුණා.

මේක හරිම කතා කෝච්චියක්. දැන් මමත් මොනව හරි කියන්න එපායැ. මෙයත් එක්ක දේශපාලනේ කතා කරන්නද? පිටරටින් ගේන කුණු නිසා ලංනාවට වෙන විනාශය ගැන කතා කරන්නද? නැතිනම් අර මහාචාර්යවරයා වගේ බැඳලද? ළමයි කීදෙනෙක් ඉන්නවද කියල අහනවා. බැරි වෙලා හරි ප්‍රශ්න දෙක මාරුවුණොත්!.............

“ඔයාගෙ නම මොකක්ද?”

සොබාසිරි අමාරුවෙන් වචන ගලප ගත්තා.

“මගේ නම එරන්දතී. එරන්දතී කියන්නෙ නාග මානවිකාවක්.”

එරන්දතීගෙ කතා කෝච්චියට නැග්ග සොබාසිරි අම්මල ඉන්න තැනට ආව කියල දැනගත්තෙ කෝච්චිය නතරවුණේ මොකද කියල බලන කොටයි.

“මහත්තයත් කරන වැඩ, අම්මටයි තාත්තටයි මේ කන්ද නගින්න බැරිබව දැනගෙනත් උදව්වට කාවවත් එක්කගෙන ඇවිත් නෑ. හෙඳ වෙලාවට මාව මුණ ගැහුනේ. නැත්නම් තව පැය දෙක තුනක් මේ කැලේට වෙලා මදුරුවො තල තලා ඉන්න වෙනවා.”

එහෙම කියපු එරන්දතී අම්මගෙ අතින් අල්ලගෙන ඉස්සර වුණා. සොබාසිරි තාත්තත් එක්ක පසුපසින් ගමන් කරන්න පටන්ගත්තා.

********************

“මේක තමයි අපේ දුප්පත් පැල්පත. මහත්තයලට මේ වගේ තැනක ඉන්න පුළුවන්ද? අපේ ගමේ කිසිම පහසුකමක් නෑ.”

එරන්දතී නිවසේ දොර විවෘත කරන ගමන් කිවුවා.

“අම්මල උදේට කෑම කන්න නැතුව ඇති. ලිඳට ගිහින් මූණ හෝදගෙන එන්න. මම උදේට කන්න මොනව හරි ලැහැත්ති කරන්නම්.”

“අපි උදේට කන්න පාන් අරගෙන ආවා. හොද්දක් තිබුණ නම් ඇති.”

“උදේ පාන්දර පාන් කාල හරියනවද? පැය දහයක් විතර බඩගින්නෙ ඉඳල හොඳට කෑම කන්න ඕනෑ. බතල තම්බපුවා තියෙනවා. ලුණුමිරිසුත් එක්ක.”

“ඒව තියෙනවනම් පාන් වලට වැඩිය කොච්චර හොඳද? .”

සොබාසිරිල කෑමකාල ඉවරවෙනකොට එරන්දතී ඒගොල්ලන්ට නිදාගන්න තැන් ලෑහැත්ති කරල ඉවරයි. එරන්දතී හැමදේම ඉවර කරල මිදුලට බැස්සෙ සොබාසිරි ආපු ආරංචිය තාත්තත් එක්ක කියන්න.

සොබාසිරි ගල උඩ ගමේ නතරවෙන්න හිතාගෙන ඇවිත් ඉන්නවා කියල කිවුවම වෙදමහත්තයට විශ්වාස කරන්න බැරිවුණා. එයා හිතුවෙ සොබාසිරි දවස් දෙක තුනක් නතරවෙලා යන්න ඇවිත් කියලයි. සොබාසිරි ආණ්ඩුවෙන් අයින් වෙච්ච එකවත්, ලංකාවට පිටරට කුණු ගේන එකවත් ඒ ගොල්ලො දන්නෙ නෑ.

වෙදමහත්තයා ඉක්මනට ගෙදර ආවෙ සොබාසිරිත් එක්ක කතාකරන්න හිතාගෙනයි.

“මහත්තයා බයවෙන්න එපා. මෙහාට පිටින් කවුරුවත් එන්නෙ නෑ. තේ ගස් ටික තියෙන කල් කාටවත් අත නොපා ජීවත්වෙන්න පුළුවන්. ගෙයක් දොරක් හදාගන්න තුරු අපේ ගෙදර නතර වෙන්න පුළුවන්.”

සොබාසිරිගේ කතාව අහගෙන හිටපු වෙදමහත්තයා කිවුවා. සොබාසිරිගෙ අම්මටයි තාත්තටයි ගේ ඇතුළෙ ඉඩ ලැබුණත් රටේ මුල් පුටුව අරගන්න උරුමකරගන්න හිතපු සොබාසිරිට ලැබුණේ ඉස්තොප්පුවෙ තියෙන ලණු කැඩිච්ච වැල් ඇඳක්. එයාගෙ තනියට හිටිය වෙදමහත්තයා ඇඳට වැටිල ටික වෙලාවකින් ගොරවන්න ගත්තත් සොබාසිරිට නින්ද ගියේ නෑ. නිදි නැතුව පැය ගාණක් කල්පනා කර කර හිටිය සොබාසිරි තම අනාගතය සම්බන්ධව තීරණයකට ආවා

*************************

ගල උඩ ගම බාහිර ලෝකයෙන් වෙන්වී වෙනම රටක් ලෙස පැවතුනත් ඒකට රටේ ඇතිවුණ ආර්ථික වෙනස දැනෙන්නට වැඩි කාලයක් ගතවුණේ නෑ. සොබාසිරි ගල උඩ ගමට ඇවිත් දෙවැනි දවස වෙනකොට රටේ ඇතිවූ වෙනස ගල උඩ ගමට බලපෑවෙ නොහිතපු විදියට.

කඳු යායම මීදුම් සළුවෙන් වැහිල යන කොට ඒ සමඟ අත්වැල් බැඳගෙන ආපු සීතල පෙරවගෙන හිටිය පොරෝනය අතරින් රිංගාගලා ඇවිත් සොබාසිරිව ඇහැරෙවුවා. ගේ ඇතුළෙ ඉන්න අය නැගිටල හිටියත් වෙදමහත්තය තවමත්

ඇහැරිලා තිබුණෙ නෑ. සොබාසිරි ළිඳට ගිහින් මූණ කට හෝදගෙන එනකොට වෙදමහත්තයා අවදිවෙලා.

"මහත්තයා උදෙන්ම නැගිටලා. අපි උදෙන් නැගිට්ටා කියලා මොනව කරන්නද? මම ගිහින් කෝපි එකක් අරගෙන එන්නම්."

වෙදමහත්තයා ඉස්සරහ දෙරෙ ඇරගෙන ගේ ඇතුළට ගමන් කළා. හීතල නැතිවෙන්න කෝපි බොන්න වෙදමහත්තයා එනතුරු බලාහිටියත් කොපි එක අරගෙන ආවෙ වෙදමහත්තයා නොවෙයි.

"සීතලද? මම කෝපි එකක් හදාගෙන ආවා. මේක බිවුවම සීතල නැතිවෙලා යයි?"

"කෝ වෙදමහත්තයා? වෙදමහත්තයා කොහාටද ගියේ?."

"තාත්තා... දළු කඩන්න ගියා. මල්ලිලා ඉස්කෝලෙ ගියා මම තාත්තලට තේ අරගෙන යන්න හදන්නේ. ඒ පැත්තෙ ආවොත් දළු කඩන හැටි බලාගන්න පුළුවන්. දළු කඩනවා දැකල නෑ කිවුව නේද."

"ඔයාට අවුරුදු දෙකකට විතර ඉස්සර කියපුවත් මතකයි. වාහනේ යනකොට දළු කඩනහැටි දැකල තිබුනට දළු කඩනවා හරියට දැකල නෑ. මමත් දළු කඩන්න එන්නම්."

"මහත්තයට ඒව කරන්න පුළුවන්ද? කූඩැල්ලෙක් කකුලෙ එල්ලුනොත් දළු කඩනක පැත්තක දාල ආපහු දුවයි. මට තාත්තගෙන් බැනුම් අහන්න වෙනවා."

"මම මෙහේ නතර වෙනව නම් කූඩැල්ලන්ට බයවෙලා මහත්තය වගේ බලාන ඉදල හරියන්නෙත් නෑ. වවුලගෙ ගෙදර බෝඩිම් වුණොත් එල්ලිලා ඉන්න පුරුදුවෙන්න ඕනැලු."

"එතකෙට අපි වවුල්ලු, මහත්තය තමයි බෝඩිම්කාරයා. මට පරක්කු වෙනවා මහත්තය යනව නම් ලැහැත්ති වෙන්න."

"දළු කඩනකොට කොළ එකහමාරයි දල්ලයි. ඊට වැඩිය පොඩි ඒවා කඩන්නේ නෑ. දල්ල කඩනකොට ඉත්ත යට තියෙන පුංචි කොළේ ළඟින්ම කඩන්න ඕනෑ. නැති නම් අලුත් දල්ල එන්න පමාවෙනවා."

එරන්දතී සොබාසිරිහට ගල උඩ ගම්මානයේ ප්‍රායෝගික ජීවිතයේ පළමු පාඩම කියල දුන්නා.

ඇත්තටම මම උද්භිද විද්‍යාව ගැන උපාධි ගත්තට මොනවද දන්නේ. මෙහේ ජීවත්වෙනව නම් පරිසරයත් එක්ක ජීවත්වෙන හැටි ඉගෙනගන්න

වෙනවා.......... එරන්දතී කඩිසර ලෙස දළු නෙලන දිහාව බලපු සොබාසිරි සිතුවා.

කොළ එකහමාරයි දල්ලයි ....සොබාසිරි නුහුරු ලෙස දළු කැඩීම පටන්ගත්තා.

"මහතයා අත පිරෙන්න දළු කඩලා. ඔය ටික මෙහාට දෙන්න. මෙන්න මගේ කකුලෙ නම් යාළුවෙක් ඉන්නවා."

එරන්දතී කිව්වෙ කකුලේ එල්ලා හිටපු කූඩැල්ලෙක් ගලවලා ඇඟිල්ලට අරගෙන ඈතට විදිමින ගමන්.

ඉර අහසෙ ඉහළට නගිනකොට මිහිදුම් සේලය නොපෙනී ගියා. දැඩි හිරුරැස් සොබාසිරිගේ සම දවන්නට පටන්ගත්තා.

"මහත්තයට අවුවෙ ඉදලා පුරුදු නෑ නේද? ඒසී කාමරවල ෆෑන් යට සැපට හිටලා මෙහේ අපාය වගේ ඇති. මහත්තයා හෙවන තියෙන හරියෙන් ඉන්න."

රටේ රජ වෙන්න හිටපු කෙනෙක් දුක් විදිනව දැකපු එරන්දතීට දුක හිතුනා.

"අපි පසුගිය දවස්වල හිටියෙ පාරෙමයි. එහේ උඩිනුයි යටිනුයි දෙකෙන්ම රත්වෙනවා. මෙහේ අවුවෙ ඉන්න එක අමාරු දෙයක් වෙයි."

ඉර අහසෙ මුදුනට එනකොට හිරු රැස් වලින් හැංගිලා ඉන්න පුළුවන් තැනක් තේ කැල්ලෙ තිබුණෙ නෑ.

"අපි ගෙදරයමු, අදට මේ ඇති."

දළු කඩන එක නතර කරලා එරන්දතී කිවුවා ඉර හැරෙන්නත් ඉස්සර දළු කඩන එක නැවැත්තපු එක ගැන සොබාසිරි කැමතිවුණේ නෑ. එයා හිතුවෙ ගෙදර යමු කිව්වෙ එයාට මහන්සි නිසා කියලයි.

මට මහන්සි නෑ, තව වැඩකරන්න පුළුවන්. ගොඩක් ඉතුරුවෙලා තියෙනවනේ."

"දළු කඩල ඉවරවුණාට අපේ වැඩ ඉවර නෑ. මේ දළු ගෝනි ෆැක්ට්‍රියට ගෙනියන්න එපායැ.

"මේ දළු ගෝනි එච්චර දුර උස්සගෙන යන්නෙ කොහොමද?

සොබාසිරි තේ දළු පුරවපු ගෝනි දිහා බලාගෙන ඇහුවා.

"ගිනි අවුවෙ දළු කැඩෙවුව මදිවට දළු ගෝනිත් කරගහගෙන යන්න වෙයි කියලා මහත්තයා බයවුණාද?. බයවෙන්න එපා දළු ගෙනියන වාහන එනවා. ඔය එහෙන්නේ ඒවයේ සද්දෙ? ."

වාහනයක ශබ්දයක් ශ්‍රවනය කිරීමට දෙකන් යොමුකළ සොබාසිරිට ඇහුණේ මිණිගෙඩි හඩක් විතරයි.

වෙදමහත්තය කියනව වගේ මේ කෙල්ල මාව විහිළුවට අරගෙන. මටත් පිස්සු මේ කන්ද උඩට වාහන එන්නේ කොහොමද? ඔය එනව ඇත්තෙ තවලමක්. ඉස්සර පාර ආවට තවලමක් බලාගන්න බැරිවුණා..............

************************

සාගර ආපසු නවාතැනට එනකොට දිනෙන් අඩක් ගෙවිල ඉවරයි. මුළු රැයක් නිදිවර්ජිතව හිටපු සාගර ඇඳේ දිගාවූනේ ඇඳගෙන සිටිය ඇඳුම් පිටින්ම යි.

පසුවදා උදෑසනම අවදිවුණු සාගර කාර්යාලයට ගියේ රට වෙනුවෙන් ඔහුගෙන් ඉටුවියයුතු යුතුකම උපරිමයෙන් ඉටුකරන බලාපොරොත්තුවෙන්.

මම තනිවුනා. ස(ර්) ආයිත් මේ පැත්තෙ එයි කියල හිතන්න බෑ. ස(ර්) කියපු විදියට වැඩකළොත් පිටරටින් ගේන විෂ වලින් රටට වෙන හානිය අඩුකරගන්න පුළුවන්. අපි හැර කවුරුවත් බින් හදන එක කරන්නේ නෑ. එකතුවෙන කුණු දාන්න ඇති තරම් බින් හැදුවොත් මේ ජොබ්එක පිට යන්නේනෑ...

නියමිත ප්‍රමිතියෙන්, පමාවකින් තොරව කොන්ක්‍රීට් බහාලුම් ඉදිකිරීම තම වගකීමක් ලෙස සලකපු සාගර දිවා රාත්‍රී වෙනසකින් නැතිව ඒකට කැපවුණා. රට පුරා සැරිසරමින් කටයුතු කරන සාගරට සොබාසිරි පිළිබඳව සොයාබලන්න කාලයක් ඉතුරුවුණේ නෑ.

***************************

## 08

හිතන්නවත් බැරි තරම් ඉක්මනට රටේ විශාල පරිවර්ථනයක් සිදුවුණා. ශ්‍රම බලකාය කුණු තේරීම සඳහා යොමුවූණේ ඒකෙන් වෙන කිසිම රැකියාවකට වඩා මුදල් හොයන්න පුළුවන් හින්දයි. කුණු තේරීම මගින් උපයාගතහැකි මුදල රජයේ හෝ වෙනත් කිසිම රැකියාවක වැටුපට වඩා වැඩිවීම නිසා සියළුම සේවාවන් අඩපණ වීමට පටන් ගත්තා. මේක ආණ්ඩුවටත් ප්‍රශ්නයක් වුණා. අගමැතිතුමා ඉදිරියේදි රටේ කරන්න වෙන වෙනස්කම් ගැන සාකච්ඡා කරන්න ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙ රැස්වීමක් කැදෙවුවා.

“රටේ ලොකු ප්‍රශ්නයක් ඇතිවෙමින් පවතිනවා. රජයේ රැකියා කරන අය රස්සාව දාල යන්න පටන් අරන්. රාජ්‍ය සේවකයන්ගේ පඩි වැඩිකිරීමක් ඉක්මනින්ම කරන්න වෙනවා.”

පක්ෂ රැස්වීම අරඹමින් අගමැතිවරයා කිව්වා. රාජ්‍ය සේවය නැතිකරල දාල හැමදේම පුද්ගලීකරණය කරන්න හිතන ජනදාස මහත්තයා රාජ්‍ය සේවකයන්ගෙ පඩි වැඩිකරන්න යෝජනා කරනකොට ඒ ගොල්ලන්ට අදහගන්නවත් බැරිවුණා.

“රජයේ සේවකයෝ රස්සාව දාල යනව නම් ඒක කියලවත් කරගන්න බැරි දෙයක්නේ. උන්ට පඩි දෙන්න රටේ සල්ලි කොච්චරක් කියල යනවද? ”

රණබාහු මන්ත්‍රීවරයා කිව්වෙ අගමැතිතුමා කියපු කතාවෙ අගක් මුලක් නොදැන.

“රණබාහු එහෙම කිවුවට රට අත්‍යාවශ්‍ය රජයේ රැකියාවන් තියෙනවා. ඒවයෙ වැඩකරන අය රස්සාව දාල ගියොත් අපිට රට කරගෙන යන්න බෑ. කොටින්ම කිවුවොත් හමුදාව පොලීසිය නැතිව රට ගෙනියන්න බෑ.”

“රටේ තියෙන නීතිවලට අනුව ඒ අයගෙ විතරක් පඩි වැඩිකරන්න බෑ.”

ධනවර්දන ඇමතිවරයා නීතිමය තත්වය පෙන්වා දුන්නා

“නීති හදන්නෙත් අපි ක්‍රියාත්මක කරන්නෙත් අපි. නීති අලුතෙන් හදල අපිට ඕනැ අයට විතරක් පඩි වැඩිකරන්න පුළුවන්. එච්චර මහන්සි වෙන්න ඕනැ නෑ. අපිට ඕනැ කරන රස්සාවල් අත්‍යාවශ්‍ය සේවාවන් කරල ඒවට වෙනම දීමනාවක් දෙමු.”

“එතකොට අනිත් එවුන් පාරට බැහැල පිස්සු නටයි. ඡන්දෙත් අත ළඟ තියාගෙන එහෙම තීරණයක් ගන්න එක හරිද?”

එහෙම කිව්වෙ රාජ්‍ය පරිපාලන ඇමති කාරියකරවන මහත්තයා.

“ඔන්නම් ඡන්ද ලක්ෂ දහයක් විතර නැතිවෙලායයි. ඔය ඡන්ද ලක්ෂ දහය නැති වුණාට අපිව පරාද කරන්න බෑ.

අගමැතිවරයා කිව්වෙ ස්ථිර ලෙසින්. වැඩි දවසක් යන්න ඉස්සර ඒ යෝජනා ක්‍රියාත්මක වුණා

*************************************

එහෙමනම් අපි යනවා. මහත්තය ඇගපත හෝදගෙන ටිකක් විවේක ගන්න. අපි එනකොට හැන්දෑවෙයි. ආපහු එනකොට මහත්තයගෙ පොත් ටිකත් අරගෙන එන්නම්.''

තවලම දක්කගෙන යනගමන් වෙදමහත්තය කිව්වා. සොබාසිරි ඉස්තෝප්පුවෙ තියෙන වැල් ඇඳේ ඇලවුණේ මහන්සි වැඩිකමට. එයාට දන්නෙම නැතිව නින්ද ගියා. මූණට වැටිච්ච සීතල වතුර බිංදුවක් නිදාගෙන හිටිය සොබාසිරිව ඇහැරෙවුවා.

''කම්මැලියා නිදාගන්නද හදන්නේ.''

''මහන්සි වැඩිකමට ටිකක් ඇලවුණා. දන්නෙම නැතිව නින්ද ගියා. දැන් හවස්වෙලාම නාගන්නවා.''

සොබාසිරි බඩගිනියි කියල නොකියා කිවුවා.

නාන්නෙ නැති ළමයින්ට මෙහේ කෑම දෙන්නෙ නෑ. නාගත්තම ඔය මහන්සි ගතිය නැතිවෙලායයි.

එරන්දතී කිව්වෙ පොඩි දරුවෙකුට තරවටු කරන්නව වගෙයි.

එරන්දතී බාල්දියත් අරගෙන මිදුලට බැස්සා. ඇය වෙතින් පාවී එන සියුම් රැහැන් මගින් ටිකෙන් ටික තමා ඇය වෙත ඇදගන්නා බව සොබාසිරිට තේරුණා. එයා ඒ රැහැන්වලින් බැඳුනෙ කැමැත්තෙන්මයි. හැම පැත්තෙන්ම ගස්වලින් වටවුණු පොකුණෙ සීතල වතුර සොබාසිරිගෙ ඇඟේ තිබිච්ච මහන්සිය නැතිකරල දැම්මා. එයා ආපහු එනකොට ගල උඩ ගම දාල යන්න බැරිතරම් බැඳීම් ඇතිකරගෙන ඉවරයි.

''අපි මෙහාට මුලින්ම එන දවසෙ ලස්සන බටනලා හඬක් ඇහුනා.''

නාල ඉවරවෙලා ආපහු එනගමන් සොබාසිරි කිවුවෙ එදා අහපු බටනලා හඬ ආයෙත් අහන්න ආසාවෙන්.

''ඔයාට ඒක ආයෙත් අහන්න ලැබෙන්ණෙ නෑ.''

''ඇයි එයා දැන් ගමේ නැතිද?''

''එයා තාම මේග මේ ඉන්නවා. ඒත් එයා බටනලා පිඹින්නෙ හිතට පාළුවක් තනිකමක් දැනුනම විතරයි. දැන් එයාට පාළුවක් තනිකමක් දැනෙන්නෙ නෑ.''

එරන්දතී එහෙම කියනකොට බටනලා පිම්බෙ කවුද කියල සොබාසිරිට හිතාගන්න පුළුවන්වුණා.

“දැන් එයාට හිතට සතුටත් ආවමත් බටනලා පිඹින්න හුරුවෙන්න වෙයි.”

සොබාසිරි එහෙම කියනකොට එරන්දතී හිනාවුණා.

බත් කාල ඉවරවෙලා ඇඳ උඩ හාන්සිවෙච්ච සොබාසිරිට කම්මැලි කමක් දැනුනා.

“කියවන්න පොතක් හොයාගන්න බැරිද? බලාගෙන ඉන්න ගියාම හරිම කම්මැලියි.”

“මා ළඟ පොත් කොයින්ද? ගෙදර වැඩ නැත්නම් ඔයාගෙ පාළු මකන්න තිබුණා. මල්ලි ඉස්කෝලෙ ඇරිල ආවම එයාගෙ අච්චු පොතක් අරගන්න පුළුවන්.”

“ඔයාගෙ නංගි ළඟ පොත් ඇතිනෙ එයා ඉස්කෝලෙ උගන්නනවා නේද?.”

එයා ඉගැන්නුවට සල්ලි හම්බවෙන්නෙ නෑ. ඉස්කෝලෙ ගුරුවරු අඩු නිසා ස්වෙච්චා ගුරුවරයෙක් හැටියට උගන්නනවා. සීයගෙ පොත් වගයක් නම් තිබුණා. පොඩ්ඩක් ඉන්න බලන්න.”

පැරණි පෙට්ටගමක් විවෘත කරපු එරන්දතී ඒක අවුස්සන්න ගත්තා.

“මේකෙ වැඩිපුර තියෙන්නේ පුස්කොළ පොත්. පොතක් තියෙනවා ඔයාට මේ පොත හරියයිද? මේක බණ පොතක් පොතක්.”

“මම මෙහාට ආවෙ බණක් භාවනාවක් කරගෙන ඉන්න හිතාගෙනයි. ඒත් දැන් එහෙම කරන්න බැරිවෙනවා. බණ පොත් කියවලා සසර කලකිරුනොත්!”

සොබාසිරි ඉතිරි ටික කියන්නෙ නැතිව නතරකලා.

මේක කියෙවුවට සසර කලකිරෙන්නෙ නෑ බණ පොතක් කිවුවට මේක බණ පොතක්ම නොවෙයි. මට හිතෙන හැටියට මේක තමයි ලෝකයේ පළමුවෙනි විද්‍යා ප්‍රබන්ධය. ඔයා උම්මග්ග ජාතකය කියවල තියෙනවද?”

එරන්දතී පොත් ආපහු අහුරන ගමන් ඇහුවා.

“උම්මග්ග ජාතකය විද්‍යා ප්‍රබන්ධයක් වෙන්නෙ කොහෙමෙද? එක පන්සිය පනස් ජාතක කතා පොතේ දිගම කතාව.”

සොබාසිරි කිවුවෙ වාදයකට සූදානම් වෙලා.

“ඕන ඔට්ටුවක් දාන්නම් ඔයා මේ පොත කියවල නෑ. කියවල තියෙනව නම් ඔහොම කියන්නෙ නෑ. පණ්ඩිතයො හදවපු උමගක විස්තර මේ පොතේ

තියෙනවා. මුළු උමගෙම තියෙන පහන් එක ඇණයක් එබුවම දැල්වෙන බව මේ පොතේ තියෙනවා. එහෙම දැල්වෙන්න නම් උමගෙ තියෙන පහන් විදුලියෙන් ක්‍රියා කරන පහන් වෙන්න ඕනෑ. උමගෙ දොරවල් ගැනත් ඒ වගේම විස්තරයක් තියෙනවා. මේක කියවලා බලන්න. ඔයාට මේක බණ කතාවක් විතරක් නොවන බව තේරෙයි.''

වැල් ඇඳ මත වාඩිවූ සොබාසිරි පොත කියවන්නට පටන්ගත්තේ එරන්දතී කියන්නෙ ඇත්තක්ද කියල බලන්නයි. එයා පොත පෙරලලා උමග ගැන තියෙන තැන පෙරල ගත්තා.

මම කොච්චර පොත් කියවල තිබුණත් මේ පොත කිනලා නැහැකෙ. මහ ලොකුවට ලෝකෙම තියෙන දේවල් දන්නව වගේ වාදවලට ගියත් කවුරු හරි උම්මග්ග ජාතකය ගැන ඇහුව නම් මම විනාසයි. එරන්දතී කියනව වගේ මේක තමයි ලෝකයේ මුල්ම විද්‍යා ප්‍රබන්ධය. පොතට සමවැදී උන්නු සොබාසිරිගේ දැහැන සුළඟ සමඟ මුසුව ආ මිණිගෙඩි නාදයකින් බිඳවැටුණා.

මිණිගෙඩි සද්දයක් නේද? තවලම ගිහිනුත් එනවා. වෙදමහත්තයා කිව්වෙ ආපහු එනකොට හවස් වෙනවා කියලනේ.

''එරන්දතී! තාත්තල එනවා.''

සොබාසිරිට කියවුණේ නොදැනුවත්වමයි.

''තාත්තල එනකොට තව හවස්වෙනවා. තවම නංගිලවත් ඉස්කෝලෙ ඉවරවෙලා ආවෙත් නැහැනෙ.''

එරන්දතී කිව්වෙ මිදුලට දුවගෙන එන ගමන්.

''තවලම එන සද්දෙ ඇහුණා, මිණිගෙඩි සද්දෙ.''

''කෝ මුකුත්ම ඇහෙන්නෙ නෑ. ඔයාට මනස්ගාත, පොත කියව කියවා ඉන්නකොට නින්ද ගිහින් හිනයක් දකින්න ඇති.''

''ඇත්ත තමයි දැන්නම් මොකුත්ම ඇහෙන්නේ නෑ.''

එහෙම කියපු සොබාසිරි නැවතත් පොත කියවන්න පටන්ගත්තා. පෙරටත් වැඩිය ළඟින් ඇසෙන මිණිගෙඩි හඬ සොබාසිරිට නැවතත් බාධා කළා.

''ඔන්න ආයෙත් ඇහෙනවා. හොඳට කන්දීල බලන්න කාටද මනස්ගාත කියලා.''

“තාත්තල අපහු එනවා. මෙච්චර ඉක්මනට එන්නෙ මුකුත් කරදරයක්ද දන්නෙ නෑ.”

එරන්දතී කෑගැහුව නෙවෙයි කෑ ගැහුණා. ගේ ඇතුළෙ හිටිය සැමදෙනාම ගෙයින් පිටතට ගෙන එන්න එම හඬට පුළුවන් වුණා. තවත් මොහොතක් ගතවන විට පහළ ගෙවල් අතරින් ගම්මානයට එන තවලම ගස් අස්සෙන් පේන්න ගත්තා. ගොනුන් පිට උඩ තිබ්ච්ච දළු පිරවූ ගෝනි ඔවුන්ගේ පුදුමය තවත් වැඩිකළා. ගමේ හිටපු අය තවලම පස්නේ වෙදමහත්තයගේ ගේ ලඟට ආවා.

“ඔන්න තේ කෙරුවාවත් ඉවරයි. පැක්ටේරිය වහලා. තේ ගස් කපල ලිපේ දාන්න තමයි වෙන්නේ .”

වැල් ඇඳ උඩින් වාඩිවෙන ගමන් වෙදමහත්තයා කිවුවා.

“දළු ටික හලලා තුනීකරල දැම්ම නම් හෙට වෙන ෆැක්ටරියකට දෙන්න බැරියෑ. ඔය ෆැක්ටරිය විතරයෑ තියෙන්නේ.”

එරන්දතී එහෙම කිව්වෙ ඒ වගේ දෙයක් දරාගන්න බැරුවයි.

“ෆැක්ටරිය වහල කියල අපිට මගදිම පණිවිඩය ලැබුණා. ගිය සතියෙ අපේ දළු වලට පස්සේ දළු කිලෝවක්වත් ෆැක්ටරියට ඇවිත් නෑ. ෆැක්ටේරියෙ වැඩකරන අයත් වැඩට ඇවිත් නෑ. අනිත් ෆැක්ටරි වලටත් ඔය සෙතේම තමයි.”

“දළු කොහාටවත් දෙන්න බැරි නම් ඇයි මේව ආපහු උස්සගෙන ආවෙ. එහෙ හලල ආව නම් සත්තුන්ට මහන්සියක් නැතිව එන්න තිබුණා.”

සොබාසිරි තවමත් දළු ගෝනි ඔසවාගෙන සිටින හරකුන් දෙස බලමින් කිවුවා.

“එහෙම කරල හරියනවයෑ. මේ දළු හැදෙන්න මේ පොළොවෙන් උරාගත්තු පෝර මේ පොළොවට දෙන්න එපායෑ. මේ දළු ටික මේ පොළවෙම දිරන්න දාන්න ඕනෑ.”

මෙච්චර ඉක්මනට මුළු රටම උඩු යටිකුරු කරන්න කුණු බිස්නස් එකට පුළුවන් වුණා. තවම මේක පටන් අරන් මාසයක් නෑ. දැනටමත් රටේ කර්මාන්ත වලට බලපාන්න අරගෙන. තව ටික දවසක් යනකොට ලංකාවෙ කිසිම දෙයක් නිෂ්පාදනය කෙරෙන එකක් නෑ, කිසිම වගාවක් කෙරෙන එකක් නෑ. මේ ගමන නතරවෙන්නේ කොතනින්ද? මෙතන මම හිතුවට වැඩිය භයානක කමක්

තියෙනවා. මෙහෙම ගිහින් එකපාරටම අපිට කුණු එවන එන නතර කළොත් මොකද වෙන්නේ.......

සොබාසිරි රටට සිදුවෙලා තියෙක විපත ගැන කල්පනා කරන්නට වුණා.

"මහත්තය ලෝකෙ පෙරලන්න වගේ කල්පනා කරනවා. තේ දළු විකුණගන්න බැරි වුණා කියල අපිට බඩගින්නෙ ඉන්න වෙන එකක්ඩජ නෑ. තේ ගස් ටික ගලවල දමල බතල මඤ්ඤොක්ක ටිකක් හිටවල දැම්මම ඉවරයි. හෙටම වැඩේ පටන්ගනිමු."

"මම කල්පනා කළේ අපේ රටට වුණු දේ ගැන. තව ටික දවසක් යනකොට තේ කොළත් පිටරටින් ගෙන්නන්න වෙනවා."

සොබාසිරි එහෙම කිවුවත් කවුරුවත් ඒකට උත්තර දුන්නෙ නෑ.

***************************

09

තේ දළු විකුණන්න බැරි එක ගල උඩ ගමේ ආර්ථිකය එහෙම පිටින්ම බිඳ දමන බව හැමදෙනාටම තේරුණා. වැඩි දෙනෙක්ගෙ මතය වුණේ තවදුරටත් කැලෑවට වෙලා ඉන්න එකේ තේරුමක් නෑ කියලයි. වෙදමහත්තයා කවදාවත් ගම දාල යන්න කැමති නෑ කියලත් ඒ ගොල්ලො දැනගෙන හිටියා. ඒ හින්දා කන්දෙන් බැහැලා ටවුමට යන්න පුළුවන් හැමදෙනාම පහුවදා උදෙන්ම රස්සාවල් හොයාගෙන ටවුමට යන්න කතාකරගත්තා. මේ මුකුත්ම දන්නෙ නැති වෙදමහත්තයා ඉස්සෙල්ල දවසෙ කතාවෙච්ච හැටියට තේ පඳුරු ගලවන්න ගියත් එතනට කවුරුවත් ඇවිත් හිටියෙ නෑ.

"කෝ තවම කවුරුවත් ඇවිත් නෑ. මුන් රට ගම අතෑරල ගිහින්ද? එන එකෙක් එන්නෙ නැතෑ අපි වැඩේ පටන්ගමු."

වෙදමහත්තයා එහෙම කිව්වෙ සිදුවෙලා තියෙන දේ ඉවෙන් වගේ දැනගෙන.

"ඇඟපත හයිය තියෙන එවුන් ඔක්කොම ගම දාල ගිහින්."

කිතුලෙ ඉඳල ආව කම්මලේ අයිය කිව්වෙ කේන්තියෙන්. ටිකක් වෙලා යනකොට එරන්දතියි සොබාසිරිගෙ අම්මයි තාත්තයි ඒගොල්ලන්ට එකතු වුණා. හවස්වෙනතුරු මහන්සි වුණත් තේ පඳුරු විසිපහකට වැඩිය ගලවන්න බැරිවුණා අවුරුදු සියගාණක් ආර්ථිකයෙ බර දරාගෙන හිටිය තේ ගස් තමන්ගෙ තැන නැතිවෙලා යනවට කැමතිවුණේ නෑ. අවුරුදු ගාණකින් කැත්තක් උදැල්ලක්

අල්ලපු නැති සොබාසිරිගෙ අත්වල හැන්දෑ වෙනකොට දියපට්ට මතුවෙලා තිබුණා. සොබාසිරි නිදාගන්න ඉස්සරවෙලා කාටවත් නොපෙනෙන්න පානෙන් තෙල් ටිකක් අරගෙන අත් දෙකේ ගාගත්තා.

රැකියා සොයාගෙන නගරයට ගිය පිරිස වැඩි දවසක් ගතවෙන්න ඉස්සර තමන්ගෙ පවුල්වල අයත් එක්ක නගරයට ගිහින් පදිංචිවුණා.

************************ *

"දැන් ඔයාලගෙ නංගි ඉස්කෝලෙ යන්නෙ නැද්ද? දවස් ගාණකින් ඉස්කෝලෙ යනව දැක්කෙ නෑ."&

"උගන්නන්න තරම් ළමයි ඉස්කොලෙ එන්නෙ නැතිලු. මල්ලිත් ඉස්කෝලෙ යන්නෙ තාත්තගෙ බලකිරිල්ලට. එයාගෙ යාළුවො හත් අට දෙනෙක් ගම දාල ගියානෙ. දැන් ඉතුරුවෙලා ඉන්නෙ පවුල් දෙකයි."

එරන්දතීට උසස් පෙළ විභාගයෙන් විශ්ව විද්‍යාලයට යන්න වරම් නො ලැබුණත් විද්‍යා පීඨයකට ඇතුළුවෙන්න පුළුවන්කම තිබුණා. ඒත් එයාගෙ අම්මා හදිස්සියේම මියගියෙ ගුරුවරියක් වෙන්න තිබ්ච්ච බලාපොරොත්තුව නැතිකර දමමින්. එදා ඉඳල අම්මගෙ භූමිකාව රඟදක්වන්න වුණේ එරන්දතීටයි.

ගුරුවරියක් වෙන්න හිතාගෙන උගන්නන්න ගියත් ස්වේච්ඡා ගුරුවරයෙක් හැටියට වැඩකරල ගුරුපත්වීමක් ගන්න බැරිබව එරක්දතීගෙ නංගිට තේරිලා තිබුණා. එයා අක්කගෙ අනාගතය ගැන හිතල උගන්නන්න යන එක නතරකරල ගෙදර වගකීම බාරගත්තා

නංගි ඉස්කෝලෙ යන්නෙ නැත්තෙ ඇයි කියල ඇහුවම පුංචි බොරුවක් කියන්න වුණේ ඒගොල්ලන්ගෙ අසරණකම කාටවත් පෙන්නන්න අකමැති නිසයි. එත් එයා කියපු බොරුව ඇත්තක් වෙන්න වැඩි දවසක් ගියේ නෑ.

"ඔයාට හරියට ගණන් කරන්නවත් බෑ දැන් පවුල් දෙකක් නෙවෙයි තුනක් ඉන්නවා."

එරනදතී කියපු බොරුව සොබාසිරිට තේරුනේ නෑ.

"මේ යන විදියට තව කවුරු ගම දාල යයිද කියන්න බෑ. කවුරු ගියත් අපේ තාත්ත නම් ගම දාල යන්නෙ නෑ. කවුරු ගියත් අපේ ගමේ ගමේ පවුල් දෙකක් ඉතුරුවෙනවා."

පවුල් දෙකක්? ඔයාට හොඳටම විශ්වාසද මම මෙහෙදාල යන්නෙ නෑ කියල? "

“ඔයාට දැන් කොහොමවත් යන්න දෙන්නෙ නෑ.”

**************************** *

සමාජයෙන් වෙන්වෙලා හුදකලාව හිටියත් පිටරට කුණු ලංකාවට ගේන එකේ අහිතකර ප්‍රතිඵල සැරින් සැරේ ගල උඩ ගමට බලපෑම් කළා

“ලබන සතියෙ ඉදලා අපි ඉස්කොලෙ යන්නෙ නෑ. ඉස්කෝලෙ ලොකු පත්ති නවත්වනවලු. හෙට ඇවිත් අස්වීම අරගෙන යන්න කිවුවා.”

එරන්ද ඉස්කෝලෙ ඇරිල ආවෙ අලුත් ආරංචියක් අරගෙන.

“මේක යකාගෙ ආණ්ඩුවක්නෙ. ඉස්කෝලයක් අරිනවා කියන්නෙ හිරගෙවල් සීයක් වහනවා කියලයි අපි ඉගෙනගෙන තියෙන්නෙ. මුන් හදන්නෙ රටම විනාශ කරලදාන්න.”

වෙදමහත්තයා හිතට ආව කේන්තිය පිටකරගත්තා. සොබාසිරි මොකුත්ම නොකිව්වෙ මේ වගේ තත්වයක් ඇතිවෙන බව මුලින්ම දැනගෙන හිටිය නිසයි. පහුවදා උදෙන්ම ඉස්කෝලෙට ගිය වෙදමහත්තයා ඉස්කෝලෙ ලොකුමහත්තයව මුණගැහුනෙ එරන්ද කියන කතාවෙ ඇත්ත නැත්ත දැනගන්නයි.

“තවම මේ ඉස්කෝලෙ වහන්න කියල නෑ. ඒත් හයෙන් ඉහළ පංති නවත්තන්න කියල ඊයෙ ලියුමක් ආවා. ඒ පංතිවල ළමයින්ට ටවුමෙ ඉස්කෝලෙට යන්න පුළුවන්.”

“අපි කොහොමද ටවුමෙ ඉස්කෝලෙට ළමයි යවන්නේ. ළමයින්ව බොඩිම් කරන්නෙ නැතිව ටවුමෙ ඉස්කෝලෙට යවන්න බෑ. කොහේ තියෙන සල්ලිද? දැන් අපිට තිබ්ච්ච එකම ආදායමත් නැතිවෙලා. තේ ගස් ගලවලා දරට දාන්න වෙලා තියෙන්නේ. ගුරුවරුන්ට තියෙන්නේ ඉස්කෝලෙ එන එක ළමයට හරි උගන්නන්න”

“රටට යන කලක් ගැන හිතන්නවත් බෑ. හැමෝගෙම පඩි වැඩිකලත් අපේ පඩිය වැඩිකළේ නෑ. ගුරුවරු රස්සාව දාල කුණු තෝරන්න යනවා, ළමයි ඉස්කෝලෙ එන්නෙ නැතිව කුණු තෝරන්න යනවා. අනාගතයේ රටට බිහිවන්නේ මෝඩයෝ පිරිසක්. මෝඩයෝ බිහිවෙච්ච තරමට මේ ගොල්ලො කැමතියි. මේකට විරුද්ධ වෙන්න කවුරුවත් නෑ. විරුද්ධව කතාකරපු සොබාසිරි මහත්තයටත් වෙච්ච දෙයක් නෑ. මුන් ඒ මහත්තයව මරල දැම්මද දන්නෙ නෑ.”

තවත් කතාකරල වැඩක් නැති බව තේරිච්ච වෙදමහත්තයා එරන්ද ගෙ අස්වීමෙ සහතිකයත් අරගෙන ආපහු ආවා.

"මම හිතාගෙන හිටියෙ ඉහළට උගන්නල උඹව ලොකු මිනිහෙක් කරන්න. දැන් කරන්න දෙයක් නෑ. උඹ අක්කලගෙන් අහගෙන ඉගෙන ගනින්. මහත්තයත් ඉන්න නිසා පාඩුවක් වෙන්නෙ නෑ."

වෙදමහත්තයා එහෙම කිව්වෙ හිතේ තියෙන දුක හංගගෙන.

********************************

එරන්දගෙ පාසල් ගමන නැවතුනේ ගල උඩ ගම බාහිර ලෝකයත් එක්ක තියෙන සම්බන්ධය තවත් දුර්වල කරමින්. එරන්දගේ පාසල් ගමන නැවතුනාට පස්සෙ ගමේ අයට බාහිර ලෝකයේ තොරතුරක් ලැබුණේ අත්‍යාවශය දෙයක් මිලදී ගන්න නගරයට ගියොත් විතරයි.

"අපි නොගිහින් හිටපු ටික කාලෙට ටවුම අඳුන ගන්න බැරිතරමට වෙනස්වෙලා. අපි දන්න කඩ එකක්වත් නෑ. ඔක්කොම තියෙන්නේ පිටරට මිනිස්සුන්ගෙ කඩ. පාරෙ යන්න හැටියක් නෑ වාහන, කොළඹ පරාදයි. මිනිස්සු ළඟ වීසිකරන්න තරම් සල්ලි තියෙනවා. මගේ කරත්තෙ ලක්ෂ දහයකට ඉල්ලුවා කියමුකෝ. මම හිතුවෙ ගොනත් එක්ක කියලයි. මම ගත් කටටම කිවුව කීයක් දෙනව කිවුවත් ගොනාව විකුණන්නෙ නෑ කියල. ඒපාර මිනිහ කියනවා ගොනාට ඕන නෑ කියල. කරත්තෙ ඉල්ලුවේ මිදුලෙ ලස්සනට තියන්නලු. ඉතින් මම සල්ලි අරගෙන කරත්තෙ ඒ මිනිහගෙ මිදුලට ගිහින් දාල ගොනාවත් දක්කගෙන ගෙදර ආවා. ඒවා ගෙවල් නෙවෙයි මාලිගා. මිදුලෙ හැමතැනම සිමෙන්ති ගල් අල්ලලා. මුළු ඉඩමෙම තියෙන්නෙ ප්ලාස්ටික් මල් ගස්. අතුගාන්න, වතුර පෝර දාන්න යන වියදම බැලුවම ප්ලාස්ටික් මල් ගස් ගන්න එක ලාභ ලු"

ටවුමට ගිහින් ආපු කම්මලේ අයිය කිව්වෙ හැමදෙනාවම පුදුමයට පත්කරමින්.

"ඉතින් ගේන්න ගිය දේවල් අරගෙන ආවෙ නැතිද? "

"එච්චර සල්ලියක් ළඟ තියාගෙන කඩ ගානෙ රස්තියාදු වෙන්න පුළුවන්ද? හෙට දිහාට අනිත් කරත්තෙ අරගෙන ගිහින් බඩු අරගෙන එනවා."

පහුවදා නගරයට ගිය කම්මලේ අයිය ආවෙ අලුත් ආරංචියක් අරගෙන.

“අපිට කරත්ත ටිකක් හැදුවොත් විකුණගන්න පුළුවන්. මේ කරත්තෙත් විකුණනවද කියල ඇහුවා. වියදමක් නැතුවම කරත්ත හදාගන්න පුළුවන්. ටිකක් අමාරු වැඩකට තියෙන්නේ බොස්ගෙඩිය හදන එකයි. පරණ යකඩ ටිකක් හොයාගත්තොත් ඒකත් හදාගන්න පුළුවන්. මයිනහම අදින එකත් ලේසි නෑ.”

කම්මලේ අයිය කිව්වෙ කරත්ත ටිකක් විකුණ ගත්තොත් සල්ලි හොයාගන්න පුළුවන් නිසයි.

“මයිනහම අදින එක මාරුවෙන් මාරුවට හරි කරන්න බැරියෑ. උඩහ මැරෙන්න යන ගහක් තියෙනවා. පරිස්සමින් කපාගන්තොත් ලී ටික හොයාගන්න පුළුවන්.”

ඒකට වෙදමහත්තයගෙ අනුමැතිය ලැබුණා.

ඉන්පසු සති කීපය ගමේ කම්මලටයි වඩුමඩුවටයි වැඩ වැඩිවුණා. මාසයක් ඇතුළත කරත්ත හතරක් හදල ඉවර කරන්න ඒගොල්ලන්ට පුළුවන් වුණා.

“ඔන්න කරත්ත විකුණලත් ඉවරයි.”

විකුණන්න කරත්ත අරගෙන ගිය කම්මලේ ගෙදර අයියා කිව්වෙ සවස් වනතුරු නගරයේ ගතකරල පාන් කියාගන්නවත් බැරුව හිස් අතින්ම ආපහු ඇවිත්.

“කරත්ත විකුණුනේ නැත්තෙ අපි හදන කරත්ත හොඳ නැතිද?.”

සොබාසිරි ඇහුවෙ වෙලා තියෙන්නෙ මොකක්ද කියල තේරුම් ගන්න බැරුව.

“අපේ කරත්තවල වැරැද්දක් නෑ. වෙලා තියෙන්නේ අපේ කරත්ත වලට වැඩිය ලස්සන කරත්ත පිටරටින් ගෙනැල්ලා.”

“කරත්ත පිටරටින් ගෙනැල්ලා! බොරු කියන්න එපා. වාහන වගේ කරත්ත පිටරටින් ගෙන්නනවද?.”

“බොරු කියල තැගි ගන්නද? ඒ කරත්ත සෙල්ලන් බඩු වගෙයි ප්ලාස්ටික් වලින් හදලා තියෙන්නෙ. වැස්සට අහුවුණා කියල දිරන්නෙ නෑ. කරත්ත විකුණන්න බැරිවුණාට වෙන වැඩක් හම්බවුණා. එතෙන්ට ආපු කෙනෙක් ඇහුවා වී බිස්සක් හදලදෙන්න පුළුවන්ද කියල.”

“වී බිසි හදලා දාන්න වී උන් ගාව තියෙනවද? අපි මොනවා කළත් ඒකට හෙනහුරෙක් පාත්වෙනවා. සල්ලි වලින් වැඩක් නෑ. අපි අපිට ඕන දේවල්

මෙහෙදිම හදාගනිමු. මහත්තයා කියන්න වගේ රටින් කුණු එවන එක නතරවුණු දාට අපි ඔක්කොම ඉවරයි.''

වෙදමහත්තයා ස්ථිර හඬින් කිව්වා. එයාගේ වචනයට ඉහලින් යන්න පුළුවන් කෙනෙක් ගමේ හිටියෙ නෑ.

ලෝකයත් එක්ක ගනුදෙනු නොකරන වෙදමහත්තයට තේරෙන දේ අපේ රටේ මිනිස්සුන්ට තේරෙන්නේ නෑ.....

සොබාසිරිගෙ හිතට රටේ මිනිස්සු ගැන ඇතිවුණේ කලකිරීමක්

## 10

සොබාසිරිගෙ මතය වුණේ වනාන්තරය කියන්නෙ ලස්සන බලන්න යන තැනක් නෙවෙයි කියලයි. වනාන්තරයක අපි තියන එක අඩියකින් වුණත් ලෝකෙ තියෙන අන්තිම පැළෑටිය අන්තිම ජීවියා මිහිමතින් තුරන්වෙන්න පුළුවන් බව සොබාසිරි දැනගෙන හිටියා. පරිසර චාරිකාව දවසෙ ගල උඩ ගමට ඇවිත් වනාන්තරය බලන්නෙ නැතුව හිටියෙ ඒ නිසයි. එච්චර පරිසරයට ආදරය කරන සොබාසිරි අද වනාන්තරය තුළට පිවිසුනේ වනාන්තරයෙ අසිරිය විඳගන්න නොවෙයි. වනන්තරයෙ දෙයක් කඩා වඩාගෙන අරගෙන යන්න. වෙනදා වනාන්තරයක දකින මල්, සමනල්ලු අද ඔහුගේ නෙත ගැටුනේ නෑ. වෙනදා ලොවට සැඟවී තිබෙන ගස් වැල් සතුන් සොයමින් වනයේ සැරිසරන සොබාසිරිගේ අද ඉලක්කය වූයේ ආහාරයට ගන්න පුළුවන් දෙයක්.

කඳ බඩ පුරා කාල ඉන්න එවුන්ට බඩගින්න නිවාගන්න අපි විදින දුක තේරෙන් නෑ.

තමාට පහරදුන් රැවුල වවාගත් මිනිහා කියපු වචන සොබාසිරිගේ මතකය ආවේ නිරායාසයෙන්.

මමත් බඩගින්නෙ නොහිටිය නම් කවදාවත් වනාන්තරයක කොළයක්වත් කඩන්නෙ නෑ. බඩගින්න නිවාගන්න හැම ජීවියා ම මහ සටනක් කරනවා. ඒක ශාක සත්වයො මිනිස්සු කියල වෙනසක් නෑ. ජනදාස කළේ ඒ ධර්මතාවයෙන් ප්‍රයෝජන ගත්ත එකයි....

මහ ගසක කඳක් වටා එතෙමින් ඉහළට ඇදී ඇති අලවැලක් දැකපු සොබාසිරි ගමන නතර කළා.

''එරන්දතී මෙහාට එන්න මෙතන අලවැලක් තියෙනවා.''

"මහත්තයා හරිම වාසනාවන්කයි. මේකෙන් අපිට වේල් දෙකතුනක් පිරිමහගන්න පුළුවන්. අපි කන්ද උඩට ගිහිල්ලා ආපහු එන ගමන් මේක භාරගනිමු."

කන්ද උඩට යනකොට වනාන්තරය වෙනස්වෙන්න ගත්තා. සදාහරිත වනය ශුෂ්ක කලාපයේ වනාන්තරයක් බවට පත්වුණා. වතුර රඳවාගන්න පස් තට්ටුවක් නැති ගල්තලාව උඩ වැවෙන ගස් වතුර ගබඩා කරගන්න, ගබඩා කරගත්ත වතුර පරිස්සම් කරගන්න හැඩගැහිල තිබුණා

"අපිටත් මේ ගස් වගේ හැඩගැහෙන්න වෙනවා."

බොහොම කාලෙකට පස්සෙ පරිසරය ගැන දේශනයක් තියන්න ලැබිච්ච සොබාසිරි එරන්දතීට කිච්චෙ ගල් තලාව උඩ තියෙන ගස් වැල් පරිසරයට හැඩගැහිල තියෙන හැටි කියලදෙන ගමන්.

ආපහු එන ගමන් අලවැල ගලවන්න හිතාගෙන ගියත් ඒකට හිත එකඟකරගන්න සොබාසිරිට අමාරුවුණා.

"මේක ගලවගෙන යන්න මගේ හිත දෙන්නෙ නෑ. අපි කරන්නෙ පරිසරය විනාශ කරන දෙයක්."

සොබාසිරිට හිතට එකඟව වනාන්තරයෙ කොළයක්වත් කඩන්න බෑ.

"ඔයාට පිස්සු, කිසිම දෙයක් අන්තවාදීව හිතන්න හොඳ නෑ. මිනිසා කියන්නෙ පරිසරයෙම කොටසක්. සතෙකුට මේ අලවැල කන්න තියන අයිතිය අපිටත් තියෙනවා. මේ අලවැල ගැලෙව්වයි කියල ලොකු හානියක් වෙන්නෙ නෑ. මේකෙ ඉහට්ට හිටෙව්වම අලුත් අලවැලක් හැදෙනවා."

එරන්දතී පරිසර අන්තවාදියාට ප්‍රායෝගික පරිසර පාඩම කියලදුන්නා.

************************** *

ජනාධිපතිවරණය ජනදාස විතරක් තරග කරන සටනක් බවට පත්වුණා .පිටරටින් ගෙන්නන කසල වලට මානුෂික මුහුණුවරක් දෙන්න හදපු විපක්ෂයේ නාමල් දෙනියටවත්, පිටරට කුණු ලංකාවට කුණු ගෙන්නන එක නතරකරනවයි කියපු කුමාරසිංහටවත් එයාට තරගයක් දෙන්න පුළුවන් වුණේ නෑ. ජනදාසගෙ ජය නියත වුණත් ඒක වාර්ථාගත එකක් කරන්න පක්ෂයේ හැමදෙනාම වෙහෙසුනා.

ජනතාවගෙ ජීවන තත්වය උසස් කරන ගමන්ම රට හිරවෙලා තියෙන ණය උගුලෙන් රට මුදාගන්න බවට දීපු පොරොන්දුව ඡන්ද දායකයො අනුමත කළේ සියයට අසුවක ප්‍රතිශයකින් ජනදාසව ජනාධිපතිකමට තෝරගෙනයි.

පිටරට කුණු ලංකාවට ගේන එක බහුතර ජනතාවගෙ කැමැත්තෙන් සම්මත වුන බවත් ජනතාවගෙ ආර්ථිකය නගාසිටුවන වැඩපිළිවෙල කඩාකප්පල් කරන්න ප්‍රතිගාමී බලවේගවලට ඉඩදෙන්නෙ නැති බවත් ධූරයේ දිවුරුම් දීපු ජනදාස ප්‍රකාශ කළා.

රටේ ජනාධිපතිවරණයක් තිබුණු බවත් ජනදාස මහත්තයා අලුත් ජනාධිපති හටියට පත්වුණු බවත් ගල උඩ ගමේ අය දැනගත්තෙ මාස දෙකක් පහුවුණාට පස්සෙයි.

වසරක් ගෙවිල ගියේ සිතාගන්නවත් බැරි තරම් වේගයකින්. අවුරුද්දක කාලයට රටේ විශාල වෙනසක් ඇති වුණා. නිවාස මහා මන්දිර බවට පත්වන්නට පටන්ගත්තෙ හතු පිපෙනව වගෙයි. පාරට එකතුවෙන වාහන වලට හරියන විදියට මාර්ග පළල් කරන්න පටත් ගත්තා. වැඩිවන ඉදිකිරීම් අවශ්‍යතා සපුරාලන්න මෙරට ශ්‍රමිකයන් හිටියෙ නෑ. ඒ අඩුව සපුරාලන්න කුණු සපයන රටේ ඉදිකිරීම් සමාගම් සූදානම්වෙලා සිටියා. ගොඩනැගිලි හදන්න ඕනකරන හැමදේම මවුරටින් ගෙන්වා ගැනීමට එම සමාගම් කටයුතු කළා. තෝරා වෙන්කරගත් ද්‍රව්‍ය අමුද්‍රව්‍ය බවට පත්කිරීමට සැදූ කර්මාන්තතශාලාවල සේවය කිරීමට අවශ්‍ය සේවකයන්ද කුණු සපයන රටෙන්ම ගෙන්වීමට සිදුවුණා. ලබාදෙන මුදල් ආපසු තමන්ගෙ රටට ලැබෙන යාන්ත්‍රණය ලංකාවට කුණු සපයන රට සකස්කරගෙන තිබුණා.

සාගරගේ වගකීමද දිනෙන් දින වැඩිවන්නට පටන්ගත්තා. ඉතිරිවන අපද්‍රව්‍ය දැමීමට බහාලුම් සෑදීම වෙනත් ආයතනයකට නොදීමට හිතාගෙන හිටපු සාගර සැමවෙලාවෙම ඉලක්කයටත් වඩා  වැඩකිරීමට කටයුතු කළා. නියමිත ප්‍රමිතියෙන් ඉදිකිරීම් පවත්වා ගැනීම නිසා ඉදිකිරීම් තත්වය පරීක්ෂා කිරීමට එන විදෙස් ඉංජිනේරුවන්ගේ විශ්වාසය දිනාගන්න සාගරට පුළුවන් වුණා. ආයතනයේ නිලධාරීන් සහ සේවකයන් සිතුවේ සාගර ආයතනයේ අදිසි අයිතිකරුගේ නෑයකු බවයි. සාගර මහන්සි වෙලා වැඩකරන්නේ ආයතනය අයිතිකරුට මුදල් ඉපයීමට නොව රට බේරාගැනීමේ අදහසින් බව කාටවත් හිතාගන්න බැරිවුණා.

සොබාසිරිගේ අලුත් ජීවිතයෙ මුල් මාස තුන අගහිඟකම් වලින් බහුල එකක් වුණත් ඒ දිවියට හැඩගැහෙන්න ඒ ගොල්ලන්ට පුළුවන් වුණා. තේ වගාව ගලවා

දමා වගාකරපු අල වර්ග සහ වෙනත් බෝග වල අස්වැන්න ලැබීමත් එක්ක ගල උඩ ගමත් රටේ අනෙක් ප්‍රදේශ වගේ අභිහිකමින් තොර තැනක් වුණා.

***********************************

11

සාගර සේවය කරන ආයතනයේ නියම අයිතිකරු ආයතනයේ අයිතිකරු වශයෙන් කටයුතු කරන සමරජීව නොවන බව හැමදෙනාම දැනගෙන හිටියා. නියම අයිතිකාරයා කවුද කියන එක කාටවත් ප්‍රශ්නයක් වුණේ නෑ. නමුත් බලාපොරොත්තු වුණ තරම් ලාභයක් ලැබෙන්නෙ නැති එක එයාට ප්‍රශ්නයක් වුණා. එයා හිතුවෙ තමන්ට ලැබෙන්න තියෙන ලාභය සේවකයො හොරකම් කරනව කියලයි. ඒ ගැන හොයල බලන්න හිතපු එයා සමරජීවට කෝල් එකක් ගත්තා

"සමරජීව ඔය කම්පැනි එකෙන් මම හිතපු තරම් ලාබයක් ලැබෙන්නේනෑ. මෙතන වැඩකරන එවුන් හොරකම් කරන්නෙ නෑ කියල හොඳටම ෂුවර්ද? ."

"ස(ර්) ඕක මගෙන් අහන්න ඕනැ ප්‍රශ්නයක්ද? ස(ර්)ගෙ නෑයෙක් චීෆ් ඉංජිනියර් හැටියට දාල තියෙනකොට, මිනිස්සු හොරකම් කරන්න හිතන්නෙවත් නෑ."

"ඕකට මගේ නෑයෙකුව දාල නෑ. තමුසෙ දන්නෙ නැතිද අපේ හත්මුතු පරම්පරාවෙ ම ඉගෙන ගත්ත එවුන් නැති බව. ඕතන මාව දන්න කවුරුවත් නෑ. "

"ඒක වෙන්න බෑ. ඒ මහත්තය වැඩකරන්නේ මේක එයාගෙ කම්පැනියක් වගෙයි. හැම වෙලාවෙම බලන්නෙ ටාගට් එක කවර් කරන්නෙ කොහෙමද කියලයි."

"මට පේන්නෙ මිනිහා තමුසෙලවත් අන්දලා ගාන කපාගන්නවා. ලංකාවෙම එකතුවෙන කුණු දාන්න කොන්ක්‍රීට් පෙට්ටි හැදුවත් මේකෙන් මම හිතපු තරම් ලාභයක් නෑ. මම පාරවල් කොන්ක්‍රීට් කරනකොට එකට එකක් ලාබ ගත්තා. මේකෙ සියක් වියදම්කරන කොට දහයකට වැඩිය ලාභයක් නෑ. මට මිනිහගෙ ෆෝන් නම්බර් එක දෙනවා මම කතාකරල බලන්නම්."

"ස(ර්) කතාකරන එක හොඳමදි. එතකොට මිනිහා දැනගන්නවා මේ කම්පැනි එක ස(ර්)ගෙ කියල. මේ කම්පැනි එක මගෙ නොවන බව දැනගෙන හිටියත් ස(ර්)ව කවුරුවත් දන්නෙ නෑ."

‘‘සමරජීව මම කියන විදියට වැඩ කරනවා. තමුසෙ හිතන්නේ මම එච්චර මෝඩයෙක් කියලද? මිනිහට මම කවුද කියල කියන්නෙ නෑ. මම මේ කම්පැනි එක අයිතිකාරය කියල කියනවා. මම කවුද කියන එක මිනිහට වැඩක් නෑ.’’

නොපුරුදු අංකයකින් පැමිණි ඇමතුම ලබාගත් සාගරට නොපුරුදු හඬකින් විමසන තමාගේ නම ශ්‍රවනය කරන්න ලැබුණා.

‘‘හලෝ වීරවර්ධනද? මට මේ කම්පැනි එකේ ලාබය අඩුවෙන්න හේතුව දැනගන්න ඕනෑ.’’

‘‘ඔය මහත්තය කවුද කියල දැනගන්න පුළුවන්ද? .’’

‘‘මම තමයි ඔය කම්පැනි එකේ අයිතිකාරයා.’’

‘‘මම දන්න තරමට මේ කම්පැනි එක අයිති සමරජීව මහත්තයට.’’

සාගර බබා පාට් එකෙන් එහෙම කිව්වෙ කම්පැනියෙ නියම අයිතිකාරය සමරජීව නොවන බව නොදන්නව වගෙයි

‘‘කෙහෙල්මල් සමරජීව, ඒකා මේකෙ අයිතිකාරය නෙවෙයි. තමුසෙ වගේම කුලීකාරයෙක්. ඒකා මේකෙ අයිතිකාරය වෙන්නෙ නමට විතරයි.’’

‘‘සමරජීව මහත්තයගෙන් අහන්නෙ නැතිව කිසිම දෙයක් කියන්න බෑ.’’

‘‘එකත් එහෙමද? තමුසෙ ඒකගෙන්ම අහගන්නව මම කවුද කියල.’’

කෝල් එක කට්වුණාට පස්සෙ සාගර සමරජීවට ඇමතුමක් අරගත්තා.

‘‘වීරවර්ධන මහත්තයා මහත්තයට කතාකළේ මේ කම්පැනිය අයිතිකාරයා. ලොක්ක මහත්තයගෙ නම්බරේ ඉල්ලගත්ත ගමන් මම මහත්තයට කෝල් එකක් ගත්තා. ඒත් ලොක්ක ඊට ඉක්මන් වුණා.’’

‘‘මේකෙ අයිතිකාරය සමරජීව මහත්තය නොවන බව අපි දන්නවා. නියම අයිතිකාරය කවුද කියල දන්නෙ නෑ.’’

‘‘අනේ වීරවර්ධන මහත්තයා, ඒක විතරක් අහන්න එපා. ඒක නොදැන ඉන්න තරමට හොඳයි. කෝල් එක ආපු නම්බරේට කතාකරල අහන දේකට උත්තර දෙන්න. එහෙම නොවුනොත් ලොක්ක මගේ ඔළුව කනවා.’’

සමරජීව කිව්වෙ බැගෑපත් ස්වරයෙන්.

බලාගෙන යනකොට ලොක්කටත් ලොක්කො ඉන්නවා. ඒ ලොක්කට තව ලොක්කො ඉන්නවද දන්නෙ නෑ.

එලෙස තමාටම කියාගත්තු සාගර තමාට ඇමතුම ආ අංකයට ඇමතුමක් අරගත්තා.

“මම ඔය මහත්තයා මේ කම්පැනියේ අයිති කෙනා බව දැනගෙන හිටියෙ නෑ.”

“දැන් තමුසෙ දන්නවනේ මම කවුද කියල. මට දැනගන්න ඕනැ මේ කම්පැනි එකේ ලාබය මෙච්චර අඩු මොකද කියලා.”

“ලාබය අඩුවීමක් වෙලා නෑ සියයට දහයක ලාබයක් තියෙනවා. මේ බී. ඕ. කිවු එකේ විදියට ඊට වැඩි ලාබයක් ගන්න අමාරුයි. අපිට දවසකට මිලියන දහයක ලාබයක් තියෙනවා.”

“මිලියන දහයක්, අපබ්‍රන්ස නොකියා තේරෙන විදියට කියනවා.”

“මිලියන දහයක් කියන්නේ ලක්ෂ සීයක්. රුපියල් කෝටියක්.”

“මාසෙකට කෝටි තිහක් හොයන්න මෙච්චර දඟලන්න ඕනැද? සීයට දහයක ලාබයෙන් මොනව කරන්නද? මම පාරවල් කොන්ක්‍රීට් කරන කාලෙ එකට එකක් ලාබ ගත්තා. ඔය හදන කොන්ක්‍රීට් පෙට්ටියේ ඝනකම ටිකක් අඩුකරල කම්බි දාන එකත් අඩුකළාම ලාබය නිකම්ම වැඩිවෙනවා. පාරවල් කරද්දි අඟල් හය හතර කරනවා.”

“ඒක නම් කරන්න බෑ. දීල තියෙන විදියට මිසක වෙන විදියට වැඩකරන්න බෑ. මේවයේ කොලිටිය බලන්න ආවම ඒකක් හරි ෆේල් වුණොත් මුලු බින් එකම රිජෙක්ට් වෙනවා. අපි දැනට හදපු තුන්දාස් පන්සීයෙන් එකක්වත් රිජෙක්ට් වෙලා නෑ.”

“කෙහෙල්මල් කොලිටිය. මම කරපු එක වැඩක්වත් රිජෙක් වෙලා නෑ. ඒව පාස්කරන්න ක්‍රම සහ විදි තියෙනවා. ඔය කොළවල තියෙන චිත්‍ර විදියට වැඩකරන්න නම් ඉංජිනේරුවො ඕනැ නෑ. ඉංජිනේරුවෙක් හැටියට තමා දැනගන්න ඕනැ ඕව බලන්න එන අයගෙ ඇස් වහල ගේම ගහන්න. එහෙම බැරි තැනකදී පොඩි සංතෝසමක් දෙනවා. ඒකෙන් අපිට පාඩුවක් වෙන්නෙ නෑ.”

“මේවා බලන්න එන්නෙ අපේ රටේ අය නෙවෙයි. ඒ රටවල ජරාව කාල අහුවුණොත් මරල දානවා. ඒ රටවල් දියුණුවුණේ ඒ නිසයි. අනික අපි හොර කරල රවට්ට ගන්නෙ අපිවමයි. මේ බින්වල දාන්නේ පරිසරයට අහිතකර දේවල් මේවයින් එකක්හරි ලීක් වුණොත් පළාතම ඉවරයි. පොඩි ලාබයට වැඩිය අපි රට ගැන හිතන්න ඕනැ.”

සාගරගෙ කතාවෙන් රණබාහුගෙ ඉවසීමේ සීමාව පැන්නා. කියන්න ඕනෑ දේ මොනවද එපා දේ මොනවද කියල එයාට අමතක වුණා.

"තමුසෙ ඔය කතාකරන්නෙ මම කවුරු කියල හිතාගෙනද? මම තමයි රණබාහු. මම කියන හැටියට වැඩකරන්න බැරි නම් තමුසෙට මේ කම්පැනියෙන් අස්වෙලා යන්න පුළුවන්. මම හොඳට බලාගෙන මට, ආයතනයේ ලොක්කට ස(ර්) කියන්න තමුසෙගෙ දිව නැවෙන්නෙ නෑ. තමුසෙ හිතන්නෙ උපාධියක් ගත්ත කියල මහ ලොක්කෙක් කියලද? මම ඇවිත් කනෙන් ඇදල එළියට දාන්න ඉස්සර  මාස තුනක පඩි ඉල්ලාගෙන අයින් වෙලා යනවා."

"ඔය කියන විදියට වැඩ කරන්න මට බෑ.  මට මාස තුනක පඩිත් එපා."

රණබාහු ආවොත් තමාව අඳුනගන්න බව තේරුම්ගත්තු සාගර පලායාමේ ක්‍රියාන්විතය පටන් ගත්තා. එයා ඔෆිස් එකෙන් එළියට ආවෙ වෙනසක් පෙන්නන්නෙ නැතිවයි.

කවුද හිතුවෙ මේක රණබාහුගෙ කම්පැනියක් කියල. දැන් මට පරෙස්සම් වෙන්න වෙනවා. එයාගෙ රහසක් පිටට යනවට රණබාහු කැමති නෑ. එක පාරට ආපු කේන්තියට මාව පන්නගත්තට මේ වෙන කොට මාව හොයනවා ඇති. මම සාගර කියල දැනගත්තම මට බේරිල්ලක් වෙන්නෙ නෑ. ඊට ඉස්සර කාටවත් හොයාගන්න බැරිවෙන්න පැනගන්න ඕනෑ. බෝඩිමට ගිහින් ඇඳුම් ටික අරගෙන යනවද?.............

පාරට දුවගෙන ආපු සාගර පරෙ ගිය ටැක්සියකට අත දැම්මා. ටැක්සිය නතරකළේ සාගරව පහුකරගෙන  ටිකදුරක් ගිහින්. සාගර ටැක්සියට නැග්ගෙ එතන පාරෙ ඉන්නවට වැඩිය ආරක්ෂිතයි කියල හිතාගෙන.

"වෙයා."

රියදුරා දන්නා එකම ඉංග්‍රීසි වැකිය යොදා යායුත්තේ කොතනටද දැනගැනීමට ජංගම දුරකථනය දික්කළා. ඊට පස්සෙ එයා දුරකථනයේ පෙන්වන මාර්ගය ඔස්සේ රථය පදවන්න පටන්ගත්තා.

මම ඉක්මන්වුනා වැඩියි. මිනිහ දන්නවා මම කවුද කියලා. ඒක කතාකළේ සොබාසිරිගෙ වචනමයි. මූට යන්න දෙන්න හොඳ නෑ. නැවතිලා ඉන්න තැන හොයාගත්ත නම් මිනිහව අල්ලගන්න පුළුවන්.................

එහෙම හිතපු රණබාහු සමරජීව හට ඇමතුමක් ලබාගතා.

"සමරජීව වීරවර්දනගෙ ප(ර්)සනල් ෆයිල් එක බලලා මට කතාකරනවා."

"ස(ර්) ඒ මහත්තයගෙ සම්පූර්ණ නම සාගර තරංග වීරවර්ධන. ඉගෙන..."

මේ කෝල් එක එන බව දන්න සමරජීව වේලසනින්ම වීරවර්ධනගෙ ෆයිල් එක හොයාගෙන සූදානම් පිට හිටිය නිසා හැරෙන තැපැලෙන්ම උත්තර දුන්නා.

"සාගර!...සමරජීව දන්නවද ඒකා කවුද කියල මිනිහ සොබාසිරිගෙ ගෝලයෙක්. පහුගිය කාලෙ සොබාසිරි රටවටේ ගියෙ ඕකත් එක්ක. මිනිහව අපි ළඟට එවන්න ඇත්තෙ සොබාසිරිය. ඒකා රට පැන්නයි කියල හිතාගෙන හිටියට මිනිහත් මේ රටේම ඉන්නවා. සාගර පස්සෙන් පැන්නුවොත් දෙන්නවම අල්ලගන්න පුළුවන්. සාගර නැවතිලා ඉන්නෙ කොහේද කියල දන්නවද?"

"ස(ර්) වීරවර්ධන මහත්තය නතරවෙලා ඉන්න තැන කැබ් එකේ ඩ්‍රයිවර් දන්නවා. එයාගෙ නම්බරේ ස(ර්)ට එවන්නම්."

*********************************

නවාතැන පෙණෙන මානයට ආව කුලී රථයේ වේගය අඩුවුණේ ගමනාන්තය දැනගන්නයි. නවාතැන අසළ නවත්තලා තියෙන වෑන් එක දැකපු සාගරගෙ හිතට අමුත්තක් වගේ දැනුනා. කුලී රථයෙන් බිමට පැන්න සාගර පටු පාරක් දිගේ දුවල ගිහින් සැඟවිලා ගියා.

"ස(ර්) ඒකා පැනගත්ත. මිනිහ නැවතිලා ඉන්නෙ සොබාසිරි නැවතිලා හිටපු තැනමයි. ඒකා සොබාසිරිගෙ කෙනෙක්."

සාගර පැනගත්ත බව දැක්ක රණබාහුගෙ කුලී හමුදාව රණබාහුව දැනුවත් කළා.

"ලැජ්ජා නැතුව කියනහැටි. ඔය වගේ දෙයක්වත් කරගන්න බෑ. තමුසෙලට පඩිගෙවන එකත් පාඩුයි. මිනිහව හොයාගෙන මිසක් ආපහු එන්නෙ නෑ."

රණබාහු සාගර අල්ලගන්න බැරිවුණ කේන්තිය පිටකළා.

පටු මාවත දිගේ ඉදිරියට දිවගිය සාගර එහි කෙලවරට ආවා. ඔහුගේ සිතට සැනසීමක් ලැබුණේ කුලී රථයකට ගොඩවුනාට පස්සෙයි.

දැන් මාව හොයන එක ලේසි නෑ. ස්ටෑන්ඩ් එකට ගිහින් බස් එකක නැගලා ස(ර්) ඉන්න දිහාවට යනවා. දැන් වෙලාව කීයට විතර ඇතිද?............

දුරකථනය අතට ගත්තු සාගරට ඒක තමා පසුපස ලුහුබැඳ එනකෙනෙකුට මඟ පෙන්වන බව තේරුණා.

ෆෝන් එක පස්සෙ පන්නනවා නම් මාව ඉක්මනට අල්ල ගන්න හදන එකක් නෑ. මම යන්නෙ කොහෙද කියල බලයි. උන් හිතනව ඇති මම ස(ර්) ඉන්න තැනට යයි කියල.

බස් රථ කිහිපයකට මාරුවුණු සාගර ගල උඩ ගමට යන පාර ළඟට එනකොට කළුවර වැටීගෙන එනවා.

දැන් ගමට යන්න වෙලාවක් නෑ ඉක්මනට ගියොත් කරත්ත මඩුව ළඟට වත් රෑවෙන්න ඉස්සර යාගන්න පුළුවන්......

පාර වසාගෙන වැවිල තියෙන කුඩා පඳුරු මාස ගණනකින් පාර පාවිච්චි කරල නැති බව නිහඬව කියාපෑවා. අඳුරේ ම කරත්ත මඩුවට ආව සාගර ඒකෙ තිබුණු කරත්තයක් තුළ දිග ඇදුනේ රාත්‍රිය ගතකරන්න හිතාගෙනයි.

***************** *

සාගරයව අහුනොවෙච්ච එකත් හොඳයි. ඌ අහුවුණා නම් සොබාසිරියව අල්ලගන්න බැරිවෙනවා. ඕකුන්ගෙ උපාධි මේ රණබාහුගෙ අටපාස් මොළ් තරම් වැඩකරන්නෙ නෑ. තව පැය දෙක තුනකින් ලොක්කයි ගෝලයයි දෙන්නම මගේ අතේ. මුන්ගෙ වැඩ කියන්නෙ අවුරුද්දක්ම මට හොරෙන් මෙතන වැඩකරපු එකනේ.

සාගර හා සොබාසිරි කොටුකරගන්නා මෙහෙයුම ක්‍රියාත්මක කරවමින් සිටි රණබාහු කල්පනා කලා. පැය දෙකක් ගතවුණ තැන මෙහෙයුමේ අන්තිම අදියරට එන්න රණබාහුට පුළුවන් වුණා.

"උඹල ඔතන තියෙන ගෙදර එවුන් ඔක්කොම අරගෙන වරෙල්ලා. මම කියනතුරු කාටවත් කරදර කරන්න එපා."

රණබාහු සාගරගෙ දුරකථනය පස්සෙන් ගමන් කරන කණ්ඩායමට අවසන් නියෝගය දුන්නා.

"ස(ර්) ඔක්කොම හරි එතන හිටියෙ වයසක ජෝඩුවකුයි අවුරුදු විසිපහක තිහක විතර කොල්ලො දෙන්නෙකුයි විතරයි. මුන්ව ස(ර්) ඉන්න තැනට අරගෙන එන්නද?"

"උන්ව ඉස්සුවෙ කවුද කියල දැනගත්තට ගේමක් නෑ. උන් එකෙක්වත් හෙට ඉර පායනවා දකින්නෙ නෑ. උඹල හයිවේ එකෙන් එළියට දානකොට කෝල් එකක් දීපන්. මම පාක් එකට එන්නම්."

තමාගේ රථය අසළම නතර කළ වෑන් රථය තුළ තමා බලාපොරොත්තු වූ ගොදුර නැති බව දැකපු රණබාහු තමන්ගෙ දඩයම දෙවැනි වතාවටත් වැරදිලා කියල දැනගත්තා. ඒත් එක්කම එයාගෙ සිතට ඇතිවුණේ කේන්තියත් සමඟ ලජ්ජාවක්.

"මේ මොක්කුන්වද ගෙනත් තියෙන්නේ. මුන් ටික ගත්ත තැනටම ගිහින් දාපියවු. ඒ එක්කම මුන්ට තේරුම්කරල දීපන් මේ කිසිම දෙයක් ගැන කෙළ පොදක් බිම හෙලුවොත් කරදර වෙන්න වෙනවයි කියලා."

"ස(ර්) මූ ගාව තමයි අර කිවුව ෆෝන් එක තිබුණේ."

වෑන් රථයේ සිටි  හැඩිදැඩි මිනිසෙක් තරුණයකුව ඉදිරියට තල්ලු කරමින් කිවුවා.

"මම ෆෝන් එක හොරකම් කළේ නෑ ඒක ඇහින්දෙ බස් එකේ තිබිල. මම ඇත්තමයි කියන්නේ."

සිදුවීමේ අගක් මුලක් තේරුම් ගැනීමට බැරිවූ තරුණයා  බැගෑපත් වන්නට පටන්ගත්තා.

සාගරගෙ ෆෝන් එකෙන් කතාකරපු අංක හොයල බැලුවත් සොබාසිරිගෙයි කියල සැකකරන්න පුළුවන් අංකයක් එතන තිබුණෙ නෑ.

************************ *

උදෙන්ම නැගිට්ට සාගර අඩිපාර දිගේ ගම දිහාට ගමන් කරන්න පටන් ගත්තා.

පාර හොයාගන්න බැරි තරමට කැලෑව වැවිල. ගමේ අය ගම අතහැරල ගිහින්ද. රටේ ඇතිවෙච්ච වෙනස්කම් එක්ක බලනකොට ඒකත් වෙන්න බැරි දෙයක් නෙවෙයි. එතකොට මාත් එක්ක මේ ගමට ආපු ස(ර්)ට මොකද වුණේ. ගමේ මිනිස්සු ගම දාල ගියා නම් ස(ර්) මට කතාකරන්නවත් ඕනැ. ස(ර්)ට වෙන යන්න තැනක් නෑ. ගිහින්ම බලනවා කවුරු ගමදාල ගියත් ස(ර්) යන්න නැතිව ඇති."

පාරට නැවී තියෙන මාන පඳුරු දෙපසට කරමින් කොළ රොඩු වලින් වැසීගිය අඩිපාර දිගේ ඉදිරියට ගමන් කරපු සාගරට පැයක ගමනකට පස්සෙ ගම්මානය පෙනෙන දුරට එන්න පුළුවන් වුණා.

ගස් අස්සෙන් රිංගලා ඇවිත් නෑව වගේ තෙමිල. ඒ මදිවට ඔළුවෙ ඉදන් කූඩැල්ලො.........

ඉදිරියට යන සාගරට අතහැර දමපු ගෙවල් කීපයක් හමුවුණා. හැම අතින්ම වැඩී එන කැලෑව ගෙවල්වල මිදුල ආක්‍රමණයකරල ඉවරයි. වහල හෙවිල්ලලා තිබ්ච්ච පොල් අතුවල ඉතුරුවෙලා තියෙන්නේ ඉරටු විතරයි.

ගමේ මිනිස්සු ගම අතෑරල ගිහින්. දැන් මම කොහෙද යන්නෙ. ඔක්කොටම වැඩිය බඩගින්න ඉවසගන්න බෑ. ඊයෙ උදේට කෑවට පස්සෙ කිසිම දෙයක් කෑවෙ නෑ. කුරුම්බා ගෙඩියක්වත් නැතිද?

වටපිට බලපු සාගරගේ නෙත ගැටුනු දෙයින් සාගරගේ මැලවී ගිය බලාපොරොත්තු දළුලා වැඩෙන්නට පටන් ගත්තා.

*************************** *

කුඹුරට යන්න සූදානම් වෙලා දොරගාවට ආව සොබාසිරි දැක්කෙ පහළ අඩිපාර දිගේ ගෙවල් දිහාට එන තරුණයෙක්.

"දොර ගාවට වෙලා කොහේද බලාගෙන ඉන්නේ. දැන් අනිත් අය වැඩ පටන් අරගෙනත් ඇති."

"මම බලාගෙන හිටියෙ පහළ අඩිපාර දිගේ කවුද එනවා. මේ ගමේ කෙනෙක් නෙවෙයි. කලිසම් සපත්තු දාපු කොනක්."

"කලිසම් ඇඳපු කෙනෙක්? ඔයා මේ දරුවවත් අරගෙන ඇතුළට යන්න. මම ගිහින් බලන්නම්."

එයා හිතුවෙ සොබාසිරිව හොයන්න කවුරුහරි එනව කියලයි.

"පොඩ්ඩක් ඉන්න, මට මෙයාව දැකල පුරුදුයි. මේ සාගර නේද? ඔයා බයවෙන්න එපා මේ තමයි මම කියාපු සාගර. බලමු මේකට මාව අඳුනගන්න පුළුවන්ද කියලා."

උදැල්ලත් කරේ තියාගත්ත සොබාසිරි එළියට ආවෙ සාගරට අඳුනගන්න පුළුවන්ද කියල බලන්නයි.

*********************** *

ගස් අතරින් පේන දුම්පාර දැකපු සාගර මේ ගමේ කවුරුහරි ඉන්න බව දැනගත්තා. මේ ගමේ සාගරව අඳුනන කෙනෙකුට ඉන්නේ වෙදමහත්තයා විතරයි. වෙදමහත්තයා මුණගැහිල සොබාසිරි ගැන දැනගන්න සාගර කල්පනා කළා. කල්පනාකරමින් යන සාගර දුම්පාර පිටවෙන්නෙ එතන තියෙන ගෙයකින් බව පෙනුණා. ඒ ගේ ළඟට ගිය සාගර දැක්කෙ ගේ ඇතුළෙ ඉඳලා

එළියට එන රැවුල හා කොණ්ඩය  වැවුනු අව්වට හසුවී කළුව ගිය සමක් ඇති කෙට්ටු මිනිහෙක්ව.

“වෙද මහත්තයා ගෙදර ඉන්නවද?.”

සාගර ඒ මිනිහගෙන්ඇහුවා.

“මොකටද වෙදමහත්තයව හොයන්නෙ. වෙදමහත්තයගෙ දුවව කසාද බඳින්නද ආවෙ. දුවල දෙන්නගෙන් ලොකු දුව එරන්දතීව මම කසාද බැන්දා. පොඩි දුව අරුන්දතී නම් ඉන්නවා.....”

කතා කරපු කෙනාව රූපයෙන් අඳුනගන්න බැරිවුණාට කටහඬ හඳුනගන්න සාගරට පුළුවන් වුණා.

“මට ස(ර්)ව අඳුනගන්න බැරිවුණා. ස(ර්)ව අඳුනගන්න බැරි තරම් වෙනස්වෙලා. ඒත් කටහඬ නම් වෙනස්වෙලා නෑ.”

“සාගර ආවෙ මාව බලල යන්නද? නැත්තම් මම වගේ මෙහේ නවතින්නද?”

“මම වැඩකරපු කම්පැනිය අයිතිකාරයා රණබාහු. මිනිහා මාව දැනගන්නකොටම මම එහෙන් පැනගත්තා. දැන් මාව හැමතැනම හොයනවා ඇති. මට ආපහු යන්න බෑ. මමත් ආවෙ මෙහේ නවතින්න හිතාගෙන.”

“සාගර මෙහාට ආපු බව කවුරුවත් දන්නවද?. ෆෝන් එක කොහේද?”

“ඒක බස් එකේ දාල ආවා. මෙහාට සිග්නල් නැති නිසා ෆෝන් එක ගෙනාවත් අවුලක් නෑ නේද? ”

“ඒ ඉස්සර දැන් හැමතැනටම සිග්නල් තියෙනවා. මෙහාට එනකොට රෑ වුණාද? රෑ වෙච්ච හින්දා කරත්ත මඩුවට වෙලා නිදියාගන්න ඇති. නැති නම් මෙච්චර උදෙන් මෙහාට එන්න බෑ. උදේට කාලත් නෑ නේද?”

“උදේට තියා ඊයෙ දවල්ටවත් කෑවෙ නෑ.”

“කාල බීල ඉවරවෙලා වැඩකරන තැනට එනවා. ආපහු යන්නෙ නැති නම් ආ ගිය විස්තර හෙමිහිට කතාකරගන්න බැරියෑ. හැබැයි පුතෝ මෙහේ නවතිනව නම් මහත්තය වගේ ඉන්න බෑ. ටිකක් පුරුදුවෙනකම් ලේසි වැඩක් හොයල දෙන්නම්.”

සොබාසිරි කිව්වෙ සාගරට කිසිම බුරුලක් පෙන්නන්නෙ නැතුවයි. එරන්දතී හිතුවෙ සොබාසිරි එහෙම කියන්නෙ ඇත්තටම කියලයි.

“ඒ ළමයට ඉන්න දෙන්න, සාගර කාල බීල ඉවරවෙලා හෙමින් සැරේ ඒ පැත්තෙ ගිහින් එන්න. ඔයා හදන්නෙ එක දවසෙන්ම ඒ ළමයට මෙහේ එපා කරන්න.”

“එහෙම එපා වුනොත් සාගර බේරුණා. මට වෙලා තියෙන දේ පේනවද? .”

එහෙම කියපු සොබාසිරි උදැල්ලත් කරතියාගෙන මිදුලට බැස්සා.

“ඔයා අපේ ස(ර්)ගෙ වයිෆ්.”

“ස(ර්)ගෙ වයිෆ් වුණාට මට මැඩම් කියන්න හදන්න එපා. අක්ක කියල කියන්න.”

**************************************** *

“මේකා ඇඳුමක්වත් අරගෙන ඇවිත් නෑ, නවතින්න එනවනම් ඇඳුම් එහෙම අරගෙන එන්න එපැය.”

හවස වැඩ ඉවරවෙලා ඇවිත් නාන්න යන්න හදනකොට එරන්දතී සාගරට සරමක් දෙනවා දැකල සොබාසිරි කිවුවා.

“ඇඳුම් අරගන්න යනකොට තමයි රණබාහුගෙ කුලී හමුදාව පස්සෙන් එනබව දැනගත්තෙ. ඊට පස්සෙ මෙලෝ සිහියක් නැතුව පණ බේරගෙන ආවා. එහෙම වුනේ නැතිනම් සර්ට කියවන්න පොත් දෙක තුනක් අරගෙන එනවා.”

“මමත් හිතාගෙන හිටියෙ මෙහාට ඇවිත් නිවාඩු පාඩුවෙ ඉන්න. ගෙනාපු පොත වලින් එකක්වත් කියවන්න බැරිවුණා. දැන් ඉතින් පොත් කියවන්න තියා හිතන්නවත් වෙලාවක් නැතිවෙනවා.”

සොබාසිරි කලකිරිණු හඬකින් කිවුවා. සාගර හිතුවෙ සොබාසිරි බොරු කායනව කියලයි. ඒත් ඒ කතාව ඇත්තක් කියල තේරුනේ නාල ඉවර වෙලා ආපු සොබාසිරි ගෙට ගොඩවෙන්නත් ඉස්සර එරන්දතී කියපු දෙයින්.

“මෙයා චුට්ටක්වත් ඇහැ පියාගත්තෙ නෑ. උයාගන්නත් බැරිවුණා. අද නම් උයන්න උදව් වෙන්න වෙනවා.”

එරන්දතී දරුවව සොබාසිරිට දෙන ගමන් කිවුවා. එයා කියපු දේට සොබාසිරි වෙනුවට උත්තර බැන්දෙ සාගර.

“උයන එකත් මහලොකු දෙයක්ද? කොළඹ නැවතිලා ඉන්නකොට ස(රු)යි මමයි උයාගෙන කෑවා. අපිට කඩවල කෑම හරියන්නෙ නෑ.”

“මම එදා ඉඳලම උඹට කියල තියෙනවා අදාල නැති ඒවට කටදාන්න එපා කියලා. මෙහෙන් කසාදයක් බැඳගෙන නවතින්න හිතාගෙන ඉන්නව නම් උයන්න තියා පොල් ගාන්නවත් පුළුවන් බවක් කියන්න හොඳ නෑ. මම දුක් විඳින්නෙ අපේ තාත්ත ඔය ටික දැනගෙන හිටියට මට කියල නුදුන්න නිසයි. මෙහේ නවතින්න නම් අනිවාර්යෙන්ම මෙහෙන් කසාදයක් කරගන්නම වෙනවා.”

“පිස්සු කියවලා ඒ ළමයව බය කරන්න එපා. සාගරට නිදාගන්න දෙන්නේ කොතනද? ”

එරන්දතී කතාව වෙනත් පැත්තකට හරවන්න හැදුවා. එත් ඒකෙන් වුණේ සොබාසිරිට තව අවස්ථාවක් ලැබිච්ච එක විතරයි.

“මේ ගමේ සිරිතක් තියෙනවා. ගමට කසාද බඳින වයසෙ කොල්ලෙක් ආවම රැග් එකක් දෙනවා. නිදාගන්න දෙන්නේ ඉස්තෝප්පුවෙ තියෙන වැල් ඇඳක්. පෙරවන්න තුනී රෙද්දක් දෙනවා. ඒ රැග් එක ඉවරවෙන්නේ මෙහේ ඉන්න කාවහරි කරේ එල්ලගත්තම. ඊට පස්සෙ තමයි ගෙයක් ඇතුළෙ නිදාගන්න ලැබෙන්නේ. මමත් මාසයක් විතර හීතලේ එළියටවෙලා හිටියා.”

“මහත්තයා බොරු කියනවා. ඔයා එච්චර කාලයක් පිණිබබා එළියෙ හිටියෙ නෑ. සාගරටත් ඉක්මනින්ම ගෙයක් ඇතුළේ නිදාගන්න ලැබෙනවා.”

“එහෙනම් උඹත් ඉවරයි. දැනටමත් මෙහෙන් කරත්තයක් ලෑස්ති කරල ඇති. වැඩි දවසක් යන්න ඉස්සර උඹේ නාහෙ විදල කරත්තෙ බඳින්න හදන්නෙ. මෙහේ කරත්තයක් අදිනවට වැඩිය රණබාහුට අහුවෙලා මැරෙන එක සැපයි.”

එරන්දතීගෙන් පිළිතුරක් බලාපොරොත්තු වුණත් පිළිතුරක් නැති තැන ආපසු හැරිල බලපු සොබාසිරි දොර අසල ඉන්න අම්මව දැක්කා.

අම්ම ආවෙ නැත්නම් මෙයාව තව ටිකක් කේන්ති ගස්සන්න තිබුණා.

****************************

## 12

කාලය ගතවෙලා ගියේ හිතාගන්න බැරි තරම් වේගයෙන්. ඒකාකාරී ජීවිතයකට හුරුවෙලා හිටිය ගල උඩ ගමේ අයට අවුරුදු පහක් ගතවෙච්ච බවක් තේරුනේ නෑ. ඒ කාලය තුළ රටේ විශාල වෙනසක් ඇතිවුණත් ගල උඩ ගමේ වෙනස්කමක් විදියට සිදුවුණේ අලුතින් සාමාජිකයින් කිහිපදෙනෙක් එක්වීම පමණයි.

“රටේ ලොකු වෙසක් ඇතිවෙලා බව සාගරට තේරෙන්නේ නැතිද? ”

මිදුලෙ අඹ ගහ යට තියෙන ගල්තලාවෙ වාඩිවෙලා ඈත බලාගෙන හිටිය සොබාසිරි එකපාරටම සාගරගෙන් ඇහුවා.

“රටේ මොන වෙනස්කම වුනත් අපිට දැනෙනවද? උදේ පාන්දර නැගිටිනවා. දවසම පොළොව එක්ක ඔට්ටු වෙනවා. ගෙදර ඇවිත් නිදාගන්නවා. රටේ මොනව වෙනවද කියල දැනගන්න රේඩියෝවක් වත් තියෙනවයෑ.”

“රටේ වෙනසක් වෙලා කියල දැනගන්න රේඩියෝ ඕනැ නෑ. වෙනදා රෑට නිදාගන්න බැරිවෙන්න  මාසයකට දෙක තුනක් තියෙන සංගීත මාස ගාණකින් ඇහුනේ නෑ නේද? ”

“ඒ කියන්නේ රටේ මිනිස්සුන්ගේ රසඥතාවය ඉහළ ගිහින්. සංගිත වගේ වැඩ...... .”

“කෙහෙල්මල ඒක නෙවෙයි වෙලා තියෙන්නේ.”

“හරි එහෙම නම් බෝම්බ පුපුරුවලා. ඒ බයට සංගීත තියන්නේ නෑ.”

“පිස්සු කියවනවා, බලපන් පහළ හැමතැනම කට්ට කළුවරයි. මේක අද විතරක් වුණ දෙයක් නොවෙයි. දැන් මාස දෙකක ඉඳලා රෑට  ලයිට් නැතිව යනවා. මුලදි පැයක් විතර ලයිට් නැතිව තිබුණා. දැන් දවසට පැය තුනක් විතර ලයිට් නෑ.”

“රටේ ඇතිවුණු දියුණුවත් එක්ක  මේ වගේ දෙයක් කොහොමවත් වෙන්න බැ.”

සාගර කිව්වෙ අඳුරෙ ගිලිල තියෙන නගරය දිහා බලාගෙන. අඳුර මකන්න වෙනදා පෝලිමට යන වාහනවත් තිබුණෙ නෑ.

“ලයිට් කපන්නේ තෙල් ගන්නවත් සල්ලි නැතිව. රටේ ආදායම නැවතිලා. ඒ කියන්නේ අපේ රටට කුණු දෙන එක නවත්තලා.”

“දැන් රටේ මිනිස්සුන්ට ස(ර්) කියපු කතාවෙ ඇත්ත තේරෙනවා ඇති. පිටරටින් කුණු ලැබෙන එක නතරවුණු ගමන් රට එකතැන නැවතිලා.”

“අපි එහෙම දෙයක් වෙන බව දැනගෙන හිටියට ඒක ඉදිරිපත් කළේ නෑ. ඒ වෙලාවෙ ඒ මතය ඉදිරිපත් කළා නම් අපිට අවාසි වෙනවා. සාගර හෙට ටවුමට ගිහින් මොකද වෙලා තියෙන්නෙ කියල බලාගෙන එනවද?”

“අපි දෙන්නම යමු. ස(ර්)ව කාටවත් අඳුනගන්න බෑ. අවුරුදු ගාණක් එකට හිටිය මට අඳුනගන්න බැරිවුණ කොට වෙන කෙනෙක් අඳුනගන්නෙ කොහොමද? හැබැයි ස(ර්) කතාකරන කොට නම් අඳුනගන්න පුළුවන් අය ඉදියි. ඔය වගේ ගැඹුරු කටහඬක් තිබුනෙ තව එක්කෙනාටයි.”

***************************

“අපි වනාන්තරයට වෙලා හැංගිලා ඉන්නකොට තුන්වෙනි කැරුල්ලවත් පටන් අරන්ද? හරියට ඇඳිරිනීතිය දාල වගෙයි. පාරෙ වාහනයක්වත් පේන්න නෑ. මට හිතෙන්නෙ අපි ආපහු ගියොත් හොදයි.”

කරත්තපාර පහුකරලා පාරදිගේ කිලෝමීටරයක් විතර ඇවිදගෙන ගිය සොබාසිරි කිවුවා.

“ස(ර්) බොරුවට බයවෙලා. තුන්වෙනි කැරුල්ල පටන් අරන් නම් තාප්ප පිරෙන්න පෝස්ටර් තියෙන්න ඕනෑ. අපි කිලෝමීටරයක් විතර ඇවිදගෙන ආවා, තුන්වෙනි කැරුල්ලක ලකුණක්වත් දැක්කෙ නෑ. ගෙවල්වල මිනිස්සු ගෙවල් වහලදාල කොහේ හරි ගිහින්.”

නගරෙට ආපු ඒ ගොල්ලො දැක්කෙ කුණු කන්ටේනර් එනතුරු බලාගෙන ඉන්න මිනිස්සුන්ව. තවත් පිරිසක් අලුත්ම වාහන කැලිවලට ගලවමින් හිටියා.

රටට වෙලා තියෙන දේ ගැන දැනගන්න තවත් මහන්සි වෙන්න දෙයක් තිබුණෙ නෑ. පිටරටින් කුණු ගේන එන නතර වුණු ගමන් රටම එකතැන නතරවෙලා බව ඒ ගොල්ලන්ට තේරුණා

“අපි අපහු යමු, තවත් බලන්න දෙයක් නෑ. රට මුල ඉඳලම ගොඩනගන්න වෙලා. ආපහු ඇවිත් වැඩ පටන්ගනිමු.”

සාගර ආපහු යන්න සූදානම් වුණා.

“රටට වෙලා තියෙන්නෙ මොකක්ද කියල හරියට දැනගන්නෙ නැතිව කිසි දෙයක් හිතාගන්න බෑ. පිටරටින් කුණු ගේන්නෙ නැතිවුණු ගමන් ආර්ථිකය මේ විදියට කඩාවැටෙන්න පුළුවන්ද?”

සොබාසිරි හැමතැනම ඇවිදලා තොරතුරු හොයන්න පටන්ගත්තා. සාගරටත් තෝල්කයා වගේ සොබාසිරිගෙ අදහස් වචන වලට පෙරලන්න සිදුවුණා.

****************************************

“ස(ර්) තවම තීරණයකට ආවෙ නැතිද? දැන් එළියත් වැටිල. අපි ගිහින් රටට වෙලා තියෙන දේ තේරුම් කරමු. පිටරටින් ලැබෙන දේට මල්ල අල්ලගෙන ඉන්න පුරුදුවෙලා රටක් දියුණු කරන්න බැරි බව.”

“රටේ මිනිස්සු පුරුදුවෙලා ඉන්නෙ පිටරටින් ලැබෙන දේ අරගන්න. ඒක වෙනස් කරන්න අපිට බෑ. විවෘත ආර්ථිකය ආවට පස්සෙ ඒක වෙනස් කරන්න කාටවත් බැරිවුණා වගේ මේ කුණු ආර්ථිකය වෙනස් කරන්නත් කාටවත් බෑ. අපිට කුණු එවපු රට නැතිවට තමන්ගෙ කුණු වලට කරගන්න දෙයක් නැති තව රටවල් තියෙනවා. ඒව ලංකාවට ගේන්න ජනදාසල කටයුතු කරයි. අපි මේ ක්‍රමය වෙනස් කරන්න හැදුවොත් ලංකාවට කුණු එවන එක නතර කෙරුවෙ අපියි කියල මිනිස්සුන්ට කියයි. එක පාරක් ඔළුව පලාගෙන බේරුණා. මේ පාර ඔළුවවත් බේරගන්න බැරිවෙනවා.”

“ඒ වුණත් මේ වෙලාවෙ අපි පැත්තකට වුණොත් රට ඉවරෙටම ඉවරයි. අපේ ජීවිත ගැන හිතලා රට වෙනුවෙන් කරන්න තියෙන යුතුකම් අතාරින්න පුළුවන්ද? ”

සාගරට ඕන වුණේ ආපහු සටනට බහින්න.

“රටේ වෙනසක් ඇතිකරන එක හීනයක් විතරයි. අපි මෙහාට එන්න ඉස්සර වගේ වගකීම් නැති අය විදියට හිටිය නම් දිනුම පරාජය ගැන හිතන්නෙ නැතිව සටනට බහින්න තිබුණා. ඔළුවට පිස්තෝලෙ තිබ්බත් බය නැතිව විප්ලවයට ජයවේවා කියල වෙඩිකන්න තිබුණා. ඒත් දැන් තත්වය වෙනස්. මේ ගමේම පැවැත්ම රැදිල තියෙන්නෙ අපේ කරපිට. අපි දෙන්න ඇරුනාම වැඩක් කරන්න පුළුවන් වයසක ඉන්නෙ එරන්දතීගෙ මල්ලි විතරයි. මට මගේ පවුල අතෑරල මෙතනින් යන්න බෑ. ප්‍රබුද්ධ පොතේ තියෙනව වගේ රජ කුලයක ඉපදුනෙ නැතිනම් සිද්ධාර්ථ කුමාරයට ගිහිගෙය හැරදාල යන්න බෑ. අපේ විප්ලවීය දෑත් වගකීම් කියන යදම් වලින් බැඳල දාල. ඒ යදම් වලින් නිදහස්වෙන්න පුළුවන්කමක් අපිට නෑ.”

සොබාසිරි එහෙම කිව්වෙ ගේ දිහා බලාගෙන.

සාගරගෙ යෝජනාව ප්‍රතික්ෂේප වෙන තැනට කතාකරපු සොබාසිරි සාගරව නිහඬ කරන්න බලාපෙරොත්තු වුණා. සොබාසිරි කියපු දේට විරුද්ධ වෙන්න සාගරට පුළුවන්කමක් තිබුකෙ නෑ. ඒත් සෙබොසිරි බලපොරොත්තු වුණ නිහඬතාව ඒ දෙන්නම බලාපොරොත්තු නොවුණ විදියට බිඳවැටුනා

යදමින් බැඳි විප්ලවය අවසාන නැත